# THE WHITE HACKLE

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව



මංගල කලාපය

# THE WHITE HACKLE

**JOURNAL OF SRI LANKA LIGHT INFANTRY**

ශ්‍රී ලංකා පාබල හමුද සඟරාව


## Features
## විශේෂාංග


FEED BACK
අදහස් උදහස් හා විවේචන 1

කවියෙන් ලියමි සඟරාවට
ශ්‍රීලපාහ බලඇණිවල ආරම්භය
විකාශනය සහ වර්ණ ප්‍රදානය 2

ශ්‍රී ලංකා පාබල හමුදවේ මූලාරම්භය
හා එහි ප්‍රාථමික යුගය (1881-1949) 3

MY DEAR DAD
සෙබල හදකට තැගෙන රාවය
සෙන්පති කොබ්බෑකඩුව 6

සඟරාවලින් උපුටා ගන්නා
ලද දර්ශන වැකි 7

DUTY, HONOUR, COUNTRY 8

දයාබර අම්මේ 9

එද මෙදතුර අප ආ මග
3 වැනි බල ඇණි ශ්‍රීලංකා පාබල හමුදව 10

දෙපා අහිමිව
ස්වේච්ඡාවෙන්ම දෙන විට රටටම ජීවේ
සිප් සතර ලැබ ගත්තේ 14

අවි ගැටුමේ ආරම්භය 15

දෛවයට අභියෝග
(1994 ආබාධිත ක්‍රීඩා උලෙල)
මට සැපතක්ය යුද පිටියක මැරෙන එක 16

නොබිඳුනු සිතක් 17

රෙජිමේන්තු මංගල හස්තියා
රණබිමේ සිට අම්මාට 18

7 ශ්‍රීලපාහ - මෙතෙක් ආ මග 19

සංකල්පනා 21




PAGE 12
පිට



PAGE 22
පිට



PAGE 29
පිට

Front cover photograph -
Sri Lanka Light Infantry
Regimental Centre


නොසැලෙන්න මල්ලියේ
සිතට දිරියක් 22

එක් අවුරුදු ඉතිහාසය තුළින් 23

යුද්ධය 24

5(සේවා) බලඇණිය ජාතික
මෙහෙවරට එක්වීය.. මෙසේ ! 25

2(සේවා) ශ්‍රීලංකා පාබල හමුදව 1993 1994 වර්ෂ
ක්‍රියාත්විතයන් පිළිබඳ සමාලෝචනයක් 26

මා දුටු ජනකපුර 27

ශ්‍රීලපාහ රෙජිමේන්තුවට නව
ඒකකයක් එක්වූ වගයි 28

විරුවාණෙනි ඔබට
මිරිඟුවක් විය දිවිය 29

මගේ ආදර අම්මා
සෙබල හිත එඩිතර බව 30

සෙබල අධිෂ්ඨානය
දියතලාවේ අසිරිය 31

බලඇණි ඉතිහාසය 6 ශ්‍රීලපාහ 32

ජාතියේ මිණිපහන ඔබයි අම්මේ
එන්නම් බුදු සමිඳු හෙට බණ අහන්නට 33

වර්ගවාදී එල්ටීටීඊ සංවිධානය ජය ලැබුවේ නැත 34

උතුරේ සෙබලෙකුගෙන් 38

8 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව වසරක්
සපුරයි
රකිමු මව් බිම දිවි හිමියෙන් 39

ඇතුලත් කිරීම්/පත් කිරීම්/පත්කිරීම් අත්
නිලධාරී
ඔබගේ අභිතගාවයට මෙලෙස උපහාර
සේවයට නිලයෙන් පිදුම් ලැබූ වගයි
රණසමිතයට පත්
මව්බිම වෙනුවෙන් අමරණීයත්වයට
පත් සෙබළුනේ 40


PRINT WELL (PVT) LTD.

# FEED BACK

## අදහස් උදහස් හා විවේචන

**Regimental Commander,**
Brigadier AK Jayawardhana RWP RSP psc
**Centre Commandant**
Colonel TTR de Silva RWP RSP psc

*The White Hackle*

**Editor** - Col TTR de Silva RWP RSP psc

**Associate Editor** - Lt Col DGS Balthazaar SLLI.

**Sub Editor** - Major HW Hewaarachchi RWP, SLLI.

**Consultant** - Brigadier HV Atthukorala VSV, psc - FBIM (Rtd)

**Publisher** - Regimental Centre Sri Lanka Light Infantry.

*The White Hackle* - is published quarterly under the Supervision of the Regimental Commander to provide the Regiment with information on people, policies, Operations, technical developments, views, opinions and ideas about the SriLanka Light Infantry. ◆ Manuscripts of interest to the Regiment are invited. ◆ Direct Communication is authorized to Editor, or Ass Editor The White Hackle, Regimental Centre, Army Cantonment Panagoda, Homagama, Phone 855204 or 437073-3 Extn 4340 or 4341. ◆ Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. ◆ Publication of this periodical is authorized by the Dte of PA, Army HQ CBO ◆ Use of Funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conferance held at Welioya.

*Dear Reader;*

The "White Hackle" the journal of the Sri Lanka Light Infantry is now a reality. The idea mushroomed several months ago. Due to Operational commitments its implementation hung in the balance and was postponed. Time passed by there was suspence and exitement over the journals debut and now it is at last on the shelf.

The objective of the "White Hackel" is to combine the salient events since 1975 especially after the last recorded history of the Sri Lanka Light Infantry was publishd and released by Lt. Col. H.V. Attukorale psc (Now retired Brigadier). The aim of the journal is to simply unite with closer ties all members of the Sri Lanka Light Infantry.

I appeal to one and all, from the ten Battalions of the Regiment and from the Stalwarts of the past, to contribute towards the success of "White Hackel" by Sending in articles, photographs, poems or anecdotes of the Light Infantry and its history. The customs, traditions and pride of the Regiment must be kept in mind when readers send in their contirbutions. This Journal will not only create an impact but also regain and cover lost ground which should spur on the desire in ultimately editing and publishing the History of the Regiment after 1975, thereby fulfilling the traditions initiated by Captain Oscar M Abeyratna and Brig. HV Attukorale VSV psc FBIM. The post 1975 era will cover the anti Janatha Vimukti Peramuna (JVP) Operations and the full scale war against the Tamil Terrorists. The "White Hackle" will also contain articles on History, Morale, Leadership, Operations, Training, Ceremonies Welfare and Sports.

While inviting you to march forward confidently towards the future with the 'White Hackle" readers are invited to send in their comments, praises, Criticism and observations. This will improve the Journal and be its Guiding Light"

*Editor*
*White Hackle*

# "කවියෙන් ලියමි සහරාවට"

| | | | |
|---|---|---|---|
| කාලය ගෙවී ගියත් දින සති වලට | හැරි | අරයගේ මෙයාගේ වල් පල් හැලී | ලියා |
| යුද්ධය ඉවර නැහැ සතුරන් නොමරාම | බැරි | කාලය කනු එපා නිකරුනෙ ඉන්න | කියා |
| යුද පිටියේ සිටියත් අමතක නොකර | බැරි | වරදක් වුනා නම් සමාව වෙන්න | දයා |
| කවියෙන් ලියමි සහරාවට කොහොම | හරි | දියුණුවෙ මහ දකිමු අපි ඇත්තම කියමු | ලියා |
| බක්මහ මුල දී අරඹන ඔය | සහරාව | සහරාවෙන් පුලුවනි ඇති තතු හෙලි | කරන්නට |
| ගණනින් දහස් කවි ලැබෙනා | වේලාව | බොරුවට එපා ලෝකෙට එය | මවන්නට |
| රෙම ශ්‍රීලපාහ ගෙන් ලැබ ආසිරි | රාව | කිසිදු එපා මග දී ඇන | හිටින්නට |
| පැතුමක් පතමු දියුණුවෙ මංපෙත් | ගාව | තල්ලුව දෙමි ඉදිරියටම | ඇදෙන්නට |
| උතුරු නැගෙනහිර ශ්‍රීලපාහ | දරුවන්ට | අවියට නොහැකි දෙය පෑනෙන් | කරන්නෙමි |
| ඉඩ ලද විට දි පුලුවනි එය | කියවන්ට | සමය පතා පෑනක් මෙහෙය | වන්නෙමි |
| පළමු අදියරෙන් දියුණුව | දකින්නට | සහරාවකට කල හැකි දෙය | දකින්නෙමි |
| එව්වොත් තුතිය උතුරු නැගෙනහිරටත් | ලැබෙන්නට | ඉඩ ලද විට දි නැවතත් මම | ලියන්නෙමි |

**සෙ/13700 සැරයන් අතපත්තු ජ්එම්එන්පේ**
මූලස්ථානය - 7 ශ්‍රීලපාහ
යුධහමුද කඳවුර - අලිමංකඩ

## ශ්‍රීලපාහ බලඇණිවල ආරම්භය/විකාශණය සහ වර්ණ ප්‍රධානය

| | | |
|---|---|---|
| 2 (සෙව්) ශ්‍රීලපාහ | - | 1881 අප්‍රේල් 01 |
| 1 ශ්‍රීලපාහ | - | 1950 මැයි 12 |
| රජිණ වර්ණ ප්‍රධානය | - | 1954 අප්‍රේල් 21 |
| ජනාධිපති වර්ණ ප්‍රධානය | - | 1978 ඔක්තෝම්බර් 10 |
| 3 ශ්‍රීලපාහ | - | 1985 දෙසැම්බර් 16 |
| 4 ශ්‍රීලපාහ | - | 1987 මැයි 05 |
| 5 (සෙව්) ශ්‍රීලපාහ | - | 1987 අගෝස්තු 15 |
| 6 ශ්‍රීලපාහ | - | 1990 ජූලි 08 |
| 7 ශ්‍රීලපාහ | - | 1992 නොවැම්බර් 20 |
| 8 ශ්‍රීලපාහ | - | 1993 ජනවාරි 16 |
| 9 (සෙව්) ශ්‍රීලපාහ | - | 1993 නොවැම්බර් 18 |
| රෙජිමේන්තු ආධාරක බලඇණිය ශ්‍රීලපාහ | - | 1993 අගෝස්තු 15 |
| 10 ශ්‍රීලපාහ | - | 1993 දෙසැම්බර් 01 |

සකස්කර ඉදිරිපත් කළේ :-
**සෙ/302419 සාසෙ ප්‍රනාන්දු ඩබ්එන්එස්. රෙජිමේන්තු මූලස්ථානය - ශ්‍රීලපාහ**

# ශ්‍රී ලංකා පාබල හමුදාවේ මූලාරම්භය හා එහි ප්‍රාථමික යුගය (1881-1949 දක්වා)

1980 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දී බ්‍රිතාන්‍යය ජාතිකයින් විසින් ස්වදේශිකයන් කීප දෙනෙකුගේ ද සහය ඇතිව "රයිෆල් ක්ලබ්" නමින් සමාජ ශාලාවක් කොළඹදී පිහිටුවා ගත්හ. මෙහි සාමාජිකයන්ගෙන් බොහෝ දෙනෙකු බ්‍රිතාන්‍ය යුධ හමුදාවේ ස්වේච්ඡා සේවයේ යෙදී සිටි නිලයින්ගෙන් සමන්විත වූ අතර, මෙම සාමාජිකයින් ශ්‍රී ලංකාවේ ද යුධ හමුද ස්වේච්ඡා බළ ඇණියක් පිහිටවිය යුතු යැයි යෝජනා සම්මත කර ගත්හ. එමෙන්ම ඔවුන් එම යෝජනාව එවකට ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කළහ. ඒ අනුව එම සමාජශාලාවේ එවකට ගරු සභාපතිත්වය ඉසිලූ, එම අවධියේ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ විනිසුරු තැන්පත් විලියම් ජේම්ස් ස්ලේඩ් බෝක් මැතිතුමාගේ බලවත් උත්සාහය හා උනන්දුව මත එවකට ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා විසින් රජයේ ගැසට් නිවේදනයෙ අංක 4369 මගින් 1881 අප්‍රේල් මස 01 වන දින සිට ශ්‍රී ලංකාවේ යුධ හමුද ස්වේච්ඡා බලකායක් තනා සිටුවීමට අවසර දෙන ලදී. ඒ අනුව එදින, ලංකා පාබල හමුදාවේ ස්වේච්ඡා, නමින් බළඇණියක් ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලදී. මෙම බළ ඇණිය වර්තමානයේ ඉතා පුළුල් සහ අභිමානවත් ලෙස විකාශණය වී ඇති ශ්‍රී ලංකා යුධ හමුදාවේ ළදරු කලලය ලෙස හැඳින්වීම වඩාත් උචිතය.එසේ නිර්මාණ වූ ලංකා පාබල හමුදාව ස්වේච්ඡා, ක්‍රමක් ක්‍රමයෙන් වර්ධනය වී විවිධ වර්ධන අවදීන් පසුකර පරිනතව, දැනට විරෝධාර ලෙස පැතිරී ගිය විසල් රුකක් බවට පත්වී තිබීම අපගේ සාඩම්බරයට හේතු නොවන්නේ ද?

## ලංකා පාබල හමුදාව ස්වේච්ඡා

ඉහත දැක්වූ ආකාරයට ආරම්භ වූ ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රථම බළඇණියේ අණදීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුකාරවරයාගේ ඉල්ලීම මත බ්‍රිතාන්‍ය රජය මගින් ලුතිනන් කර්නල් ජෝන් ස්කොට් ආර්මිටේජ්, (21 වැනි ලැන්ග්කැෂියර් රයිෆල් බලකාය ස්වේච්ඡා) ශ්‍රී ලංකාවට එවන ලදුව 1881 අප්‍රේල් මස 01 වන දින සිට බලපාන පරිදි ලුතිනන් කර්නල් ජේ.එස්. ආර්මිටේජ්. ලංකා පාබල හමුදාව ස්වේච්ඡා බළඇණියේ අණදෙන නිලධාරී ලෙස පත්වීම් භාර ගන්නා ලදී. අණදෙන නිලධාරීගේ වැඩ බාර ගැනීමෙන් අනතුරුව නව බලකාය සඳහා නිලධාරීන් සහ ආධුනිකයින් බඳවා ගැනීම ආරම්භ විය. ප්‍රථමයෙන් බළඇණිය තගා සිටුවීමේදී එයට නිලධාරීන් 39 ක් සහ සෙසු නිලයින් 955 දෙනකු ඇතුළත් විය.

## ප්‍රථම සරඹ පෙළපාලිය

නව බලකාය වෙත ආධුනිකයින් බඳවා ගැනීමේ දී දක්නට තිබූ විශේෂ ලක්ෂණයක් වූයේ ඒ සඳහා බොහෝ පිරිසක් විදේශිකයින් විමත් ස්වදේශිකයින් වශයෙන් බැඳුණු අයවලුන් ශ්‍රී ලංකාවේ නාගරික ධනපති පන්තිකයින්ගෙන් සමන්විත වීමත් ය. මෙයට තුඩු දුන් විශේෂ හේතුවක් වූයේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පරිනත වූ අයවලුන් විශේෂ සුදුස්සන් ලෙස සැලකූ නිසා ය. ආධුණිකයින් බඳවා ගැනීමෙන් අනතුරුව ඒකකයේ බළඇණි මූලස්ථානය කොළඹ බේලි විදියේ පිහිටි ගොඩනැගිල්ලකට ගෙනයන ලදී. ඒකකයේ ප්‍රථම සරඹ පෙළපාලිය පැවැත්වීම සඳහා පුහුණු කටයුතු සූදානම් කිරීම ඇරඹී අතර, 1881 මැයි මස 11 වන දින ප්‍රථම සරඹ අභ්‍යාශය බළඇණි මූලස්ථානයේ සැදූ තාවකාලික අභ්‍යාශ ශාලාවක පවත්වන ලදී. බේලි වීදියේ (දැන් මෙය මුදලිගේ මාවත වෙයි) එය පිහිටා තිබූ මෙම ගොඩනැගිල්ලේ දැනට ග්ලෝබ් හෝටලය පිහිටා ඇත.

සෙනිත්ගේ සරඹ පුහුණුවීම් සඳහා එවකට පිටකොටුවේ "රකට් කෝට්" නම් උද්‍යානය යොදා ගන්නා ලදී. මෙම උද්‍යානය දැනට වාමජ ධාන්‍යාගාරය හා එයට අයත් ගොඩනැගිලි සංකීර්ණය පිහිටුවා ඇත.

## බළඇණි මූලස්ථානය

බේලි වීදියේ ගොඩනැගිල්ලක පිහිට වූ ප්‍රථම බළඇණි මූලස්ථානය 1881 මැයි මස 30 වනදින එවකට පිටකොටුවේ පිහිටා තිබූ "සීමන්ස් හොස්පිටල්" (නැවියන්ගේ රෝහල) නමැති ගොඩනැගිල්ලට ගෙන යන ලදී. එය දැනට කුමාර වීදියේ පිහිටි පිටකොටුව තැපැල් කාර්යාලයට අයත් ගොඩනැගිල්ල වේ. දැනට මෙම ගොඩනැගිල්ලේම කොටසක් ලන්දේසි කෞතුකාගාරය පවත්වාගෙන යනු ලැබේ.

1905 අගෝස්තු මස 06 වන දින නැවත ඒකක මූලස්ථානය කොළඹ කොම්පඤ්ඤවීදිය කොට්ඨාශයේ, මැලේ වීදියේ පිහිටා තිබූ එවකට බන්ධනාගාර ගොඩනැගිල්ලට ගෙනයන ලදී. දැනට එම ස්ථානයේ රජයේ විහාග දෙපාර්තමේන්තුව පිහිටා ඇත.

## බළඇණි ලාංඡනය සහ ප්‍රථම යුධ හමුද තූර්යවාදක කාණ්ඩය

1881 ඔක්තෝබර් මාසයේ දී බ්‍රිතාන්‍යය රජ පවුලේ සාමාජිකයෙකු වන එඩ්වඩ් කුමරු හෙවත් වේල්ස් කුමරු (පසුව XII වන එඩ්වඩ් රජතුමා) ලංකා පාබල හමුදාව ස්වේච්ඡා ඒකකයේ ගෞරවනීය කර්නල් තනතුර බාර ගැනීමට සතුට පලකලෙන් එය ශ්‍රී ලංකාව වෙත පිදූ ගෞරවයක් බඳු විය. වේල්ස් කුමරු ලංකා පාබල හමුදාව ස්වේච්ඡා වෙත බැඳීම නිසා ඇති වූ සම්බන්ධතාවය නිසාම කුමරුගේ ආදර්ශ පාඨය වූ "මම සේවය කරමි" යන්න ද ඔහුගේ සිරස්ක ලාංඡනය ද මෙම ඒකකයේ ලාංඡනය වශයෙන් තෝරා ගැනීමට මහ පැදුණි. 1881 නොවැම්බර් මස 28 වන දින වේල්ස් කුමරු ඒකකයේ ගෞරවනීය කර්නල් පදවිය පිළිගැනීමෙන් ආරම්භ වූ බ්‍රිතාන්‍ය රජ පවුලේ අනුශාසකත්වය 1972 දී ශ්‍රී ලංකාව ජනරජයක් බවට ප්‍රකාශ කරන තෙක් අඛණ්ඩව පැවැතුණි. ලංකා පාබල හමුදාව ස්වේච්ඡා හි අපරදිග තූර්යවාදක කණ්ඩායම 1881 දී බලකාය තගා සිටුවා ස්වල්ප කලකට පසු ආරම්භ කළ එකක් බවට සාක්ෂි ඇත. එකල ඒකකයේ ගමන් වාදනය වූ "අයැම් නයින්ටි ෆයිව්" යන ඉංග්‍රීසි ගීතයේ වාදනය භාවිතය ද 1881 දී ආරම්භ විය. 1882 වර්ෂය වූ විට ඒකකය කණ්ඩායම් අටකින් සමන්විත විය.

## රයිෆල් වෙඩි තැබීමේ තරඟ හා සම්මාන පෙළපාලිය

මුල් අවදියේ දී ස්වේච්ඡා කටයුතු බොහෝ දුරට පා සරඹ, රයිෆල් තුවක්කු පරිහරණය හා රයිෆල් වෙඩි තැබීම් වලට සීමා විය. ඒකකයේ පුහුණුවීම් කටයුතු නිතර නිතර ශ්‍රී ලංකාවේ සේනා භාරව සිටි මේජර් ජනරාල්වරයා විසින් පරීක්ෂා කරන ලදී. අන්තර් කණ්ඩායම් පදනම මත රයිෆල් වෙඩි තැබීමේ තරඟ ඒකකය තුළ පමණක් පවත්වන ලදී. පසු කලෙක ඒකක කණ්ඩායම් ඉන්දියාවේ දී පැවැත් වූ වෙඩිතැබීම් තරඟ වලට ද සහභාගී වූ අතර එමගින් මෙම විෂයය ගැන විශාල උනන්දුවක් දැක්වූ අතර, එමගින් වෙඩි තැබීමේ හැකියාව ඉතා දියුණු මට්ටමකට පැමිණියේ ය. බ්‍රිතාන්‍ය මහ රජතුමාගේ උපන් දිනයේ දීත්, පිටතින් දිවයිනට පැමිණෙන ඉතා වැදගත් අමුත්තන් සඳහාත් ආණ්ඩුකාරතුමා සඳහාත් සම්මාන පෙළපාලි මෙකල පවත්වන ලදී.

## පළමු පුහුණු කඳවුර

ශ්‍රී ලංකා යුධ හමුද පළමු පුහුණු කඳවුර 1890 ඌරුගස්මන් හංදියේ දී පැවැත්වුනි. 1903 දී පුහුණු මධ්‍යස්ථානය දියතලාවට ගෙනයන තෙක් පුහුණු කඳවුර පවත්වන ලද්දේ ඌරුගස්මන් හංදියේ ය. යුද්ධෝපාය වලට පිවිසීමට අධි කාලමක් තනා ගැනීමේ අභිලාශයෙන් නිතර නිතර ඒකකය එවකට දියතලාවේ කඳවුරු බැඳගෙන සිටි බ්‍රිතාන්‍ය හමුදමය අභ්‍යාශ වලට සහභාගී වන ලදී.

## ප්‍රථම අශ්වාරෝහක කණ්ඩායම

1892 වර්ෂයේ දී ලංකා පාබල හමුදව ස්වේච්ඡා හි ප්‍රථම අශ්වාරෝහක කණ්ඩායම නගා සිටුවන ලදි. 1990 දී ස්වේච්ඡා පාබල හමුදවේ ප්‍රථම අශ්වාරෝහක කණ්ඩායම ප්‍රථම වරට පිටරටකට යවන අශ්වාරෝහක කණ්ඩායම ලෙස අප්‍රිකාවේ බුවර් යුද්ධයට සහභාගී වී සිටි බ්‍රිතාන්‍ය හමුද වලට සහභාගී වීම සඳහා යවන ලදි. මෙම කණ්ඩායම පෙරලා ලංකාවට පැමිණි විට දකුණු අප්‍රිකාවේ පැවැති බුවර් යුද්ධයේ දී කණ්ඩායම් විසින් ඉටුකළ සේවාව අගයනු පිණිස බ්‍රිතාන්‍ය රජු වෙනුවෙන් පතාක ධජයක් කොන්වෝල් සහ යෝර්ක් හි ආදිපාද තුමන් අතින් එම කණ්ඩායමට පිරිනමන ලදි. මෙම පතාක ධජය වර්ණ ධජයක් නොවූ අතර, බ්‍රිතාන්‍ය රජයේ ධජයක් පමණක් විය. එය දරා සිටි හෙල්ලයේ මිටෙහි "දකුණු අප්‍රිකාවේ සේවය සඳහා" යන්න කැටයම් කර තිබුණි.

## ලංකා ආරක්ෂක බලසේනාව පිහිටුවීම

1910 වර්ෂය වන විට ලංකා පාබල හමුදව ස්වේච්ඡා වෙතින් නව ස්වේච්චා බළඇණි කීපයක් බිහි වී තිබිණ. අලුතෙන් බිහි වූ බළ ඇණි වල අණ සහ පාලනය ඒ ඒ බළ ඇණි විසින් ස්වාධීනව පවත්වාගෙන ගියේ මෙම සියලුම ස්වේච්ඡා ඒකකයන්ගේ තත්වය වඩා හොඳින් පවත්වාගෙන යාම සඳහාත්, ඒවායේ පාලනය ආණ්ඩුකාරවරයාට නිවැරදිව අධීක්ෂණය කිරීමේ පහසුව සඳහාත් අරමුණු කරගෙන 1910 අංක 08 දරණ ලංකාණ්ඩුවේ ආඥා පනත යටතේ එවකට පිහිටුවා තිබූ ශ්‍රී ලංකා යුධ හමුද ස්වේච්ඡා ඒකක වල පාලනය සඳහා "ලංකා ආරක්ෂක බලසේනාව" ආරම්භ කර එමගින් ශ්‍රී ලංකාවේ ආරක්ෂක කටයුතු විමධ්‍යගත කරන ලදි. මෙම ඡේදයේ මුලින් කී පරිදි 1910 වර්ෂය වන විට බිහි වී තිබූ යුධ හමුද ස්වේච්ඡා ඒකක වල නම්, පෙළපාලියේ ගමන් කරද්දී ජ්‍යෙෂ්ඨතාවය අනුව ගමන් ගන්නා පිළිවෙල පහත දක්වා ඇත.

1. ලංකා ආරක්ෂක කාලතුවක්කු ඒකකය ස්වේච්ඡා
2. ලංකා ඉංජිනේරු ඒකකය ස්වේච්ඡා
3. ලංකා ආරෝහක රයිපල් ඒකකය ස්වේච්ඡා
4. ලංකා පාබල හමුදව ස්වේච්ඡා
5. ලංකා වැවිලි කරුවන්ගේ රයිපල් බලකාය ස්වේච්ඡා
6. ලංකා හමුද සේවා බලකාය ස්වේච්ඡා
7. ලංකා වෛද්‍ය බලකාය ස්වේච්ඡා

එමෙන්ම 1910 වර්ෂයේ දී ලංකා ආරක්ෂක බලසේනාව බිහිවීමත් සමගම ඉහත සඳහන් සියලුම ඒකකයන් ගේ නමෙහි අගට යොද තිබූ ස්වේච්ඡා යන පාඨය අත්හරින ලදි. තව ද 1881 වර්ෂයේ දී ආරම්භ කළ ලංකා පාබල හමුදව ස්වේච්ඡා හි කණ්ඩායම් වශයෙන් පිහිටුවා තිබූ කාලතුවක්කු කණ්ඩායම, ඉංජිනේරු කණ්ඩායම, ආරෝහක රයිපල් කණ්ඩායම, ගිලන්මැපි කණ්ඩායම යන කණ්ඩායම් ඉහත නව ඒකක නිර්මාණයට පුරෝගාමී වූ බව සඳහන් වේ.

ලංකා පාබල හමුදව ස්වේච්ඡා තුලින් ඉහත සඳහන් නව බළඇණි බිහිවීම ශ්‍රී ලංකා යුධ හමුදවේ ළදරු අවධිය ළමා අවධිය වෙත අවතීරණය වූවක් බව සඳහන් කළ හැක. මින් මතු දැක්වෙන කරුණු හුදෙක් ලංකා පාබල හමුදව අලලා ඉදිරිපත් කළ අතර, එමගින් ශ්‍රී ලංකා යුධ හමුදවේ ළමා අවධිය ක්‍රමක් ක්‍රමයෙන් පරිණත බවට පත් වී පිරිපුන් ශක්තිමත් පුරුෂයකු බවට පත් වූ ආකාරය පිළිබඳව යම් හැඟීමක් ඇති කර ගත හැකි වේ යැයි සිතමි.

## ලංකා පාබල හමුදවේ පුහුණු කටයුතු නගා සිටුවීම

ලංකා ආරක්ෂක බලසේනාව විසින් 1910 වර්ෂයේ අනුමත පරිදි ලංකා පාබල හමුදවේ සංස්ථාගත නිලධාරීන් 37ක් සහ සෙසු නිලයින් 999ක් විය. මෙම සංඛ්‍යාවෙන් නිලධාරීන් 03 ක් සහ සෙසු නිළයින් 200 ක් පූර්ණකාලීනව සක්‍රිය සේවයේ යෙදී සිටි අතර, ඔවුන් සක්‍රිය සේවයේ ස්ථානගත ව සිටියේ කොළඹ ඇට්ලන් බැරැක්කයේ ය. සක්‍රිය සේවයේ යෙදී සිටි අයවලුන්ගේ ප්‍රධාන රාජකාරිය වූයේ කොළඹ නගර ආරක්ෂක බලසේනාවේ කොටසක් වශයෙන් කටයුතු කිරීමයි.

ලංකා ස්වේච්ඡා හමුද සේනාවේ මූලික කාර්යය වූ පිටතින් පැමිණෙන ආක්‍රමණයක දී දිවයින ආරක්ෂා කිරීමත් අභ්‍යන්තර ආරවුල් සහගත තත්වයකදී සිවිල් බලධාරීන් ආධාර ඉල්ලූ විට ආධාර දීමත් ය. මෙම ද්විකාර්යයන් සපුරාලීමට අවශ්‍ය වූ පුහුණුවක් ස්වේච්ඡා සේවයේ නිලධාරීන්ට හා සෙසු නිලයින්ට ලබා දීමේ වැඩ පිළිවෙලක් ලංකා ආරක්ෂක බලසේනාව විසින් සැලසුම් කරන ලදි. පුහුණුවීම් කටයුතු පුද්ගලිකවත්, සාමූහිකවත් මුළු අවුරුද්ද පුරා අඛණ්ඩව පැතිරී යන පරිදි සැළසුම් කරනු ලද අතර, මෙහි අවසන් අදියරය වූයේ වාර්ෂික පුහුණු කඳවුරු ය. වාර්ෂික පුහුණු කඳවුරු වල දී යුධ අභ්‍යාස, වෙඩි තැබීම් හා අවි පුහුණු පරීක්ෂණ යනාදිය පැවැත්විණි. ස්වේච්ඡා සෙබළා මෙම පුහුණුවීම් කටයුතු වල තම නිදහස් කාලය කැප කර නිරත වූයේ ඔහු තුලින්ම පැන නැගුනා වූ උද්යෝගයකින් වූ තර, අත්‍යවශ්‍ය වූ විටක දී තමාගේ මවු බිම උදෙසා තම ස්වේච්ඡා සේවය පුද කිරීමට සියල්ලන්ම සැදී පැහැදී සිටිය හ.

මේ අයුරින් සමකාලීන ස්වේච්ඡා පුහුණුවීම් කටයුතු 1949 වර්ෂයේ දී ශ්‍රී ලංකා යුධ හමුද නිත්‍ය ඒකක නගා සිටුවන තෙක්ම අඛණ්ඩව පැවතුනි. නිත්‍ය යුධ හමුදව නගා සිටුවීමෙන් පසුව ද මෙම ස්වේච්ඡා සේනා පුහුණුව කෙරීගෙන ගිය නමුත් මෑතක දී ඇති වූ අඛණ්ඩ සක්‍රිය සේවයේ අත්‍යවශ්‍ය භාවය විසින් ස්වේච්ඡා පුහුණුවීමේ සහ ක්‍රියාකාරකම් වල ස්වභාවය සහමුලින්ම වෙනස් කරන ලදි.

## ප්‍රථම විදේශ සේවාව

පළමුවන ලෝක සංග්‍රාමය ආරම්භයේ දී ද ලංකා පාබල හමුදව ස්වේච්ඡා විසින් බ්‍රිතාන්‍ය හමුදව සමග මිත්‍ර හමුදවන්ට ආධාර කිරීම සඳහා සිය බළමුළුවක් එතෙරට යැවීමට 1914 වර්ෂයේ දී සතුට පළ කළ නමුත් බ්‍රිතාන්‍ය හමුද මෙහෙය වූ ජෙනරාල් වරයා විසින් තාවකාලිකව එය ප්‍රතික්ෂේප කරන ලදි. කෙසේ වෙතත් එයින් පසුව බ්‍රිතාන්‍ය රජයට ලංකා පාබල හමුද සේවය පළමුවන ලෝක සංග්‍රාමය වෙනුවෙන් ලබාගැණීම අවශ්‍ය වූ අතර, ඒ අනුව ලංකා පාබල හමුදව ස්වේච්ඡා හි නිළධාරීන් 11 දෙනෙකු හා සෙසු නිලයින් 73 දෙනෙකු ඔවුන්ගේ කැමැත්ත ද ඇතිව එංගලන්තයට යවන ලදුව බ්‍රිතාන්‍ය යුධ හමුද ඒකකයන්ට අනුයුක්තව යුරෝපාකරයේ සිදු වූ සටන් වලට සහභාගී වී විශිෂ්ඨ ලෙස තම සේවය ප්‍රධානය කර ඇත. බ්‍රිතාන්‍යයේ "කෝල් ඩ් ස්ට්‍රීම්" රෙජිමේන්තුවට අනුයුක්තව බ්‍රිතාන්‍ය හමුදව සමග ප්‍රංශය සහ ප්ලාන්ඩර්ස් වල සටන් වලට සහභාගී වූ ලංකා පාබල හමුදවේ සාමාන්‍ය සෙබල එච්ආර් ජැකොටින් මෙහි දී සිහි කරනු වටී.

දරුණු මිශ්‍ර සටනකින් පසුව ප්‍රහාරයක් පසුබැස්වන ලදි. 0915 පැයට, වඩා වැඩි උද්යෝගයකින් ප්‍රහාරය නැවත අරඹන ලද නමුත් නැවතත් එය ප්‍රතිඵල රහිත විය. මෙහි දී සටන් කළ අයවළුන්ගේ බලාපොරොත්තු සුන් වූ ස්වභාවය මොනවට පැහැදිලි වේ. තමන් සමග සිටි අයගෙන් එක් අයෙක් හැරෙන්නට අනෙක් සැවොම මියගොස් හෝ තුවාල ලැබ සිටිය දී ඉතිරිව සිටි ඕල්ඩ් ස්ට්‍රීම් මුරබළඇණියේ සාසෙ ජැකොටින් පමණක් විනාඩි 20 ක් තනිවම සටන ගෙන යමින් සිටිය දී සතුරු අත්බෝම්බයක් වැදී ඔහු සුනු විසුනු වී ගියේ ය.

## ප්‍රථම වර්ණ ප්‍රධානය

1917 වර්ෂයේ දී ලංකා පාබල හමුදවට එවකට කොළඹ ස්ථානගතව සිටි බ්‍රිතාන්‍ය නිත්‍ය ඒකකයක් වූ 80 වන කර්නාටික ඒකකය විසින් කරමින් සිටි රාජකාරීන් එම ඒකකය වෙතින් බාර ගන්නා අලස අණක් ලැබුණි. මේ අනුව බළඇණිය කර්නාටික ඒකකයේ රාජකාරී ආවරණය කිරීම සඳහා ඇට්ලන් බැරැක්කයේ ස්ථානගත විය. අනතුරුව 1920 වර්ෂයේ දී එවකට ලංකා පාබල හමුදවේ අණදෙන නිලධාරි තැන වූ ලුතිනන් කර්නල් ටීජ්ඩබ් ජයවර්ධන, වීඩී, විසින් ලංකා පාබල හමුදවට රාජකීය හා රෙජිමේන්තු වර්ණ ධජ ප්‍රධානය

කිරීම පිළිබඳව බ්‍රිතාන්‍ය මහ රජුගේ සතුට හා කැමැත්ත විමසන ලෙස එවකට ශ්‍රී ලංකාවේ සේනාභාරව සිටි සේනාවිධායකගෙන් ඉල්ලා සිටියේ ය. මෙම ඉල්ලීමට බ්‍රිතාන්‍ය මහ රජුගේ සතුට හා කැමැත්ත පළ වූ නිසා 1922 මාර්තු මස 22 දින බ්‍රිතාන්‍ය රජ පවුලේ සාමාජිකයෙකු වූ එඩ්වඩ් කුමරු නොහොත් වේල්ස් කුමරු විසින් කොළඹ ඇවිලන් පෙළපාලි භූමියේ දී බ්‍රිතාන්‍ය මහ රජු වෙනුවෙන් රාජකීය හා රෙජිමේන්තු වර්ණ ධජ උත්සවාකාරයෙන් බළඇණිය වෙත ප්‍රධානය කරන ලදී. පෙළපාලි වල දී වර්ණ ධජ රැගෙන යාමේ ගෞරවය එතැන් පටන් මෙම බළඇණියට ලැබී එය බළඇණි ඉතිහාසයට එක් විය.

## රාජකීය හා රෙජිමේන්තු වර්ණ ධජ ප්‍රදර්ශනය

වර්ෂ 1922 සිට 1939 දක්වා කාලය තුළ ලංකා පාබල හමුදාවේ සක්‍රිය සේවයට කැඳවා සිටියේ එක් කණ්ඩායමක් පමණි. එම කණ්ඩායම රටෙහි අභ්‍යන්තර ආරක්ෂක කටයුතු පිළිබඳ රාජකාරියේ යෙදී සිටි අතර, අනෙක් පිරිස් සිරිත් පරිදි සිය පුහුණු වීම් කටයුතු හා අනෙකුත් ක්‍රියාකාරකම් වල නිරතව සිටිය හ. ඒකක වාර්ථා වලට අනුව එම වකවානුව තුළ දී යාන්ත්‍රික තුවක්කු හා රයිෆල් හා පිස්තෝල වෙඩි තැබීමේ සරඹ පැවැත්වූ බව දැක්වේ. මෙම කාලසීමාව ඇතුලත දීම එනම්, 1925, 1927, 1934 සහ 1937 යන වර්ෂ වල දී ඒකක තුළ රාජකීය සහ රෙජිමේන්තු වර්ණ ධජ ප්‍රදර්ශණය කිරීම ඉතා උත්සවාකාරයෙන් කෙරී ඇත. මීට අමතරව බ්‍රිතාන්‍ය මහරජුගේ උපන්දින උත්සවයේ දීත් වැදගත් විදේශීය අමුත්තන් දිවයිනට පැමිණි විටත් ඒකකය විසින් සම්මාන මුර පිරිනමන ලදී.

## දෙවන ලෝක සංග්‍රාමය

2 වන ලෝක මහා සංග්‍රාමය ඇරඹීමත් සමගම (1935-1945) ලංකා පාබල හමුදාව 1939 සැප්තැම්බර් මස 1 වන දින දරණ ලංකාණ්ඩුවේ විශේෂ විකාශණයක් මගින් සක්‍රිය සේවයට කැඳවන ලදී. එහි එක් කණ්ඩායමක් ත්‍රිකුණාමලයට ද තව එකක් දියතලාවට ද යවන ලද අතර, සෙස්සන් කොළඹ නගරයේ රාජකාරියේ යොදවන ලදී.

2 වන ලෝක මහා සංග්‍රාමයට ජපානය අවතීර්ණය වීමත්, ආසියාවේ ඔවුන් කළ සටන් වල සාර්ථක තත්වයත් නිසා කොයි මොහොතේ හෝ ජපානය ශ්‍රී ලංකාව ආක්‍රමණය කරාවි යැයි බියක් පාලක පක්ෂය වූ බ්‍රිතාන්‍යයන් අතරේත් ස්වදේශිකයින් අතරේත් පැවතුණි. මේ නිසා ලංකා පාබල හමුදාව රෙජිමේන්තුවක් බවට පත් වී රෙජිමේන්තු මූලස්ථානයේ දී සහ එහි සේනාවිධායකයෙකු යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආරක්ෂාව පිළිබඳ ප්‍රතිසංස්කරන යොදවන ලදී.

1945 වර්ෂයේ දී 2 වන ලෝක මහා සංග්‍රාමයේ අවසානයත් සමගම ලංකා පාබල හමුදාවේ සේවා මුක්ත කිරීම් ඇරඹීමෙන් එය පෙර තිබූ තත්වයට නැවත පත් විය. මෙම ප්‍රතිසංවිධානය අවසන් වූයේ 1948 වර්ෂයේ දී ය. ප්‍රතිසංවිධානය වූ බළඇණි වර්ෂ 1948 දී එහි මුල් නාමය වූ ලංකා පාබල හමුදාව ස්වේච්ඡා යන්න නැවත භාවිතා කිරීම සිදු කරන ලදී.

1948 වර්ෂයේ පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයේ ස්වෛරී ස්වාධීන රාජ්‍යයක් බවට පත් වුණි. නිදහස ලැබීම පිළිබඳව බ්‍රිතාන්‍යය මහරජුගේ එම ඓතිහාසික ලියවිල්ල ලංකාවට ගෙන එන ලද්දේ ග්ලෝස්ටර් ආදිපාද වූ හෙන්රි කුමරුවන් විසිනි. සාම්ප්‍රදායිකව හෙන්රි කුමරු ලංකා පාබල හමුදාවේ ගෞරවනීය කර්නල් නිළයක් දරන්නකු වූ නිසා ඔහු කොළඹ රජින නිවස්නයට පැමිණි වේලෙහි ලංකා පාබල හමුදාව ස්වේච්ඡා විසින් ඔහුට සම්මාන මුරයක් පිරිනමන ලදී. මෙම සම්මාන මුරයේ රාජකීය වර්ණ ධජ සහ රෙජිමේන්තු වර්ණ ධජ ප්‍රදර්ශණය කරන ලදී.

## ශ්‍රී ලංකා යුධ හමුදාව ප්‍රතිස්ථාපනය කිරීම

වර්ෂ 1949 දී පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගන්නා ලද යුධ හමුද පනතේ බලතල යටතේ නිදහස් ශ්‍රී ලංකාවට තමන්ගේම යුධ හමුදාවක් පිහිටුවා ගැනීමට හැකි විය. එසේ නගා සිටුවන ලද යුධ හමුදාව ප්‍රධාන වශයෙන් කොටස් 4 කින් සමන්විත විය. එනම් නිත්‍ය හමුදාව, නිත්‍ය උපසේවය, ස්වේච්ඡා හමුදාව සහ ස්වේච්ඡා උපසේවය යනුවෙනි. මෙයින් පසු එතෙක් පැවති ලංකා ආරක්ෂක බලසේනාව අක්‍රිය විය.

ඉහත සඳහන් පනතේ අණ පනත් අනුව එයට පෙර දින දක්වා ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ සියලුම ස්වේච්ඡා ඒකකයන් ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවට ඒකරාශි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1881 එනම් යටත් විජිත යුගයේ නගා සිටවූ ලංකා පාබල හමුදාව ස්වේච්ඡා (වර්ෂ 1910 සිට ලංකා ආරක්ෂක බළසේනාව යටතේ වූ) 1949 දී තම ඒකකය 1881 සිට හැදින් වූ නම ද, 1922 දී එයට ප්‍රධානය කරනු ලැබූ වර්ණ ධජ ද, දීර්ඝ කාලයක සිට බ්‍රිතාන්‍ය රජ පවුල විසින් ඒකකය වෙත දැක් වූ අනුසාසකත්වය ද, අවුරුදු 68 තුල හදවඩා ගන්නා ලද ඒකක සම්ප්‍රදයන් ද සමගින් ශ්‍රී ලංකා යුධ හමුද ස්වේච්ඡා බලසේනාවට එක් විය.

## නිත්‍ය පාබල ඒකකය

ශ්‍රී ලංකා යුධ හමුදාව නගා සිටුවීමෙන් පසුව මුලින් ඇති කරන ලද නිත්‍ය පාබල බළඇණිය "ලංකා පාබල හමුද රෙජිමේන්තුව" යනුවෙන් හැදින්විය. මෙම නව රෙජිමේන්තුවේ නිලධාරින්, කොමිෂන් නොලත් නිලධාරින් සහ සෙසු නිලයින් වැඩි දෙනෙක්ම ප්‍රාථමික අවධියේ තිබූ ලංකා පාබල හමුදාව ස්වේච්ඡා හි සේවා මුක්ත තත්වයේ පසු වූ නිලධාරින්ගේ හා සෙසු නිලයින්ගෙන් සමන්විත විය.

වර්ෂ 1950 දී ලංකා පාබල හමුද රෙජිමේන්තුවේ (නිත්‍ය) හා ලංකා පාබල හමුද (ස්වේච්ඡා) බළඇණියේ නම් වල වෙනසක් ඇති විය. නිත්‍ය බළඇණිය 1 වන බළඇණිය ලංකා පාබල හමුදාව වශයෙන් ද ස්වේච්ඡා බළඇණිය 2වන බළ ඇණිය ස්වේච්ඡා ලංකා පාබල හමුදාව වශයෙන් ද නැවත නම් කරන ලදී. මෙම නම් වෙනස්වීමට හේතු වී ඇත්තේ එවකට ශ්‍රී ලංකා හමුදාව ගොඩනැගෙමින් තිබූ අවධියක සිටි නිසා ශ්‍රී ලංකා හමුදාව නගා සිටුවීමට පෙර තිබූ ලංකා ආරක්ෂක බලසේනාව යටතේ ක්‍රියාත්මක වූ සෑම ස්වේච්ඡා ඒකකයකටම නිත්‍ය ඒකකයක් බිහි කිරීමට තීරණය කළ නිසා වෙනි. එම ස්වේච්ඡා ඒකකයන් අවුරුදු ගණනාවක් තිස්සේ ගොඩනගාගෙන තිබූ සම්ප්‍රදායයන් හා ලබා තිබූ අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් නිත්‍ය ඒකකය බිහි කරන ලදී.

**1881 සිට 1949 දක්වා ලංකා පාබල හමුදවේ අණදෙන නිලධාරීන්ගේ නාම ලේඛණය :-**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1881 | - | 1882 | ලූති:කර් | ජේඑස් | ආර්මිටේජ් | |
| 1882 | - | 1886 | ලූති:කර් | ඩබ්ජේ | ගෝමන් | |
| 1886 | - | 1893 | ලූති:කර් | එච්පීඑච් | ක්ලාර්ක් | |
| 1893 | - | 1904 | ලූති:කර් | එච් | බර්ඩ් | වීඩී |
| 1904 | - | 1908 | ලූති:කර් | ඊ | බෙවන් | වීඩී |
| 1904 | - | 1904 | ලූති:කර් | ආර්එච් | මෝර්ගන් | වීඩී |
| 1908 | - | 1911 | ලූති:කර් | ඊසී | ඩේවිස් | වීඩී |
| 1911 | - | 1914 | ලූති:කර් | ජේජී | ප්‍රෙසර් | වීඩී |
| 1914 | - | 1917 | ලූති:කර් | එල්ජී | සොන්ඩර් | |
| 1914 | - | 1919 | ලූති:කර් | වී | වැන්ලැන්ජන්බර්ග් | වීඩී |
| 1919 | - | 1923 | ලූති:කර් | පීජීඩබ් | ජයවර්ධන | වීඩී |
| 1923 | - | 1927 | ලූති:කර් | ඒසීබී | ජොන්ස්ලස් | වීඩී |
| 1927 | - | 1931 | ලූති:කර් | එස්පී | සන්සෝනි | ඕබීඊ,ඊඩී |
| 1931 | - | 1935 | ලූති:කර් | ජේජී | වැන්ඩර්ස්මැට් | වීඩී |
| 1935 | - | 1939 | ලූති:කර් | ඩබ් | සන්සෝනි | ඕබීඊ, ඊඩී |
| 1939 | - | 1940 | ලූති:කර් | ජී | ග්‍රිපිත් | ඕබීඊ, ඊඩී.එම්සී |
| 1940 | - | 1943 | ලූති:කර් | ඩබ්ජී | මැක් | ඕබීඊ, ඊඩී |
| 1943 | - | 1948 | ලූති:කර් | ඒඑම් | මුතුකුමාරු | ඊඩී |
| 1948 | - | 1949 | ලූති:කර් | එච්ඩබ්ජී | විජේකෝන් | ඕබීඊ, ඊඩී |

කපිතාන් එස්ඩබ්එම්ටීබී හුලුගල්ලේ ශ්‍රීලපාහ විසිනි

# MY DEAR DAD

I can remember the day that my mother told me about my loving father whom I had hardly seen.

But I always believed that you were my loving father because you are very much different to others.

I have very little memmories of you my dear Dad because you didn't live with us long.

The days I can remember my mother took me to the school and came back to take me home.

But my friends they came with their Dad's to school and went back with their mums which I didn't understand.

They talk about their Dads in the class room they write pages and pages about their Dads.

Sorry my dear Dad I wasn't able to write about you because I do not know you very much.

Twinkle twinkle little stars my favourite song that teacher taught me which I sing every morning and night.

I like that song very much because my mother showed those lovely twinkle stars which were on your uniform.

You come home after very long spells to spend with us but only 7 days leave.

I can remember how happy we were when you came. I talk about you to all of my friends. You are our hero.

But I don't know why you disappeared suddenly leaving my Mum and me in the lonely home.

Can you remember the tears rolling down my Mums beautiful cheeks when you left for the warfront.

I like to walk on the Galle Face Green with my dear Mum and You like my friends do on evenings.

But my dear father you didn't give me a chance to take your hand and to run along with you on that green.

One day I asked mum why you don't come to see us. Mum didn't talk but tears ran down her cheeks.

You have left my dear mum and me for ever, leaving my dear mum and me in this misserable world.

One day I remember how you were carried away, by your own colleagues from out little home.

They buried you with sounds of gunfire at sunset. I am angry with all of them but I couldn't stop them. I am small.

I can remember how my mother wept with me. But my dear dad you were silent and still.

We were crying for one whole day at the place you were buried in the lonely cemetery

Your soul was taken by God into heaven. You will not come again to see my mum and me.

My dear father may you rest in peace in heaven but please come again to see me and mum. Please Dad.

Your loving son

**2/LT SK SENARATNE**
**SLLI**

# සෙබළ හදකට නැගෙන රාවය

බිවූ මව්කිරි සුවඳ මුවෙන් ගිලිහී වැඩි කාලයක් ඉකුත් වන්නටත් මත්තෙන් ගිනි අවි දැත දරා සටන් බිමට පිවිසියේ ඔබ රක්ෂාවීම සඳහා මුදල් සොයනා අදිටනකින් පමණක්ම නොවනා බව මා හට සක් සුදක් සේ පැහැදිලියි සොයුර. ගිනි ගෙන දැවෙනා උතුරුකරයත් දිනෙන් දිනම සිදු වන්නා වූ ත්‍රස්ත ක්‍රියාවලුත් නිසාවෙන් ඔබ ඒවැනි නිගමනයකට එළැඹී බව මා දනිමි. ඔබේ නිසල කය වසාගත් සිංහලධජයේ ඒකීය භාවයත් මෙලොව එළිය දැකීමට පෙර දරණ ලේ කැටි බිළිඳුන් හටත් වර්තමානයේ නිදහස් නිවහල් රටක් උරුම කර දෙන්නට අප සැම එකට එක්ව ගමන් ගත් නමුත් සොයුර ඔබ අද නිහඬය. අද ඔබ වෙන්ව ගියත් කවර දිනක හෝ මේ සටනින් අප ජය ගන්නා දිනයක ඔබ නිදනා සොහොන් ගැබ අවට සමන් පිච්ච මලින් බරවී ඔබට ආසිරි සලන්නේ ය. ප්‍රිය සබඳ සතුරු උණ්ඩයට ලක්ව මිහිතලය සිපගත්, ප්‍රාණය නිරුද්ධ ඔබගේ සිරුරින් හමා යන්නේ අප සැමගේ ජයග්‍රහණයේ සුවඳ නොවේ ද? සොබර සිතින් යුතුව පතන්නෙමි මෙලෙසින් අප හා එක්ව රට සුරැකීමේ උදාර මෙහෙවරට එක් වන්නට යළිත් ඔබ අප අතරම උපදීවා .....

**සෙ/302670 ලාංකෝ සිල්වා ඒපේඑන්කේ**
**8 ශ්‍රීලපාහ බී කණ්ඩායම**

# සෙන්පති කොබ්බෑකඩුව

රණබිම පුරා ජය හඬ රණ ගොස නැගුව
සතුරන් දුටු විට දී පරද බිම හෙළුව
"ඊළම" නොදී එක ධජයට ජය පැතුව
දැයට අහිමි සෙන් පති කොබ්බෑ කඩුව

වැලි කතරේ ගිනි අව්වේ සැරි සැරු ව
ලක්බිම රකින්නට පෙර වීරිය දැරු ව
තල් අරණකදී ගිලිහිනි අතරැදි කඩු ව
අද නැත ලක් මවුගේ පුතු කොබ්බෑ කඩුව

දොර දොර එද සුදු කොඩිවැල් එසවි ය
ලක් දන නෙත් කඳුලු බිඳු බිඳු නැගුනේ ය
හැම හදවත් තුලම සෝගිනි වැදුනේ ය
සෙන්පති තුමා නිසලව තල් අරණේ ය

සුවිසල් මැදුරකය ඔහු ඉපදී ඇත්තේ
තල් අරණකලු අසි පත ගිලිහී ඇත් තේ
වැලි කතරක මැදලු දිවි පුදදී ඇත් තේ
ජාතික රුධිරයයි පොලවට බී ගත් තේ

ඔබ නැති රණ බිමක වෙඩි හඬ නො ඇ සේ වා
රණ බිම පුරා ඔබගේ හඬ රැව් දේ වා
රණ විරුවන්ට නොපෙනී ඔබ අණ දේ වා
ලක් රණ බිමට අදිපති දෙවියෙක් වේ වා

**නි/60370 කපිතාන් ඩීඑල්ආර්වී පෙරේරා. ශ්‍රීලපාහ**

# සහරා වලින් උපුටා ගන්නා ලද දර්ශණ වැකි

☛ අප අපව මනින්නේ අපට කළහැකියි අප සිතන දෙය අනුවය. එහෙත් අන් අය අපව මනින්නේ අප විසින් කොට ඇති දෙය අනුවය.

හෙන්රි වඩ්ස්වර්ත්

☛ නිරායාසයෙන් ජනනායකත්වයට පත්වන්නේ ස්වල්පයකි. ඔව්හු වාසනාවන්තව නිරෝගීව වසති. උපක්‍රමයෙන් නායකයන් වන අන් සියලු දෙනාම අවසන් වන්නේ හිස් බවෙන් සහ මානසික ගිලන් බවෙනුත් ය.

හර්මන් හේස

☛ මිනිසුන් නීති හදන්නේ ඒවායින් රිංගා යාමට ද ඉඩකඩ තියමිනි.

විලියම් රොව්ස්ලර්

☛ විනය යනු ඔබට උවමනා දෙය කුමක් දැයි නිරතුරුව සිහියේ තබා ගැන්මය.

ඩේවිඩ් කැම්ප්බෙල්

☛ සතුරාට දැනුවත්ව හෝ නොදැනුවත්ව ඔහුට සමාව දීමෙන් ඔබට මිල කළ නොහැකි චිත්ත ප්‍රීතියක් විඳිමේ අවස්ථාව ලැබේ.

ඩී. ඒ. බැප්ටිස්ටා

☛ පියා හෝ මව ඔහුගේ හෝ ඇයගේ මව්පියන්ට සලකන ආකාරය දරුවෝ බලා සිටිති. දරුවෝ ද එය අනුකරණය කරති.

මහාචාර්ය ඩබ්. එස්. කරුණාරත්න

☛ මාතෘත්වයේ ඉතාම උද්වේගකර කාල පරිච්ඡේදය වන්නේ උදෑසන ආහාර වේලාවයි.

රොබට් ස්ටීවන්සන්

☛ අප විසින් උත්සාහ කළ යුත්තේ සෑම දෙයක්ම හැකි තරම් පහසුකර ගැන්මට නොව හැකි තරම් සරලකර ගැන්මට ය.

ඇල්බට් අයින්ස්ටයින්

☛ ඇඟ බේරා ගැනීම සඳහා බෙල්ල කඩාගැනීමට කටයුතු කරන එකම සත්වයා මිනිසා ය.

හැරල්ඩ් කොෆින්

☛ සෑම කෙනෙකුම විසින් කියවන පුවත් පතක් වසරකට පසු කියවන්න. කිසිවකු නොදත් දේ දැනසිටීමට එවිට ඔබ සමත් ය.

රැල්ෆ් ඉමර්සන්

☛ සාමය යනුවෙන් හඳුන්වන්නේ පුද්ගලයන් අතර සැබෑ ප්‍රේමය සහ සහෝදරත්වය ව්‍යාප්ත වීමයි.

ශාන්ත ඔගස්තීනු

සකස්කර ඉදිරිපත් කලේ
සෙ/302419 සාසෙ ප්‍රනාන්දු ඩබ්එත්එස්. රෙජී මූලය ශ්‍රීලපාහ

# DUTY, HONOUR, COUNTRY

Dear Soldier,

All of us fighting men of the Armed Services, have been trained and moulded in the style and system of Conventional Warfare. The whole ruddy lot of us, for instance have been put through our paces at Initial training, as well as at Unit, Advanced, Specialised, Refresher and other training - with little or no change in the objectives of conventional warfare.

You will remembr that from those far off days, our basic training has, more or less been based on War Office Coes and other similar British pamphlets. In Weapon training we moved from 'Stripping and Cleaning' to Advanced Handling, to Run-Down shots at the range, and to Field Firing, without even for a moment straying away from the pamphlet. Similarly, in Fieldcraft we devoutly began with "Why things are seen' and progressed faithfully through the W.O. Cod to Concealment in the Field. Also, using the Manual of Map Reading as our navigational bible, we graduated from Mapcraft to Map Setting and Position Finding, to Field Shetching, and to Air Photo Reading.

And ofcourse all the while Soldier, we thumped the Parade Square where discpline was drilled into us untill they were satisfied that we would always obey our superiors' orders, promptly and without question, irrespective of whether it came from a Brigadier or from a Corporal, and whether we had to carry out orders under pressure in the face of the enemy.

Yes Solier, all that training and discipline had been given to us to make us efficient combatants whether within a Section, a Platoon a Company or a Battallion - fighting in the style and of conventional warfare, with the objective of denying to an end territory whenever he has designs on it, and of finally repulsing an attack with such force and aggressiveness, that he would be distuaded from having further designs on our territory.

And Soldier, what of our enemy? You will remember that according to our training, he too was expected to fight in the style and system of conventional warfare. We were warned that he may alter his methods or change tactics to take us by surprise - but all those, were within the rules and principles of conventional warfare.

But Soldier, you have observed that the enemy we face today do not fit that pattern. He does not fight according to the principles and rules of conventional warfare. His style is not that of the Regular soldier we were trained to expect as our enemy. Instead, his is very much the manner and fashion of the Irregular fighter - the one whose tactics are essentially Ambushes, Hit and Run, Surprise attacks from the Rear and on our Flanks, Night Attacks, Sabotage and such.

Yet Soldier we connot really say that style of the Irregular is entirely stange to us. You will recall that in Infantry training, we ourselves have gone through all types of Ambush and Anti Ambust drills, Sabotage and other Irregular warfare methods, of course within the farmework of conventional warfare - like for instance operations behind enemy lines. And of course, such training constituted only a small part of our full training.

What do we really face today Soldier? You may perhaps say that it is something totally different, something that lacks the honour and ignity of conventional warfare - something that could even be thought of as mean and cowardly. And what does it do to us? It makes us very angry. Our automatic impluse is to hit back and to destroy him. But he does not remain to be hit or to be destroyed, for he is trained to strike as hard as he could, and then disappear. And that makes us even more angry - with the result that we want to hit back at anyone and everyone; and to smash anything and everything around. But Solier, that is a very bad thing indeed because, that exactly is what our Irregular enemy wants us to do so that he could justify his fight: so that he can convert more people to his cause; and so that he could win over and retain the sympathy and support of foreigners untill he has achieved his aim - which in this case is Eelam or a Separate State.

So what must we do Soldier? We have to restrain ourselves and to control ourselves. We have to use the discipline that was instilled into us to its full, and should we find that inadequate in the face of Irregular tactics, we must then find a way to build in us, a discipline even greater than that wich has been instillied into us. But how do we do that, Soldier? Let us however, before we get on to how we could do it, first briefly examine this thing called Irregular warfare.

Guerrilla warefare in Spanish means "Small ar". The object of Irregular fighting may be to overthrow governments or to seek independent Statehood.

Irregular warfare is sometimes described as an Intermediate state between tranquility and conventional war. In other words Irregulars plan to buil themselves, often in locations outside their Operational areas, into regular conventional troops he will engage us in combat with the aim of defeating us, and thus achieving their Separate State. Till then, they will, using Irregular tactics, attempt to ware us down, to demoralise us and to snuff the fight out of us. And that Soldier is why we must continue to train in the style and system of conventional warfare, so that enventually when the decisive battles are fought, We will prevail.

The Irregulars of Greece - after the Second World War, operated from Albania, Bulgaria and Yugoslavia, to which they fell back whenever hard pressed, only to recross at some other place.

To Irregulars it is a warfare with no defined lines, and irregularity is their trade mark. They need broad expanse of terrain, sufficiently broken and difficult - to give security to their bases: to cloak their operations; and to discourage continued pursuit.

Irregulars must have at least the passive support of the people. They are ocassionally compared to fish, with the people constituting the water. Without the people's support - or without the water - the fish will surely die. But with much support from the people - even passive support - the fish will certainly thrive. And that Soldier is why we must not do anything to antagonize the people.

Irregular attacks are generally carried out by thorough, independent fighters, quite accustomed to hardship. They do have some design of organisation and discipline, and they do need logistic support.

They seek professional leadership and advice - even from Regulars which is infact quite important to them.

With experience, Irregulars find refinements to their methods while their basic tactics remain the same. Being Irregulars, they are ofcourse too loosely knit and widespread for concentrated effort.

The effectiveness of Irregulars depend on their inherent talents, their speed, their mobility, their endurance, their independent arteries of supplies, and their familiarity with the terrain they operate in.

Generally Soldier, Irregulars carry on a war of detatchment. The seek to contain us' they try to modulate our action; they endeavour to force us to spread out; they try to interrupt our lines of communication; they destroy government buildings, equipment and materials, and they try to turn the people against us.

So there we are Soldier, facing through crafty, trained and efficient Irregulars, who continously seek to knock us off balance; to make us antagonise the people; and to make us loose the will to fight. But as we saw it earlier; we must not let ourselves be tilted over, We must find a way to build in us, a discipline even greate than that which has been instilled in us. Yes Soldier, how do we get about doing that?

What we need Soldier is something for us to rally round; something that will bring out the best in us. And what better than DUTY, HONOUR, COUNTRY? And what more effective than the manner in which that great solier General Douglas Mac Carthur described it at the West Point Military Academy, in 1962. Yes. Soldier, lets us take those parts of it which best suits us today, and then lets repeat them over and over again, untill we can confidently, and calmly, and objectively take on the Irregulars, and then destory them systematically and completely.

"DUTY, HONOUR, COUNTRY: Those hallowed words reverently dictate what you ought to be, what you can be, what you will be. They are your rallying point to build courage when courage seems to fail, to regain faith when there seems to be little cause for faith, to create hope when hope becomes forlorn."

"They teach you to be proud and unbending in honest failure, but humble and gentle in success; not to substitute words for actions, not to seek the path of comfort, but to face the stress and spur of difficulty and challenge; to learn to stand up in the storm, but to have compassion on those who fall; to master yourself before you seek to master others; to have a heart that is clean, a goal that is high; to learn to laugh, yet never forget how to weep; to reach into the future, yet never neglect the past; to be serious, yet never to take yourself too seriously; to be modest so that you will remember the simplicity of true greatness the open mind of true wisdom, the meekness of strength."

"They give you a temperate will, a quality of imagination, a vigour of emotions, a freshness of the seep springs of life, a temperamental predominance of courage over timidity, of an apetite for advantage over love of ease."

"They create in your heart a sense of wonder, the unfailing hope of what next, and the joy and inspiration of life"

"The code which those words perpetuate embraces the highest moral law and will stand the test of any ethics or philosophies ever promulgated for the upliftment of mankind. Its requirements are for the things that are right and its restraints are from the things that are wrong. The soldier, above all other men, is required to practice the greatest act of religious training - sacrifice. In battle, and in the face of danger and death, he discloses thoses attributes, however hard the incidents for war may be, the soldier who is called upon to offer and to give his life for his country is the noblest development of mankind."

"You now face a new world, a world of change. And through all this welter of change and development your mission remains fixed, determined, inviolable. It is to win our wars. Everyting else in your professional career is but corollary to this vital dedication. All other public purposes, all other public projects, all other public needs, great or small, will find others for their accomplishments; but you are the ones who are trained to fight."

"Ours is the profession of arms, the will to win, the sure knowledge that in war there is no substitute for victory, that if you loose, the nation will be destroyed. The very obsession of your public service must be DUTY, HONOUR, COUNRY."

"Others will debate controversial issues, national and international, which evides mens' minds. But serene, calm, aloof, you stand as the nation's war guardian, as its lifeguard from the raging tides of international conflict, as its gladiator in the areana of battle."

"Let civilian voices argue the merits or demertis of our processes of government: Whether our strength is being sapped by dificit financing indulged in too long, by power groups grown too arrogant, by politics grown too corrupt, by crime grown too rampant, by morale grown too low by taxes grown too high, by extremists grown too revelent; whether our personal liberties are as thorough and complete as they should be."

"These great national problems are not for your professional participation of military solution. Your guide post stands out like a tenfold beacon in the night: DUTY, HONOUR, COUNTRY."

"You are the leaven that binds together the entire fabric of our national system of defence. From your ranks come the great captains who hold the nations' destiny in their hands the moment the war toscin sounds."

"The long grey line has never failed us. Were you to do so, a million ghosts in olive drab, in brown khaki, in blue and grey, would rise from their white crosses, thundering those magic words; DUTY, HONOUR, COUNTRY."

I Have the Honour to be

Another Soldier, Another Time

**Wng Cdr Mark Seneviratne (Rtd)**


# දයාබර අම්මේ

ජීවිතයේ අරුත්බව
වර්තමානයේ සුන්දරත්වය
මම ඔබතුලින්
හැදින ගත්තෙමි
මගේ ජයසතුට මැද
ඔබේ ලය සැනසුනාය
ඒ සත්සර රාව මට දැනුනි
නෙත් කෙවෙනි රිදුම් දුන්
දුක් සුසුම් සුසානෙක
මගේ තනිනොතනියට
මගේ ධෛර්යය මෙන්ම
වුවානම් මගේ අත්වැල ද
ආදර අම්මෙ ඒ ඔබ විය
ඔබේ ආශිර්වාදය
මගේ අනාව සුවඳවත් කරාවි
නිතින් අම්මේ
ඔබ නොවේද සහන් සිහින්
මා සිත තුල පහනක්ව
දිලෙන්නෙත්....

සෙ/301953
**ලාකෝ රත්නායක** පිජ්එස්
යුහසඳවර
පාවක්කුඩිවේන

# එද මෙද තුර අප ආ මග....

## 3 වැනි බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව



සතුරු බංකරයකට පහරදීමට පුහුණු වෙමින් සිටින අවස්ථාවක්

හෙළයේ එද රජවරුන් ජය කෙහෙළි නැංවූ වැව් බැදි, ජාතියේ සමෘධිය ස්ථාවර කරවූ බොදු හෙළයේ කේන්ද්‍රස්ථානයක්ව පැවති ඓතිහාසික අනුරාධපුරවරයේ තිසාවැව අභියස පිහිටි බිම් පෙදෙසක 1985 දෙසැම්බර් මස 16 වෙනි දින නවත් පාබල ඇණියක් ආරම්භ කෙරුණි. මූළු මහත් ශ්‍රී ලංකා යුද හමුදවටත්, ශ්‍රී ලංකා පාබල හමුදවටත් නවකයෙකු ලෙස එද කලඑළි බැසි 3 වැනි බලඇණිය - ශ්‍රී ලංකා පාබල හමුදව එද මෙද තුර ආ ගමන....

ප්‍රථමයෙන් බලඇණිය කණ්ඩායම් 05 කින් සමන්විතව එනම් මූල ඒ, බී, සී සහ ඩී ලෙස ගොඩ නැගූ අතර, හෙළයේ සාමය රැකීමටත් ජාති වාදයේ කෲර සාපයෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශ ගලවා ගැනීම සඳහාත් 1986.01.24 දින ත්‍රි'මලය දිස්ත්‍රික්කයේ ස්ථාන ගත වන ලදී. 1987 මුල් භාගයේ දී සියලුම කණ්ඩායම් ත්‍රි'මලය ප්‍රදේශයේ තම තමන්ගේ ක්‍රියාන්විත රාජකාරී නිමාවෙන් පසු තිසාවැව කඳවුර වෙත පැමිණ තම හැකියාවන් ඔප්නැංවීම පිණිස සාමූහික පුහුණුවීම් වල නියලීමෙන් අනතුරුව 1987.02.02 දින කුරිරු ත්‍රස්ථවාදීන්ගේ ග්‍රහණයට පත්ව තිබූ මන්නාරම් ප්‍රදේශය විජයග්‍රහණය කිරීම සඳහා පිටත්ව ගියහ. මෙහි දී ත්‍රස්තවාදීන් විශාල පිරිසක් විනාශ කර අවිආයුධ, පතරොම් හා ලිපි ලේඛන තොගයක් ද එම ප්‍රදේශය ද අත්පත් කර ගන්නා ලදී. ඉන් පසුව මෙම ළදරු බලඇණිය සකල දෙසින් නෙත් යොමා සිටි යාපනය ප්‍රදේශය දිනා ගැනීමේ "වඩමරච්චි" මෙහෙයුමේ හවුල් කරුවන් ලෙස යාපනය ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරීන්හි නියලෙන ලදී. මෙම ක්‍රියාන්විතය සාර්ථක ලෙස නිමා කරමින් විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා ගැනීමට 3 ශ්‍රීලපාහ සමත් විය.

1987 මැද භාගයේ දී ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල තර්ජනයෙන් අඩපනව තිබූ කන්තලේ ප්‍රදේශය සිවිල් පාලනය යළි නගා සිටුවීමටත්, අවුල්ව තිබූ ජන ජීවිතයට නව පණක් ලබාදීමටත් සමත් වූ අතර, වසර දෙකක පමණ කාලයක් තුළ සැකකටයුතු පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට හා ඔවුන්ගේ කඳවුරු හා අවි ආයුධ රාශියක් අප බලඇණිය විසින් සොයා ගැනීමට සමත් විය. තව ද ඒකකයේ දෙවන හා තෙවන සංවත්සර සියලු බාධක මධ්‍යයේ උත්කර්ශවත් අන්දමින් සිදු කරන ලදී.

මින් අනතුරුව මහනුවර ප්‍රදේශයේ රාජ්‍ය විරෝධී මර්ධන රාජකාරීන්හි යෙදෙමින් රාජ්‍ය විරෝධී සැකකරුවන් විශාල ප්‍රමාණයක් හා ඔවුන් සතුව තිබූ අවි ආයුධ විශාල තොගයක් සොයා ගැනීමට අප ඒකකය සමත් විය. තව දුරටත් හෙළයේ අයිතිය රැක දීමටත් සාමකාමී පසුබිමක් බිහි කිරීමේ පවිත්‍ර චේතනාවෙන් 1989 මැද භාගයේ දී මාතර ප්‍රදේශයේ රාජකාරීන් භාර ගෙන එහි දී සැකකරුවන් අත්අඩංගුවට ගැනීම, අවිආයුධ අත්අඩංගුවට ගැනීම, වටලා සෙවීම් වැනි විවිධ ක්‍රියාන්විත වල යෙදෙමින් මාතර ප්‍රදේශයට සාමය උදකරලීමේ උදර සේවයක යෙදී සිටියහ. මෙහි දී කල රාජකාරීන්හි විශිෂ්ඨ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රචණ්ඩකාරීන්ගේ මූලස්ථානයක්ව පැවති මෙම ප්‍රදේශයේ ජනාධිපති ජංගම සේවය පවා සාර්ථක ලෙස දින 03 ක් මුළුල්ලේ ක්‍රියාත්මක කිරීමට හැකි විය. මෙම වකවානුවේ දී ඒකක හතර වන සංවත්සරය ඉතාමත් ඉහල මට්ටමකින් සිදු කෙරිණි.

මින් පසුව, ගාල්ල ප්‍රදේශයේ ප්‍රචණ්ඩකාරී ක්‍රියා හේතුවෙන් අඩපනව තිබූ සිවිල් පාලනය යථා තත්වයට ගෙන එමින් සාමකාමී වාතාවරණයක් උද කරන ලද අතර, රැකියා විරහිත තරුණ තරුණියන් උදසො තරුණ පුහුණු වැඩසටහනක් දියත් කිරීමෙන් හා ගාලු මහජන ක්‍රීඩාංගනයේ පැවැත්වූ ඒකක ක්‍රීඩා තරඟ හා යුද හමුද සංදර්ශණ පැවැත්වීමෙන් මහජනතාවගේ ප්‍රශංසාවට පාත්‍ර විය. මෙතෙක් ඒකකය රාජකාරීන්හි යෙදී සිටි ප්‍රදේශයන් තුළ සාමය ප්‍රතිෂ්ඨාපණය කිරීමට සමත් විය.

මෙසේ කාලය ගෙවී යද්දී නැවත 1990 මුල් භාගයේ දී ආරම්භ වූ දෙවෙනි ඊලාම් සටන සඳහා යාපන අර්ධද්වීපය බලා පිටත්වීමට මෙම ඒකකයට සිදු විය. පළමුව මයිලඩි, පලාලි, වාසවිලාන් ප්‍රදේශ ත්‍රස්තවාදීන්ගේන් මුදවා ගැනීම හා පලාලි ගුවන් පථයට ගුවන් යානා ගොඩබැස්සවීමට නොහැකි තත්වයක් උද වී තිබිය දී, එම ගුවන් පථය අවට ප්‍රදේශය ත්‍රස්තවාදීන්ගෙන් මුදවා ගැනීමෙන් අනතුරුව, එම ප්‍රදේශය හමුද යටතට නැවත ලබා ගන්නා ලදී. මින් පසු මෙම ප්‍රදේශයේ සිදු කරන ලද "ජය ශක්ති" ක්‍රියාන්විතයේ දී මෙම ඒකකය විශේෂ මෙහෙයක් ඉටු කරන ලද අතර, යාපනය ප්‍රදේශයේ සිදු කරන ලද සියලුම ක්‍රියාන්විතයන්ට සහභාගී වූ මෙම ඒකකය 1990 වර්ෂයේ අග භාගයේ දී ඉතාමත් අසීරු මුහුදු ගමනකින් පසුව "මන්නාරම්" දූපතට පැමිණෙන ලදී. "රණදෙරණ" ක්‍රියාන්විතය දියත් කරමින් ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයට ප්‍රතිප්‍රහාර එල්ල කර ඔවුන් පලවා හරිමින් මන්නාරම් නගරය, පේසාලේ සහ ඉරුකුලම්පිඩ්ඩි යන ප්‍රදේශ සතුරාගෙන් මුදවා ගනිමින් නැවත



ජවිපෙ ප්‍රචණ්ඩකාරීන්ගෙන් අත්පත් කරගත් අවිආයුධ/වෙඩිද්‍රව්‍ය සුළු කොටසක්

සිවිල් පාලනයට උචිත ලෙස මන්නාරම් ප්‍රදේශය සාමකාමී තත්වයකට ගෙන එන ලදී. මෙහි දී ප්‍රථම වතාවට එවකට ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මන්නාරම් දූපත සංචාරය කලේය. සතුරු බලවේග දුරුකර නැවත ජනජීවිතය නගා සිටුවීම ගැන ඔහු ඒකකයට ස්තූති කරන ලදී.

මෙම ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරීන්හි යෙදී සිටිය දී හදිසියේ වව්නියාව "මාන්කුලම" කඳවුරට එල්ල වූ ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල ප්‍රහාරය නිසා එම අවස්ථාවේදී මාන්කුලම් කඳවුරෙන් පිට වී අතරමං වූ හට පිරිස් හට සහායවීම සඳහා බලඇණිය වව්නියාවට පැමිණෙන ලද අතර, අතරමං වූ හට පිරිස් සෙවීම සඳහා මාන්කුලම් මෙහෙයුමට සහභාගී විය. මෙම ක්‍රියාන්විතය ඉතාමත් සාර්ථක වූ අතර, සෙබලුන් 04 දෙනකු සොයාගෙන සෙබලුන් 112 දෙනෙකුට වව්නියාව කඳවුර වෙත පැමිණීම සඳහා සහාය වුණි.

මාන්කුලම් ක්‍රියාන්විතය අවසන් වෙත්ම විරාමයක් හෝ නොලබා මඩකලපුව ප්‍රදේශයේ අනුබණ්ඩ රාජකාරී සහ ක්‍රියාන්විත සඳහා කුඹුරුමුල්ලෙයි, කිරාන්, සිත්තන්ඩිකුඩි, වෙන්කලඩි සහ එරාවූර් යන ප්‍රදේශ වල අප හටපිරිස් ස්ථානගත විය. මෙම අනුබණ්ඩ රාජකාරීන්හි යෙදී සිටිය දී ටයිගර්ෆ්ලෑෂ්, සවුත් ෆෝ බිලයින්ඩ් සයිඩ් ක්‍රියාන්විතයන් වලට සහභාගී වී එම ප්‍රදේශයේ සතුරන් හා සතුරු කඳවුරු විශාල ප්‍රමාණයක් විනාශ කර බලය තහවුරු කලේ ය.

1991 මුල් භාගයේ දී නැවතත් වව්නියාව ප්‍රදේශයේ ස්ථානගත වූ මෙම බලඇණිය පහත සඳහන් ක්‍රියාන්විත සාර්ථක කර ගැනීමේ මුල් පෙලේ හවුල්කරුවන් ලෙස පෙරමුණට එක් වූහ.

## බ්‍රෂ්අප් ක්‍රියාන්විතය I :-

1991.04.01 දින සිට 1991.04.05 දින දක්වා දින 05 ක දුෂ්කර ගමනකින් නිමා වූ මෙම මෙහෙයුම අවරන්තුලාව, කන්දඋඩයාර්පුර, වසම්කුලම්, සිත්තනම්පනෙයි, ඉට්ටූකුලම් සහ තවාසිකුලම් ප්‍රදේශයන් ත්‍රස්ථවාදීන්ගෙන් මුද ගැනීම හා ත්‍රස්ථයන් විනාශ කිරීමේ අරමුණින් දියත් කරන ලදී. මෙම ක්‍රියාන්විතයේ දී පොම්පෙමඩුව සණ කැලෑව තුල දී මෙම ඒකක බී කණ්ඩායමත් සමග ඇති වූ මුහුණට මුහුණලා සටනේ දී ත්‍රස්ථවාදීන් 25 කට අධික ප්‍රමාණයක් මියගිය අතර, ඔවුනට විශාල ලෙස අලාභහානි සිදු විය. මෙහි දී සෙනින් තිදෙනෙකු මියගිය අතර, අටදෙනකු පමණ තුවාල ලැබිය.


අත්අඩංගුවට ගන්නා ද අවි/පතරොම්

| | | |
|---|---|---|
| ඒකේ 47 අවි | - | 05 |
| ටී 56 එල්එම්ජී | - | 02 |
| එස්එල්ආර් අවි | - | 01 |
| එම්ජී-3 අවි | - | 01 |
| බෙහෙත් තුවක්කු | - | 01 |


ඉහත සඳහන් අවි වලට අයත් මැගසින් සහ ඩ්‍රම්ස්, නො: 36 ජීව අත්බෝම්බ තොගයක් සහ පතරොම් තොගයක්

## බ්‍රෂ්අප් ක්‍රියාන්විතය II:-

මෙම ක්‍රියාන්විතය සඳහා මෙම ඒකක සියලු කණ්ඩායම් සහභාගී වෙමින් 1991.04.08 දින සිට 1991.04.18 දින දක්වා පැවතුණි. අවරන්තුලාව සණකැලෑව තුලට පිවිසි හටපිරිස් පොම්පෙමඩුව සහ පූවරාසම්කුලම් යන ප්‍රදේශ වල ත්‍රස්ථවාදීන් විනාශ කර ඉතා සාර්ථක අන්දමින් ක්‍රියාන්විතය නිම කරන ලදී. කිසි වෙකුටත් තුවාල සිදු නොවූ අතර, ත්‍රස්තවාදීන් විශාල ප්‍රමාණයක් මියයන ලදී.



වව්නියාව ප්‍රදේශයේ කරන ලද වන්නි වික්‍රම ක්‍රියාන්විතයට සූදානම් වී



8 වන සංවත්සර ක්‍රීඩා තරගාවලියේ තියුණු අවස්ථාවක

## වන්නිවික්‍රම I මෙහෙයුම :-

මෙම මෙහෙයුම 1991.05.02 දින සිට 1991.05.13 දින දක්වා නාඩිකුලම්, නොච්චිමොටෙයි, ඕමන්තෙයි සහ පනික්කරානි යන ප්‍රදේශවල පැවතුණ අතර, මෙහි අරමුණ වූයේ ත්‍රස්තවාදීන් මෙම ප්‍රදේශ වලින් පලවා හැරීමත් ඔවුන්ගේ කඳවුරු විනාශ කර දැමීමත් ය. ඉතාමත් සාර්ථක අන්දමින් මෙම ක්‍රියාන්විතය අවසන් වූන අතර, ත්‍රස්තවාදීන් විශාල ප්‍රමාණයක් මියගියහ. මෙහි දී සෙසු නිලයින් තිදෙනෙකු මිය ගිය අතර නිලධාරීන් 01 ක් හා සෙනින් 11 දෙනෙකු තුවාල ලැබීය. මෙම මෙහෙයුමේදී ලිපි ලේඛණ තොගයක් සහ ඒකේ 47 අවි 01 ක් අත්අඩංගුවට ගන්නා ලදී.

## වන්නිවික්‍රම II මෙහෙයුම :-

ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල බලකොටුවක් බවට පත්ව තිබූ පන්ඩිවිරිච්චාන් ප්‍රදේශයේ ත්‍රස්තවාදී කඳවුරු හා ත්‍රස්තවාදීන් විනාශ කිරීමේ මහඟු කාර්ය පෙරදැරි කොට ගෙන මෙම මෙහෙයුම 1991.06.14 දින සිට 1991.06.22 දින දක්වා පැවතුනි. මෙම ඒකකයේ ඒ, බී, සී, ඩී කණ්ඩායම් සහභාගී වූ අතර, වව්නියාව, මන්නාරම් මාර්ගයේ කන්දඋඩයාර් පූරවසම්කුලම් ස්ථානයේ දී ත්‍රස්තවාදීන් සමග මුහුණට මුහුණලා කරන ලද සටනකින් පසුව සතුරා පරාජය කරමින් එම ප්‍රදේශයේ බලය සාර්ථක ලෙසින් අත්පත් කර ගන්නා ලදී. මෙම මෙහෙයුමේදී ත්‍රස්තවාදීන් 30 කට අධික සංඛ්‍යාවක් මියගිය අතර, විශාල ප්‍රමාණයක් තුවාල ලැබීය. මෙම බලඇණියේ නිලධාරීන් 01 ක් සහ සෙසු නිලයින් 09 ක් මියගිය අතර, නිලධාරීන් 01 ක් සහ සෙනින් 36 දෙනෙකු තුවාල ලැබීය. තවද ත්‍රස්තවාදීනට අයත් පහත සඳහන් බඩුබාහිරාදිය අත්අඩංගුවට ගන්නා ලදී.

අත්අඩංගුවට ගන්නා ලද බඩුබාහිරාදිය.

| | | |
|---|---|---|
| ඒකේ 47 අවි | - | 01 |
| ගුවන්විදුලි යන්ත්‍ර | - | 01 |
| අරුල් අත් බෝම්බ | - | 03 |

ජොනී බට්ටන් හා පතරොම් තොගයක්

මෙම ක්‍රියාන්විතය අවසන් වෙත්ම ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල ප්‍රහාරයකට ලක්ව තිබූ අලිමංකඩ කඳවුර බේරා ගැනීමේ හා අවට ප්‍රදේශය සතුරාගෙන් මුදා ගැනීමේ ශ්‍රේෂ්ඨ වූ කාර්යධූර කටයුත්තට සහභාගි වීමට සිදු විය.

## බලවේගය I මෙහෙයුම:-

වව්නියාව ප්‍රදේශයේ සිදු කරන ලද ක්‍රියාන්විත වලින් පසු සතුරා අතර පත්වීමට ආසන්නව තිබූ අලිමංකඩ කඳවුර බේරා ගැනීමේ මහඟු කාර්යයට සහභාගි වීමට අප බළඇණියට සිදු වූ අතර, සතුරා ගේ රජදහනක්ව පැවති වෙත්තිලකේනි ප්‍රදේශයට ගොඩබැස එම ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කිරීමේ අභියෝගය අප බළඇණිය විසින් භාරගන්නා ලදී. මේ වන විට අලිමංකඩ කඳවුර බේරා ගැනීම සඳහා පිටතින් හට කණ්ඩායම් පැමිණිය හැකි සියලුම මාර්ගයන් ත්‍රස්තවාදීන් විසින් අවුරා තිබුණි. එසේ වුව ද දුෂ්කර වූ මුහුදු ගමනකින් පසු වෙත්තිලකේනි මුහුදු සීමාව දක්වා නාවුක යාත්‍රා මගින් මෙම බලඇණිය පැමිණෙන අවස්ථාවේ දී මෙහි දී සතුරන් විසින් වෙරලෙහි සිට එල්ල කරන ලද දරුණු ප්‍රහාරය නිසා නාවුක යාත්‍රා (එල්සීඑම්) වෙරලට කිට්ටු නොකරන ලදි. ඉන් පසු ඒකකයේ "ඒ" සහ "බී" කණ්ඩායම් ප්‍රථමවනාවට



8 වන සංවත්සරය වෙන්වෙන් පැවති පෙළපාලිය ඒකක අණදෙන නිලධාරීන් විසින් පරීක්ෂ කරන අවස්ථාවක්

ඓතිහාසික ක්‍රියාන්විතයකට මාර්ගය පාදමින් වෙරලට ගොඩබෑසීමේ කර්තව්‍යය භාර ගෙන කුඩා ඩිංගි බෝට්ටු මගින් කීප වරක් උත්සාහ කිරීමෙන් අනතුරුව දරුණු ප්‍රහාර මධ්‍යයේ අභීතව සටන් කර සතුරන් අභිබවා සාර්ථකව ගොඩ බසින ලදී. මෙම ගොඩබෑසීමේ සාර්ථකත්වය මත එහි ප්‍රශංශාව වෙනත් ඒකක විසින් ලබා ගැනීමට නොයෙකුත් උත්සාහ දරණ ලදී. මෙම සටනින් ත්‍රස්තවාදීන් විශාල ප්‍රමාණයක් මියගිය/තුවාල ලැබූ අතර, බළඇණියේ දෙවන අණදෙන නිළධාරී ඇතුළු නිලධාරීන් දෙදෙනෙක් හා සෙසුනිලයින් 13 දෙනෙකු දිවිපිදූ අතර, නිලධාරී දෙදෙනෙකු හා සෙනින් 51 දෙනෙකු තුවාල ලැබූහ.

1991.07.23 වන දින කයිට්ස් දූපතෙහි ආරක්ෂක රාජකාරීන් භාර ගන්නා ලද අතර, පහත සඳහන් ක්‍රියාන්විතයන්ට සහභාගී වෙමින් සතුරාගේ නිජබිමක්ව පැවති පුන්කුඩතිවු, මන්ඩතිව් දූපත් අත්පත්කර ගන්නා ලදී.

## වාලම්පුරි I ක්‍රියාන්විතයː-

මෙම ක්‍රියාන්විතය 1991.10.17 දින ආරම්භ කරන ලද අතර, 1991.10.19 දින දක්වා පැවතුනි. සාර්ථක අන්දමින් මන්ඩතිවු, පුන්කුඩතිවු දූපත් සතුරාගෙන් මුදගෙන බලය ස්ථාපනය කරන ලදී. මෙහි දී ත්‍රස්තවාදීන්ට විශාල ලෙස අලාභහානි සිදු වූ අතර, වේලනෙයි ප්‍රදේශයේ තිබූ ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල කඳවුරක් විනාශ කරන ලදී. මෙවන් අසීරු ප්‍රදේශයක රාජකාරියේ නියැලී සිටි මෙම බළඇණිය 06 වන සංවත්සරය ද වේලනෙයි මධ්‍ය මහා විද්‍යාල භූමියේ දී උත්කර්ෂවත් අන්දමින් සැමැරිනි.

1992 වර්ෂය ආරම්භ වත්ම අලිමංකඩ ප්‍රදේශයේ රාජකාරීන් භාර ගැනීමට සිදුවිය. මෙහි දී අලුත් අවුරුදු දිනය නිමිති කොට ගෙන සෙබලුන්ගේ චිත්ත ධෛර්යය වර්ධනය කිරීම සහ මානසික සතුට ඇතිකරලීම වස් බක්මහ උළෙලක් හා යුද හමුදා බටහිර තූර්ය වාදක කණ්ඩායමේ මෙහෙයවීමෙන් සංගීත ප්‍රසංගයක් ද පවත්වන ලදී. කාලයාගේ ඇවෑමෙන් නැවතත් පලාලි ප්‍රදේශයට අවතීර්ණ වී කඩ්ඩුවාන් ප්‍රදේශයේ ස්ථානගත විය. මෙහි දී ආරක්ෂක වළල්ල පුළුල් කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන පහත සඳහන් මෙහෙයුම්වලට සහභාගී විය.

## වන්ඩමාරුතය I මෙහෙයුමː-

1992.05.28 දින මෙම ක්‍රියාන්විතය ආරම්භ කරන ලද අතර, මෙහි මූලික පරමාර්ථය වූයේ පලාලි ආරක්ෂක කලාපය තොණ්ඩමනාරු ප්‍රදේශය දක්වා පුළුල් කිරීමයි. මෙම මෙහෙයුම සඳහා මෙම බළඇණියේ "ඩී" කණ්ඩායම සහභාගී වූ අතර, ත්‍රස්තවාදීන් සමග තියුණු සටනකින් පසුව එම ප්‍රදේශය අත්පත් කර ගන්නා ලදී. මෙහි දී එක් සෙනියකු මියගිය අතර, සෙනින් 04 දෙනෙකු තුවාල ලැබිය.

## වන්ඩමාරුතය II මෙහෙයුම :-

1992.05.30 දින කඩ්ඩුවාන් ප්‍රදේශයේ සිට තෙලිප්පලෙයි ප්‍රදේශය දක්වා බලය තහවුරු කිරීම, ත්‍රස්තවාදීන් හා කඳවුරු විනාශ කිරීම අරභයා මෙම ක්‍රියාන්විතය සිදු කරන ලදී. මෙහි දී ත්‍රස්තවාදීන්ට ප්‍රබල අභියෝගයක් එල්ල කරමින් මුහුණට මුහුණලා සටන්කර ත්‍රස්තවාදීන් විශාල ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත් කරන ලදී. මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් දෙදෙනකු සහ සෙසු නිලයින් 12 දෙනෙකු මියගිය අතර, නිලධාරීන් දෙදෙනෙකු සහ සෙනින් 57 දෙනෙකු තුවාල ලැබිය.

## වන්ඩමාරුතය III මෙහෙයුම :-

1992.06.12 දින තෙලිප්පලෙයි ප්‍රදේශයේ සිදුකරන ලද මෙම ක්‍රියාන්විතය සඳහා මෙම ඒකක ඒ, බී සහ ඩී කණ්ඩායම් වල හට පිරිස් සහභාගී වූ අතර, එම ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කිරීම හා ආරක්ෂක වළල්ල පුළුල් කිරීම මෙහි අරමුණ විය. ත්‍රස්තවාදීන් සමග ඇති වූ ප්‍රබල සටනකින් පසු එම ප්‍රදේශයේ බලය තහවුරු කරන ලදී. මෙම සටනින් ත්‍රස්තයන් විශාල ප්‍රමාණයක් තුවාලවීම් හා මියයෑම් වලට ලක්විය. සෙනින් තිදෙනෙකු තුවාල ලැබිය.

## චතුරංග ක්‍රියාන්විතය :-

පලාලි ප්‍රදේශයේ පණ්ඩිතිරිප්පු, සුරුවිලාන්, පෙරියවිලාන් යන ප්‍රදේශවල 1992.09.18 දින දියත් කරන ලද මෙම ක්‍රියාන්විතයේ ප්‍රධාන පරමාර්ථය වූයේ සතුරා සහ කඳවුරු විනාශ කිරීමයි. මෙහි දී ත්‍රස්තවාදීන්ට විශාල ලෙස අලාභ හානි සිදු වූ අතර, ඉතා සාර්ථක අන්දමින් එම ප්‍රදේශයේ ආරක්ෂාව තිර කරන ලදී. මෙම සටනේ දී සෙනින් දෙදෙනෙකු මිය ගිය අතර තිදෙනෙකු තුවාල ලැබිය.

## මොන්සූන් ක්‍රියාන්විතයː-

කදිරවේලි ප්‍රදේශයේ පාල්වේලි වෙරල වෙත ගොඩ බසින ලද ත්‍රස්තවාදීන්ට එරෙහිව මෙම ක්‍රියාන්විතය දියත් කරන ලද අතර, මඩකලපුව ප්‍රදේශයේ ස්ථානගතව සිටි මෙම ඒකක 'ස්වාධීන කණ්ඩායම' එයට සහභාගී විය. විශිෂ්ඨ ප්‍රතිඵල ගෙනදීමට සමත් වූ මෙම ක්‍රියාන්විතයේ දී ප්‍රබල ප්‍රහාරයකට මුහුණ දෙමින් ත්‍රස්තවාදීන් විශාල ප්‍රමාණයක් මරුමුවට පත් කරමින් පහත සඳහන් බඩුබාහිරාදිය අත්අඩංගුවට ගන්නා ලදී. මෙහි දී එක් සෙනියෙකු මියගිය අතර, නිලධාරී 01 ක් සහ සෙසු නිලයින් 08 දෙනෙකු තුවාල ලැබිය.

අත්අඩංගුවට ගන්නා ලද අවි සහ වෙනත් දෑ

| | | |
|---|---|---|
| ටී 56 අවි | - | 01 |
| එම මැගසින් | - | 01 |
| එම පතරොම් | - | 26 |
| එස්එල්ආර් මැ[illegible] | | |
| එම පතරොම් | | |
| පූවස් | | |
| විශාල බෝට්ටු | | |
| කි.ග්‍රෑම් 25 පීඩන බෝම්බ | - | |
| පැට්‍රල් කෑන්. | - | 01 |

වීඩියෝ කැසට්පට, ආහාර ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක්, ලිපිලේඛන හා ඡායාරූප තොගයක්

මෙම මහඟු කාර්යයන් ඉටු කිරීමෙන් පසු නැවත වරක් මන්නාරම් ප්‍රදේශයේ 1992.10.01 දින කරන ලද "ග්‍රීන්බෙල්ට්" ක්‍රියාන්විතයට සහභාගී වීමට අප ඒකකයට ද සිදු විය. නානාට්ටාන් කඳවුරේ සිට මුරුන්කන්, සිලාවතුර දක්වා වූ මෙම දුෂ්කර වූ ගමනේ අරමුණ වූයේ සතුරා හා කඳවුරු විනාශ කිරීමයි. දින 05 ක පමණ අසීරු ගමනකින් නිම වූ මෙම ක්‍රියාන්විතයේ දී ත්‍රස්තවාදීන්ට මහත් තර්ජනයක් ගෙන දෙමින්, ඔවුන් විශාල ප්‍රමාණයක් මරුමුවට පත් කරමින් ඔවුන්ගේ ප්‍රධාන කඳවුරු කීපයක් විනාශ කර මෙම ක්‍රියාන්විතය සාර්ථකව අවසන් කරන ලදී.

මෙම කාල පරිච්ඡේදයේදී ප්‍රබල ප්‍රහාරයකට ලක් වූ වෙත්තිලකේනි කඳවුරේ රාජකාරීන් භාරගැනීමට අප ඒකකයට සිදු විය. දැනට වසර එකහමාරකට ආසන්න කාලයක් මෙම ප්‍රදේශයේ රාජකාරියේ නියැලෙමින් පහත සඳහන් ක්‍රියාන්විතයන්ට සහභාගී විය.

1993.08.27 දින අයියකච්චි හංදියේ සිට මුනාවිල් දක්වා ක්‍රියාන්විතයක්, 7 බලසේනා සමූහය වෙතින් ආරම්භ කරන ලද අතර, මේ සඳහා මෙම බළඇණියේ ඒ සහ සී කණ්ඩායම්වල හට පිරිස් සහභාගී විය. ඉතා සාර්ථක අන්දමින් මෙම මෙහෙයුම නිමා වූ අතර, එක් සෙනියෙකු මෙහි දී තුවාල ලැබිය.

## මුහුදු වාඩිය ක්‍රියාන්විතයː-

මෙම ඒකකයේ මූලික සැලසුමක් අනුව ආරම්භ කරන ලද මෙම මෙහෙයුම කඩ්ඩෙයිකාඩු මුහුදු තීරය ප්‍රදේශයේ සිදු කරන ලදී. මුහුදු තීරය ආශ්‍රිතව පිහිටි ත්‍රස්තවාදීන්ගේ ලැගුම් ස්ථාන කීපයක් හා ඔවුන්ගේ බෝට්ටු තොටුපලක් විනාශ කරන ලද අතර, එක් දිනක් තුල සාර්ථක අන්දමින් මෙම මෙහෙයුම නිමකිරීමට හැකි විය.

## යාල්දේවි ක්‍රියාන්විතය :-

1993.09.28 දින ආරම්භ කරන ලද මේ ක්‍රියාන්විතය සඳහා මෙම ඒකක සියලු හට පිරිස් සහභාගී වූ අතර, මෙම ක්‍රියාන්විතය 1993.10.04 දින දක්වා කිලාලි මුහුදු තීරය ඉලක්කකර සිදු කෙරිණි. ත්‍රස්තවාදීන්ගේ දරුණු ප්‍රහාරයන් ඉදිරියේ අදල ඉලක්කය කරා දින 03 ක් ම ක්‍රියාන්විතයේ ඉදිරියෙන්ම ගමන් කිරීමට මෙම ඒකකයට සිදු විය. මෙහි දී අප ඒකකය සමගින් 6 වන ගැමුණු හේවා බළඇණිය ද ඒ

### එද මෙද තුර අප ආ මග.... .
13 පිටුවෙන්

අසීරු කාර්යය සඳහා එක් විය. මුහුදු තීරය ආසන්නයේ පිහිටි ත්‍රස්තවාදී කඳවුරු ගණනාවක් සහ මුහුදු ප්‍රවාහන කටයුතු සඳහා උපයෝගී කරගන්නා ලද බෝට්ටු විශාල ප්‍රමාණයක් විනාශ කිරීමට අපට හැකිවිය. තව ද ත්‍රස්තවාදීන් විශාල ප්‍රමාණයකට ජීවිත හානි හා බරපතල තුවාල සිදු වී ඇති බවට සනාථ විය.

ත්‍රස්තවාදීන් විසින් පුනරීන් කඳවුරට එල්ල කරන ලද ප්‍රහාරයේ දී කොටුවී සිටින භටපිරිස් වලට සහාය වීම සඳහා මෙම ඒකක අණදෙන නිලධාරී සමග පාලන සී සහ ඩී කණ්ඩායම් වලට අයත් භට පිරිස් එම ප්‍රදේශය වෙත 1993.11.13 වෙනි දින පිටත්ව යන ලදී. මෙහි දී යාල්දේවි ක්‍රියාත්මිතයේ දී අප හා උරෙන් උර ගැටී ක්‍රියා කළ 6 වන ගැමුණු හේවා බළඇණිය ද අප සමග එක් විය. මෙම බළඇණිය සහ අප කණ්ඩායම් දෙක පුනරීන් "කොමා" ස්ථානයට දකුණින් ගොඩ බැස පුනරින්හි කොටුවී සිටි අපේ සහෝදර සෙබලුන් බේරා ගැනීම සඳහා ඉදිරියට ගමන් කරන ලදී. ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල ප්‍රහාරය නිසා තුවාල වූ සෙබලුන් රෝහල් වෙත රැගෙන ඒමට හෙලි යානාවක් ගොඩ බැස්සවීමට නොහැකි තත්වයක්ව පැවති එම ප්‍රදේශය සතුරා පරාජය කරමින් හෙලියානා ගොඩ බැස්සවීමට ඉඩ සලසා දෙමින් තුවාල ලැබූ සෙබලුන් ක්ෂණිකව රෝහල් වෙත රැගෙන යන ලදී. ත්‍රස්තවාදීන් විසින් අත්පත් කර ගන්නා ලද ආරක්ෂක වලල්ල, ඔවුන් පලවා හරිමින් නැවතත් පුළුල් කරන ලදී. මෙහි දී එම කඳවුරේ කොටුවී සිටි අප මව් ඒකකය වන 1 ශ්‍රීලපාහ ඒකක සහෝදර සෙබලුන් බේරා ගැනීමට හැකිවීම අප ලද මහත් භාග්‍යයක් සේ සැලකිය හැක. පුරා දින 11 කට ආසන්න කාලයක් එම කටයුතුවල නිරත වූ භට පිරිස් 1993.11.25 දින නැවත වෙත්තිලකේනි ප්‍රදේශය වෙත පැමිණෙන ලදී. මෙම ප්‍රහාරයේ දී නිලධාරීන් 01 ක් සහ එක් සෙනියෙකු මියගිය අතර, සෙනින් 11 දෙනෙකුට තුවාල සිදුවිය. මෙම නිලධාරී/සෙනින් විශේෂ ක්‍රියාත්මක බණ්ඩයට අයත් වූ අතර, ඔවුන් ප්‍රහාරය සිදුවන අවස්ථාවේ පුනරීන් ප්‍රදේශයේ රාජකාරීන්හි නිරතව සිටිය හ.

මෙ මහඟු කාර්යයන්ට දයක වෙමින් සිටින මෙම බළඇණිය 8 වන සංවත්සරය ද වෙත්තිලකේනි ප්‍රදේශයේ දී සිදුකරලිය. මෙම සංවත්සරය ආගමික වතාවත් වලින්, ක්‍රීඩා තරග, නාට්‍ය සංදර්ශන සහ ශ්‍රී ලංකා යුද හමුද බටහිර තූර්ය වාදක කණ්ඩායම ඉදිරිපත් කරන ලද සංගීත ප්‍රසංගයකින් සමන්විත විය.

ගත වූ වර්ෂ අටක පමණ කාලයක් තුළ වේගවත්ව එහෙත් ක්‍රමානුකූල වූ වර්ධනයක් සෑම අංශයකින්ම ලබා ගැනීමට හැකි වූ බැව් සඳහන් කරන්නේ ඉමහත් සතුටිනි. බළඇණියේ සියලුම නිලයින්ගේ වෘත්තීයමය දැනුම වර්ධනය කිරීම උදෙසා රාජකාරි මාධ්‍යයේ වුවද පුහුණුවීම් කටයුතු නිරතුරුවම පැවැත් වූ අතර, මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1994 පෙබරවාරි මස 02 වෙනි දින, 7 වන බලසේනා සමූහය වෙතින් සංවිධානය කරන ලද අන්තර් ඒකක රණබිම් තරඟාවලියේ දී මෙම ඒකකය විශිෂ්ඨ ලෙස ජයග්‍රහණය කරමින් පහත දක්වා ඇති පදක්කම් ප්‍රමාණය හිමි කරගෙන ඇත.

බළඇණියේ කීර්ති නාමය පැතිරවීම සඳහාම මව් බිමේ සාමය රැකීමේ උදර සටනින් ඒකකයේ නිලධාරීන් 10 ක් හා සෙසු නිලයින් 147ක් තම ජීවිත පරිත්‍යාග කොට අමරණීය විරුවන් ලෙස පසුගිය අට වසර තුළ ලක් මව සිපගත්හ.

| | රන් පදක්කම් | රිදී පදක්කම් | ලෝකඩ පදක්කම් | එකතුව |
|---|---|---|---|---|
| නිලධාරීන් | 06 | 05 | - | 11 |
| සෙසු නිලයින් | 31 | 06 | 02 | 39 |

## දෙපා අහිමිව

තුරුණු වියේ සුපෙන් පැතුමන්
හදට ලං කළ කුමරියේ
තිබද ඔබ මා ළඟින් රැදිලා
සිටි නිසයි මා සැනසුනේ
යුධ බිමේ දී සතුරු පහරින්
අහිමි වූ පමණින් දෙපා
එපා මා අමතක කරන්නට
තිවා මා හද තාරකා

සෙ/301271
**ලාකෝ කුරේ එම්එස්**
8 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම,
පාවක්කුඩිවේන

## ස්වේච්ඡාවෙන්ම දෙන විට රටටම ජීවේ

රටදැය නසන්නට ත්‍රස්තයො නැගී ආවා
බිහිසුනු සටන් රටහැම තැන ඇති වූවා
සාමය රකින්නට රජයට සිදු වූවා
සහයෝගයට අපි රජයට එක්වූවා

හැත්තෑ එකේ සිට අද මේ දක්වාම
සහයෝගයෙන් කරමී සේවය එක සේම
දැන් හරි හුරුයි ගිනි අවියක් අත දැරුම
උරුමයි අපිට අපගේ මවු බිම රැකුම

තිර අදිටනින් අපි හමුදවට ආවේ
කවුරුත් අගයන්නේ අපගේ ගරු සේවේ
ස්වේච්ඡාවෙන්ම දෙනවිට රටටම ජීවේ
හරි ආඩම්බරයි මගෙ මැණිට උනුවේ

යුද්ධය කියන සිව් අකුරෙහි දරුණුකම
වටහා ගනිම් සාමය නිති රකිමි මම
යන අදිටනින් හැම සොහොයුරු සෙබලෙකුම
කටයුතු කරන විට ඔබ වෙනව ද පුදුම

අසරණ සරණ රටවැසියන් බේරන්න
සෙබලුන් සිටියි සිය ජීවිත පුද දුන්න
මොහොතක් ඒ සැමගෙ සේවය අගයන්න
සිහියට ගනිමු මොහොතක් නිහඬව ඉන්න

නිර්මාණය සෙ/00140
**ලාකෝ පියසේන බීඑම්**
3 ශ්‍රී ලංසිරේ

## සිප් සතර ලැබ ගත්තේ

දිළිඳු පැල් පතෙන් සිටු මැදුරකට පිය
ඔසවන්න නොව
කහට උගුරෙන් කුස සනසවමින්
කුප්පි ලාම්පුවේ මලානිකවූ
ආලෝකයෙන්
නිදි දෙව් දූව පරාජය කර සිප් සතර
ලැබ ගත්තේ
පිය සෙනෙහස නොමැති නිවහනෙහි
දුබල මව් සොයුරු සොයුරියන්
කුසගිනි රකුසට
බිලි නොවන්නට පමණි මා....//

සෙ/84863
**ආසෙ සංජීව එල්කේවයි**
"සී" කණ්ඩාම 4 ශ්‍රීලපාහ
මුලතිව්

# අවි ගැටුමේ ආරම්භය

1983 ජූලි මස 23 දින යාපනය ප්‍රදේශයේ තින්නවේලි හිදී යුදහමුද සෙබළුන් 13 දෙනෙකු මරණයට පත් කරමින් සිදු වූ ඛේදවාචකය ලංකාව පුරාම පැතිරී ගියේ ක්ෂණයකිනි. මෙම අවාසනාවන්ත සිද්ධියෙන් තුවාල ලබා ජීවිතය ගලවා ගත හැකි වූයේ දෙදෙනෙකුට පමණි. ඉන් එක් අයෙකු වන ලාංකෝ සුමතිපාල අයිඒ දැනට විශ්‍රාමිකව සිටින අතර, සිද්ධිය වූ දින මාදගල් අනුඛණ්ඩයේ 1 ශ්‍රීලපාහ "සී" කණ්ඩායමේ පෙළ අණදෙන්නකු වශයෙන් කටයුතු කළ කෝප්‍රල් පෙරේරා ආර්ඒයූ වර්තමානයේ 6 ශ්‍රීලපාහ ඒකකයේ රෙ:සැ:මේ වශයෙන් කටයුතු කරනු ලබයි. ලංකා ඉතිහාසයේ බිහිසුණු යුගයක් ආරම්භ වූ මේ මොහොතේ ඔහු ලත් අත්දැකීම් වටා ගෙතුණ සත්‍ය කථා පුවතයි මේ.

එදින කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ වෙඩි ගබඩාවේ මුරයෙන් මිදී, සවස මාදගල් කඳවුර වෙත ගිය කෝප්‍රල් පෙරේරා ඇතුළු 10 දෙනෙකුට එදින සවස යාපනේ ගුරුනගර් කඳවුරෙන් ජංගම මුර සංචාරයකට සහභාගිවීම සඳහා යාමට සූදානම් වන ලෙස අණක් ලැබුනි. ඒ අනුව එදින සවස ඔවුන්ගේ බණ්ඩභාර නිලධාරී වශයෙන් කටයුතු කළ ලුතිනන් වාස් ගුණවර්ධන සමග පලාලි හරහා යාපනය ගුරුනගර් කඳවුර වෙත පැමිණෙන ලදී. මේ සඳහා කුඩා ජීප් රථයක් සහ කැනපි ඉවත් කරන ලද ට්‍රක් රථයක් යොදවා ගන්නා ලදී. සියළුම සෙබළුන් හට රයිපලය සමග පතරොම් 60 ක් සහ අත් බෝම්බ 2 බැගින් නිකුත් කොට තිබුණි. මීට අමතරව බණ්ඩ භාර නිලධාරී සුළු යාන්ත්‍රික තුවක්කුවක් ද (එස්එම්ජී) රැගෙන යන ලදී.

මුර සංචාරය ආරම්භ කිරීමට ප්‍රථම ගුරුනගර් කඳවුර වෙත පැමිණි සියළු සෙබළුන් හට බණ්ඩ භාර නිලධාරී විසින් මුර සංචාරය පිළිබඳ උපදෙස් ලබා ගන්නා තෙක් විනාඩි 15 ක් පමණ කඳවුරේ රැඳී සිටීමට සිදු වූ අතර, බණ්ඩ භාර නිලධාරී පැමිණීමෙන් පසු ඔවුන් තම මුර සංචාරය ආරම්භ කරන ලදී.

මෙහි දී ඉදිරියෙන් ගමන් කළ ජීප් රථයේ ලුතිනන් වාස් ගුණවර්ධන සමග සෙබලුන් දෙදෙනකු ද, පසු පස ට්‍රක් රථයේ සැරයන් වේලකරත්න සමග කෝප්‍රල් පෙරේරා ඇතුළු පිරිස ගමන් කළේ ය. ලැබී ඇති නියෝග අනුව ඔවුන් යාපනය නගරය ඇතුළුව නල්ලූර් කෝවිල සහ අවට අතුරු මාර්ග වල ගමන් කරන්නට විය. මෙම සංචාරයේ දී සෝදිසි කළ යුතු යැයි හැඟෙන ස්ථාන වල නැවතී තමන්ගේ රාජකාරී ඉටු කළ අතර, ඔවුන්ට තවත් පොලිස් මුර සංචාර කීපයක් ද මුණ ගැසුණි. මුර සංචාරය රාත්‍රී 2359 පැයට පමණ නිම කොට ගුරු නගර් කඳවුර වෙත රපෝර්තු කිරීමට තිබු හෙයින් ඔවුන් 2325 පැයට පමණ ගුරුනගර් කඳවුර දෙසට ඒමට ගමන් ආරම්භ කරන ලදී.

ගුරුනගර් කඳවුර වෙත රපෝර්තු කිරීමට බලාපොරොත්තු වූ ඔවුන් ගමන් ගත්තේ යාපනය පලාලි මාර්ගයේ වූ අතර, ට්‍රක් රථයට මී. 65 ක් පමණ ඉදිරියෙන් ජීප් රථය ගමන් කරන ලදී. වාහන පෙළ සුපරීක්ෂාකාරීව ගමන් ගත් අතර, තින්නවේලි ගොවිපල පසුකර මඳ දුරක් ඉදිරියට ඇදෙනවිට, පාර දෙපස විශාල තාප්ප 2 ක් සහ ගෙවල් සහිත ස්ථානයක දී, ඉදිරියෙන් ගමන් කළ ජීප් රථය දෙසින් විශාල පිපිරීම් හඬක් ඇසුණි. ඒ සමගම ට්‍රක් රථයට ද වෙඩි වරුසාවක් පතිත විය. මෙවිට කෝප්‍රල් පෙරේරා ට්‍රක් රථයේ සිටි අනෙකුත් සෙබළුන් හට දෙපසට වෙඩි තබමින් ට්‍රක් රථයෙන් බැසීමට උපදෙස් දෙන ලදී. වෙඩි වැදුණ කීප දෙනෙක් ට්‍රක් රථයේ පිටුපස කෙඳිරිගාමින් සිටි අතර, ත්‍රස්තවාදීන් නොනවත්වාම ඔවුන් වෙත වෙඩි ප්‍රහාර එල්ල කරන ලදි. කෝප්‍රල් පෙරේරා ට්‍රක් රථයෙන් බැස බඩ ගාගෙන ගොස් ට්‍රක් රථයට මුවා වී සතුරන්ට වෙඩි තබන්නට විය. මෙහි දී ත්‍රස්තවාදීන් මාර්ගය දෙපස තාප්ප වලට මුවා වී වෙඩි තබන බව කෝප්‍රල් පෙරේරා විසින් තේරුම් ගන්නා ලදී. මෙවිට දෙවන පෙළ අණදෙන්නා වූ ලාංකෝ සුමතිපාල ද, එහි පැමිණි බැවින් ඔහු හට දකුණු දෙසට වෙඩි තැබීමට අණදී කෝප්‍රල් පෙරේරා වම් පසට වෙඩි තබන්නට විය. ඒ සමගම කෝප්‍රල් පෙරේරා ගේ වම් පාදයට වෙඩි පහරක් වැදුණ අතර, අසල තිබූ සැතපුම් 03 කණුවට මුවා වී සතුරන් දෙසට තව දුරටත් වෙඩි තැබීම සිදු කරන ලදි. මේ අවස්ථාවේදී ලාංකෝ සුමතිපාල ඔහුගේ පපුවට වෙඩි වැදී ඇති බව කෝප්‍රල් පෙරේරා හට පැවසීය. විමසිල්ලෙන් බැලීමේදී ට්‍රක් රථයේ සිටි අනෙක් සියළු දෙනාම මියගොස් හෝ මරණීය තුවාල ලබා සිටි බව දැනගත් කෝප්‍රල් පෙරේරා තුවාල ලබා සිටි ලාංකෝ සුමතිපාලගේ තත්ත්වය ද බරපතල බව වැටහී ගිය හෙයින් ඔහු තාප්පයේ අනෙක් පැත්තට ඔසවා ඔහු ද අනෙක් පැත්තට බැස ඔහු අතට ඔහුගේ අවිය දී තාප්පය අසල සඟවා අසල තිබූ විශාල නිවසක වහලයට නැග ගත්තේ ය. මේ අවස්ථාවේදී කෝප්‍රල් පෙරේරාගේ දකුණු පාදයට ද වෙඩි වැදී ඇති බව තේරුම්ගත් ඔහු තම බූට් ලේස් ගලවා දෙපාවල තුවාල වලට ඉහලින් ගැට ගසාගෙන වහලේ දිගා වී සිටියේ ය. මේ අතර තුරදී ත්‍රස්තවාදීන් ට්‍රක් රථය අසලට පැමිණ තුවාල ලබා සිටි සෙබළුන් හට වෙඩි තබා ආයුධ සියල්ල රැගෙන පලා ගියහ. වෙඩි ශබ්ද ක්‍රම ක්‍රමයෙන් අඩු වූ විට ඔහු නැවතත් වහලයෙන් බැස වාහනය අසලට පිය මැන්නේ තම ගතේ වේදනාවට වඩා සිතේ වේදනාවකිනි. ඔහුට දක්නට සිදුවූයේ තමා සමග පැමිණි කීප දෙනෙකුගේ මළ සිරුරු හා මිය යමින් සිටි සෙබළුන් කීප දෙනෙක් ය. සැරයන් වේලකරත්න වාහනය පිටුපස බරපතල ලෙස තුවාල ලබා සිටි අතර, ලුතිනන් වාස් ගුණවර්ධන යාපනය විශ්වවිද්‍යාලයට යන මාර්ගයේ වැටී සිටින ලදී. තවත් හමුදාභටයෙකු මාර්ගයේ දකුණු පසින් වූ ගුරු පාරේ වැටී සිටිනු දක්නට ලැබිණි.

කෝප්‍රල් පෙරේරා හට දැන් කළ යුතුව තිබුණේ විශාල කාර්ය භාරයකි. හඳතුල නැගුණ වේදනාවත් පෙරදැරි කොට ගනිමින් මෙම සිද්ධිය කඳවුර වෙත දැන්වීම සඳහා සැරයන් වේලකරත්න අත තිබූ ගුවන් විදුලි යන්ත්‍රය සෙවූ නමුත් එය සොයා ගැනීමට නොහැකිවිය. තමන් කළ යුත්තේ කුමක් දැයි මොහොතක් කල්පනා කොට දැඩි අධිෂ්ඨානයකින් යුතුව ඔහු තම තුවක්කුව ද අතැතිව නැවතත් යාපනය බස් ඩිපෝව වෙත සැතපුම් 2ක් පමණ දිවගොස් එහි සිටි මුරකරු බිය ගන්වා බිමට වතුර ස්වල්පයක් ද, ලබාගෙන ඩිපෝවේ ගේට්ටුව අරවා කවුන්ටරයේ තිබූ දුරකථනය වෙත ගොස්, සිදු වූ සිද්ධියත් මේ වන විට තමා සමග සිටි සියළු දෙනා මියගොස් ඇති බවත් යාපන පොලීසිය වෙත දන්වා එය ගුරුනගර් කඳවුර වෙත පවසන ලෙසත් ඉල්ලා සිටින ලදී. ඉන්පසු ඔහු මුරකරු කැඳවා පාර මැද පුටුවක් තබාගෙන වාඩි වී මුරකරුද බිම හිඳුවා ආධාරක භට පිරිස් එනතෙක් බලා සිටියේ ය. ගත වූයේ ටික වේලාවකි. ලුතිනන් වීරසිංහ සමග ආධාරක භට පිරිස බස් ඩිපෝව දෙසට ලඟා විය. කෝප්‍රල් පෙරේරා සියළු විස්තර ඔවුන්ට පවසා මෙතෙක් මිය නොගොසින් සිටින්නේ ලාංකෝ සුමතිපාල පමණක් බවත් දන්වන ලදී. ඉන් පසුව කෝප්‍රල් පෙරේරාගේ අවිය, ආරක්ෂා සංවිධානය කොට ඔවුන් හට භාර දුන් පසුව ඔහුත් ජීප් රථයේ නැගී ලාංකෝ සුමතිපාල සිටි ස්ථානයට ගොස් ඔහුද, ඔසවා ජීප් රථයට දමා පහරට ලක් වූ ස්ථානය සෝදිසි කිරීම සඳහා ඉදිරියට ඇදුණි. ඉන්පසුව එම ස්ථානය හොඳින් පරීක්ෂා කර බලා බරපතල ලෙස තුවාල ලබා සිටි සැරයන් වේලකරත්න සහ ලාංකෝ සුමතිපාල සමග කෝප්‍රල් පෙරේරා යාපනය රෝහලේ රෝහල් ගත කරන ලදී.

1983 ජූලි 24 දින කෝප්‍රල් පෙරේරා හට පියවි සිහිය ලැබුණු අතර ඔහුගේ කකුල සම්පූර්ණයෙන්ම වෙලා තිබුණි. එදිනම මියගොස් සිටි සෙබළුන් 13 දෙනාගේ මළ සිරුරු ගුවන් මගින් කොළඹ බලා ගෙන එන ලද අතර, ඒ සමගම කෝප්‍රල් පෙරේරා හා ලාංකෝ සුමතිපාල කොළඹ මහ රෝහලට ගෙන එන ලදී. මේ වන විට කෝප්‍රල් පෙරේරාගේ ගාල්ලේ නිවසට 2 ගැහේබ වෙතින් ඔහු මියගොස් ඇති බවත්, මළ සිරුර රැගෙන යාම සඳහා යුහමූ වෙත පැමිණෙන ලෙසත් දන්වා ඇත. ඔහුගේ බිරිඳ ඇතුළු පවුලේ සියළු දෙනා මළ සිරුර රැගෙන යාම සඳහා කොළඹට පැමිණියේ මහත් වේදනාවකිනි. එහිදි ඔහුගේ පවුලේ අය හට දැනගන්නට ලැබුනේ ඔහු මියගොස් නැති බවත් තුවාල ලබා රෝහල් ගත වී ඇති බවත් ය. පසුව යුහ රෝහල වෙත ඇතුලත් කරන ලද කෝප්‍රල් පෙරේරා මාසයකින් පමණ සුවය ලබා නැවත යුධපිටියට පිවිසියේ එඩිතර සෙබලෙකුගේ සෙබල විලාශය මුළු මහත් යුද්ධ හමුදාවටම විදහාපාමිණි.

**මේජර් චන්දන විමලසිරි**
ශ්‍රීලපාහ

# දෛවයට අභියෝග
## (1994 ආබාධිත ක්‍රීඩා උළෙල)

අ. ආබාධිත ක්‍රිකට් කණ්ඩායම :

i. 93.02.24 දින ශ්‍රීලංඉ ආබාධිත ක්‍රිකට් කණ්ඩායම සමග ශ්‍රීලංඉ හි දී පැවැති තරඟයෙන් මෙම මූල කණ්ඩායම ජයග්‍රහණය කරන ලදී

ii. 93.04.20 දින රෙමු විපාරෙ ආබාධිත ක්‍රිකට් කණ්ඩායම සමග එම මූලස්ථානයේ පැවැති ක්‍රිකට් තරඟයෙන් රෙමු ශ්‍රීලපාභ කණ්ඩායම ජයග්‍රහණය කරන ලදී.

iii 93.05.22 දින රෙමු ශ්‍රීලංසිරෙ ආබාධිත ක්‍රිකට් කණ්ඩායම සමග එම මූලස්ථානයේ පැවැති ක්‍රිකට් තරඟයෙන් මෙම මූල කණ්ඩායම ජයග්‍රහණය කරන ලදී.

iv. 94.02.09 දින ශ්‍රීලංසිරෙ ආබාධිත ක්‍රිකට් කණ්ඩායම සමග මෙම මූලස්ථානයේ දී පැවැති තරඟයෙන් මෙම මූල කණ්ඩායම ජයග්‍රහණය කරන ලදි.

ආ. 1994 ආබාධිත ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වූ ශ්‍රීලපාභ කණ්ඩායම ලකුණු 48 ක් ලබා තුන්වන ස්ථානය හිමි කර ගත් අතර, එම තරඟාවලියේ දී පහත නම් සඳහන් සෙනින් නම ඉදිරියෙන් දක්වා ඇති ක්‍රීඩා සඳහා ඉදිරිපත් වී ජයග්‍රහණය කර පදක්කම් සහ සහතික ලබාගෙන ඇත.

සෙ/13147 සැරයන් ජයලාල් ආර්එම් - මීටර් 100 - 1 වන ස්ථානය
සෙ/15194 කෝප්‍රල් සිරිසෝම එම්ජීආර් - මීටර් 200 - 1 වන ස්ථානය
මෙම තරගාවලියේ දී පිටියේ ශූරතම ක්‍රීඩකයාට හිමි සම්මානය මොහු විසින් දිනා ගන්නා ලදී.
සෙ/15750 ලාකෝ සම්පත් එච්එස්පී - යගුළිය විසි කිරීම - 2 වන ස්ථානය
සෙ/13663 ලාකෝ ධනපාල කේ - දුර පැනීම - 1 වන ස්ථානය
සෙ/14461 ලාකෝ සිල්වා කේඑල්කේ - පාපැදි තරඟය කිමී20 - 1 වන ස්ථානය
සෙ/301007 සාසෙ රූපසිංහ එස්ජ්ආර්ඩී - පාපැදි තරඟය කිමී20 -3 වන ස්ථානය
සෙ/302330 සාසෙ ප්‍රේමරත්න ආර්ඩීඑස් - යගුලිය විසිකිරීම - 3 වන ස්ථානය
හෙල්ල විසිකිරීම - 3 වන ස්ථානය
සෙ/300281 සාසෙ ලියනගේ ඩීකේඑස්ප් - බර ඉසිලීම -2 වන ස්ථානය
සෙ/15461 ලාකෝ වෛද්‍යරත්න ඩීජී - රෝද්පුටු තරගය - 1 වන ස්ථානය
පිහිනීම - 1 වන ස්ථානය
රෝද පුටු කිමී10.5 - 2 වන ස්ථානය
සෙ/304189 සාසෙ පියදර්ශණ කේවීජී - පිහිනීම නිදහස් ආර - 1 වන ස්ථානය
පිහිනීම ලය ආර - 2 වන ස්ථානය
සෙ/15512 සාසෙ ගුණවර්ධන කේ - වායු රයිපල් තරගය - 1 වන ස්ථානය
සෙ/300145 සාසෙ ශාන්ත ආර්එම්එස් - මීටර් 200 - 1 වන ස්ථානය
සෙ/E00713 සාසෙ ජයරත්න ආර්එම් - දුර පැනීම - 3 වන ස්ථානය
යගුලිය විසිකිරීම - 2 වන ස්ථානය
හෙල්ලවිසිකිරීම - 3 වන ස්ථානය

ඇ. පහත නම් සඳහන් සෙනින් මීටර් 100X4 දිවීමේ තරඟයට කණ්ඩායමක් වශයෙන් ඉදිරිපත් වී 1 වන ස්ථානය හිමි කර ගන්නා දී

සෙ/15194 කෝප්‍රල් සිරිසෝම එම්ජීආර්
සෙ/15750 ලකෝ සම්පත් එච්එස්පී
සෙ/15964 ලාකෝ සේනාරත්න කේජී.
සෙ/301910 සාසෙ රත්නායක ආර්එම්

# මට සැපතක්ය යුද පිටියක මැරෙන එක

එඩිතර සිතක් යුද සෙබලට උරුම ඇත
නිසි එල නියම ලෙස එමගින් ලබනු ඇත
වැදිලා වෙඩි උණ්ඩ කැඩුනත් දෙකට අත
සෙබළා කිසි විටක පස්සට නොඑනු ඇත

ජීවය කියන එක මගෙ පෙරමුණට තියා
යම් ඉදිරියට පන ඇති තුරු ඉවත නොයා
එන වෙඩි උණ්ඩ යුද සෙබළගෙ පපුව සොයා
නොසිතනු මැනවි එය වෙනතක යාවි කියා

අත පය නොකඩ කිරි පොවලා ලොකු කෙරුව
ආදර මව්පියනි බැබලෙන රන් තරුව
යුද්ධය පිළිබඳව ඇත මට හොඳ හුරුව
එන එන සතුරෝ මම තබනෙමි උඩුකුරුව


වෙඩි හඬ ඇසෙන විට බියගුලු නොවුන සිතින්
යම් ඉදිරියට මම රයිපලය රැගෙන අතින්
ඒ ගැන වෙති විස්තර මෙහි මොටද ඉතින්
නිතර සිටින්නේ සෙබලෙකු විලස කෙලින්

ඉපදුනු බිමට කවදත් ගරු කරන්නෙමි
දිවි ඇති තුරා මගෙ මව් බිම රකින්නෙමි
සතුරගෙ උණ්ඩයට මගෙ ළය තියන්නෙමි
සිරිලක් නාමයෙන් රුධිරය හෙලන්නෙමි

හිමි වුන අවිය පණ මෙන් මම ගනිමි රැක
අභලක් නො දෙමි කොටියන් හට අපගේ ලක
රට විනයන්න එන සතුරා ඇසට දැක
මට සැපතක්ය යුද පිටියක මැරෙන එක

**සෙ/84869 ආසෙ ජැන්ස් ජ්එන්**
සී කණ්ඩායම 4 ශ්‍රීලපාභ මූලතිව්

# නොබිඳුනු සිතක්



මහනුවර මහ රෝහලේ දී 1968.06.16 වන දින උපත ලැබූ, සෙ/15194 සැරයන් සිරිසෝම එම්පීආර් මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව මාලගම්මන ග්‍රාම සේවක කොට්ඨාශයේ දිළිඳු පවුලකට අයත් පවුලේ බාලයා විය. තම මව, සොහොයුරෙකු හා සොහොයුරියන් දෙදෙනෙකු පමණක් සිටින අතර, පියා සහ වැඩිමහල් සොහොයුරා කලකට ඉහත දී මියගොස් ඇත.

පාසැල් ජීවිතය ආරම්භ කිරීම සඳහා 1974.01.23 දින නුගවෙල කණිෂ්ඨ විදුහල වෙත ඇතුලත් වී සිව් වන පංතියේ ඉගෙනුම ලබද්දී එම පාසලේ පැවති මළල ක්‍රීඩා සඳහා සහභාගී වීමෙන් ප්‍රථම වරට දක්‍ෂතම ක්‍රීඩකයාට හිමි ශූරතාවය දිනාගෙන ඇත. එතැන් සිට 1986 දක්වා පාසල් අතර, පැවති ක්‍රීඩා සඳහා සහභාගී වී දිගින් දිගටම ප්‍රථම ස්ථානයන් ලබා ජයග්‍රහණය කරමින් පාසල් ජීවිතය ගත කර අපොස (සා/පෙ) දක්වා ඉගෙනුම ලබා ඇත. මොහු පාසල් අවධියේ දී මොහුගේ පියා සමග පාසැල් ගුරුවරයෙකු අතර තිබූ අමනාපයක් හේතුවෙන් එම ගුරුතුමා මොහුගේ පාසැල් ජීවිතයද, අතරමග දී නවතාලීමට උත්සාහ දරා ඇත.

පාසල් දිවිය අවසන් වනවාත් සමගම ක්‍රීඩා කටයුතු වැඩි දියුණු කර ගැනීම සඳහාත්, රටේ පැවති කලබලකාරී තත්ත්වය මත යුද හමුදවට බැඳී සේවය ඉටු කිරිමට තිබූ ආශාව නිසාත්, යුද හමුදවට බැඳීමට තීරණය කර 1987.08.03 දින යුද හමුදවට බැඳී දියතලාව ආධුනික පුහුණු මධ්‍යස්ථානයේදී පැවති ආධුනික පාඨමාලා අංක 83 හදරා 1987.12.12 දින පාඨමාලාව අවසන් වීමෙන් පසු 4 ශ්‍රීලපාහ ඒකකය වෙත ඇතුලත් කර ඇත. පසුව එම ඒකකය සමගින් ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ගෝමරන්කඩවල, කල්ලම්පත්තු, පන්මැදවච්චිය යන ස්ථාන වල ක්‍රියාන්විත රාජකාරි වල යෙදී සිට ඇත. අනතුරුව 6 වන ශ්‍රී ලංකා පාබල හමුදව ස්ථාපනය කිරීමේදී 1990.06.08 දින එම ඒකකය වෙත ඇතුලත් කරනු ලැබ, එම ඒකකය සමගින් අම්පාර ප්‍රදේශයේ මල්වත්ත, බදුලු හත්දිය, නුගේලන්ද, වෙලාවලී, මංගලගම යන ස්ථානවල රාජකාරි කර ඇත.

1988 වසරේ පැවති යුද හමුද ක්‍රීඩා තරහයට සහභාගී වී මීටර් 10,000 තරහයෙන් තෙවන ස්ථානය ලබාගත් අතර, අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා සඳහා 4 ශ්‍රීලපාහ ඒකකය නියෝජනය කරමින් මීටර් 1500 හා මීටර් 800 තරහ වලට සහභාගී වී ප්‍රථම ස්ථානයන් ලබා ගන්නා ලදී.

1991 වර්ෂයේ අලිමංකඩ කඳවුරට එල්ල කළ ත්‍රස්තවාදි ප්‍රහාරය හේතුවෙන් මෙහෙයවන ලද බලවේග 1 ක්‍රියාන්විතයට සහභාගී වීමේ දී ත්‍රස්තවාදීන් විසින් අටවා තිබූ බිම් බෝම්බයක් පෑගීමෙන් 1991.08.23 දින මොහුගේ වම් පාදය අහිමිවිය. මේ අවස්ථාවේ පාදය අහිමි වීම සබැදිව දුකක් ඇතිවූවා මෙන්ම තම අනාගතයේ අස්ථිරත්වය පිළිබඳව බියක් ද ඇතිවිය.

ආබාධිත තත්වයට පත්වීමෙන් පසු ක්‍රීඩා කටයුතු සඳහා අවතීර්ණ වීමට තුඩු දුන් හේතුව වශයෙන් එතෙර පැවති ආබාධිත ක්‍රීඩා උළෙලක් රූපවාහිනිය තුලින් නැරඹීමෙන් පසු එම අවස්ථාවේදී ආබාධිතයින් විසින් පෑ දක්ෂතම් සිත තුළ තබාගෙන එවැනි ක්‍රීඩා කිරීමට තමාට ද, හැකියාවක් ඇති බවට අධිෂ්ඨානය කරගෙන ඔහුට සුපුරුදු මළල ක්‍රීඩාවන්හි පුහුණු වීමේ නිරත විය.

මේ අයුරින් පුරුදු පුහුණු වී ප්‍රථම වරට 1991 වසරේ දි රණවිරු සේවන මගින් පැවැත්වූ ආබාධිත ක්‍රීඩා උළෙලට සහභාගී වී මීටර් 200 ධාවන තරහයෙන් තෙවන ස්ථානය ලබා ගන්නා ලදී. ඉන් පසු 1992 වසරේ දි යුද හමුද ආබාධිත ක්‍රීඩා උළෙලේ ඉසව් 06 කට සහභාගී වී නව ශ්‍රී ලංකා වාර්ථා 03 ක් බිහි කරමින් මීටර් 100, මීටර් 200, මීටර් 400 යන තරහයන් ජයග්‍රහණය කර, අති දක්‍ෂ ක්‍රීඩකයා වීමෙන් එරන්ති අබේගුණසේකර ශූරතා පළිහ හිමි කරගන්නා ලදි. මේ අයුරින් ජයග්‍රහණය සඳහා දැඩි අධිෂ්ඨානයකින් යුතු ව පුහුණුවීම් කටයුතු වල නිරත වන ලද මොහු 1992, 1993 සහ 1994 වර්ෂයන්හිදී යුද හමුද ආබාධිත දක්‍ෂ තම ක්‍රීඩකයා ලෙස ශූරතා පළිහ දිනාගෙන ඇත. 1992 වසරේ දී ශ්‍රී ලංකාවේ වේගවත්ම ආබාධිත ක්‍රීඩකයාට හිමි රන් පදක්කම හිමි කර ගෙන ඇති අතර, 1992, 1993 යන වසර දෙකේ දි සමස්ථ ලංකා ආබාධිත ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ මීටර් 100 ධාවන තරහයේ තත්පර 14.2 වාර්තාව බිඳ හෙලමින් නව ලෝක වාර්ථාවක් තබා මීටර් 100 ධාවන තරහය තත්පර 12 කින් නිම කර නව ශ්‍රී ලංකා වාර්තාවක් පිහිටුවා ඇත.

මේ අයුරින් තරහ වලට සහභාගී වී ජයග්‍රහණ කිරිම හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් ඇතමුන් විසින් මොහුගේ කෘතිම පාදය කඩා මොහු දුර්මුඛ කිරීමට උත්සාහ කොට ඇති අතර, ක්‍රීඩා කටයුතු නතර කරන ලෙසට නොයෙකුත් බලපෑම් පවා එල්ල වී ඇත. මොන අයුරින් බාධක පැමිණියත් නොසැලී අනෙකුත් ආබාධිතයන් හට ආදර්ශයක් වී තම ක්‍රීඩා කටයුතු වල නියැලීමට හේ තවදුරටත් අදිටන් කර ගත්තේ ය.

මොහුගේ මෙම අධිෂ්ඨානය අනෙකුත් ආබාධිතයින්ට මහඟු ආදර්ශයක් මෙන්ම යමෙකු ආබාධිත තත්ත්වයට පත්වීම හේතුවෙන් තම කුසලතාවයන් සම්පූර්ණයෙන් ම අහෝසි නොවන බව මැනවින් පෙන්වා දී ඇත. මොහු ක්‍රීඩා උපදේශකයෙකු වශයෙන් පාඨමාලාවක් හදරා නැතත් ඕනෑම ආබාධිතයෙකු හට ක්‍රීඩා පුහුණු කිරිමේ හැකියාවක් ද මොහු තුල ඇත.

ප්‍රථම වරට ක්‍රීඩා කරන අවස්ථාවන්හි දී කෘතිම පාදය සවිකර ගැනීමටත්, එය සවි කරගෙන ක්‍රීඩා කරන අයුරු කියා දීමටත් උපදේශකයෙකු ලෙස කිසිවෙකු නොසිටි අතර, මොහුගේ උනන්දුවෙන් තම ක්‍රීඩා කුසලතා විදහා දැක්වීමෙන් හමුදවේ උසස් නිලධාරින් සහ වෙනත් පුද්ගලයින්/ආයතන වලින් උදව් ලබා ගෙන ඇත.

නුදුරේ දි විනයේ පැවැත්වීමට නියමිත ආබාධිත ක්‍රීඩා උළෙලෙහි තරහ වැදීම සඳහා නියමිතව සිටින මොහු යුද හමුදවට මෙන්ම මුළු මහත් ලක් දෙරණටම කීර්තියක් අත්කර දීමේ දැඩි අධිෂ්ඨානයකින් යුතුව තම පුහුණුවීම් කටයුතු වල දැනට නිරත වි සිටි. බිඳුණු ගතෙහි වාරුව, නොබිඳුණු සිතකින් සවි කොටගත් රණවිරුවාණනි, ඔබට සද ජය.!

කපිතාන් ආනන්ද දොඩම්වල
ශ්‍රීලපාහ

# රෙජිමේන්තු මංගල හස්තියා



ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු පෙළපාලියේ, රෙජිමේන්තු මංගල හස්ති රාජයා ඉදිරියෙන් ගමන් ගනී. ශ්‍රී ලංකා ඉතිහාසය ආරම්භය සිටම හස්තීන් රාජ්‍ය සේවයේ යෙදී සිටි බව ඉතිහාසය හා ජන කතා අනුව පෙනී යයි. ලාංකික රජවරුන්ගේ සිව්රඟ සේනාවන් ගෙන් එක් සේනාවක් වූයේ ද හස්ති සේනාවයි. රාජ්‍ය සේවය වෙනුවෙන්, සාම සහ යුද කටයුතු උදෙසා අද්විතීය සේවයක් හස්තියාගෙන් සැලසී ඇති අතර, හෙළ දිවයින පර සතුරු ආක්‍රමණ වල දී රට ආරක්‍ෂා කර ගැනීම උදෙසා සටන් පෙරමුණු වල දී පවා හස්තීන් සේවයේ යෙදී සිටි බව ඉතිහාසය අපට පෙන්වා දෙයි. පෙර රජ දවස ශ්‍රී ලංකා ද්වීපය එක් සේසත් කිරීම සඳහාත් අනුරාධපුර යුගයේ දී දුටු ගැමුණු මහ රජතුමාගේත් හමුදාවේ සිටි රාජකීය හස්තියා වන කණ්ඩුල විසින් විජිතපුර සටනේ දී, හී පාරවල් සහ ලෝදිය පාරවල් ද නොතකා විජිතපුර බලකොටුව බිඳ හෙළීම ඉතිහාසයේ අමරණීය අවස්ථාවක් වශයෙන් සිහිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා පාබල හමුදාවේ ආරම්භක අවස්ථාව වන එනම් 1881 මාර්තු මස 13 වන දින සිට නොවැම්බර් 28දින දක්වා වූ කාලය තුළ බලඇණි ලාංඡනය වශයෙන් හස්තියෙකුගේ ලාංඡනය යොදාගෙන ඇති අතර, මෙය ඈත ඉතිහාසයේ පටන් හස්තීන් හා යුද හමුදාව අතර තිබූ සම්බන්ධතාවය පිළිබිඹු කරන්නක් විය හැක. 1950 වසරේ මැයි මස 12 දින 1 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව (නිත්‍ය) ඒකකය ආරම්භ වීමෙන් අනතුරුව ලුතිනන් කර්නල් ඒආර් උඩුගම, එම්බීඊ, ඕබීඊ ශ්‍රීලපාහ ගේ උත්සාහය මත 1 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ මංගල වස්තුව වශයෙන් හස්තියෙකු තෝරාගන්නා ලදී. 1961 ජනවාරි මස 02 වන දින දෙහිවල සත්ව උද්‍යාන අධ්‍යක්‍ෂ ඔබ්රි වයිමන් මහතා විසින් බලඇණියේ අණදෙන නිලධාරී වෙත හස්තියෙකු බාර දෙන ලදුව මෙම හස්තියාව දුටු ගැමුණු මහ රජතුමාගේ රාජකීය මංගල හස්තියාගේ නාමය වූ "කණ්ඩුල" යයි නම් කෙරිණ. එතැන් පටන් කණ්ඩුල I, II, III, සහ IV යනුවෙන් මංගල හස්තීන් පළමුවන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ මංගල හස්තීන් වශයෙන් සේවයේ යොදවාගෙන ඇති අතර, ශ්‍රී ලංකා පාබල හමුදාව ව්‍යාප්ත වීමත් සමගම පාබල හමුදා රෙජිමේන්තුව බිහි වූ අතර, දැනට බලඇණි 10 කින් සමන්විත වී ඇති මෙම රෙජිමේන්තුවේ දැනට V වන කණ්ඩුල නම් වූ මංගල හස්තියා පාබල හමුදා රෙජිමේන්තුව යටතේ සේවයේ යෙදී සිටියි. මෙම කාලය තුළ දී කණ්ඩුල මංගල හස්තියා ශ්‍රී ලංකා ද්වීපයේ ජනාධිපති, අගමැති වෙනුවෙන් පැවැත්වූ සම්මාන පෙළපාලි සඳහා සහභාගී වී ඇති අතර V වන එලිසබත් මහ රාජිණියගේ ශ්‍රී ලංකා සංචාරයේ දී 1 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව පැවැත්වූ රාජකීය සම්මාන පෙළපාලියට ද සහභාගී විය. මේ අනුව කණ්ඩුල, දේශීය මෙන්ම විදේශීය රාජ්‍ය නායකයින්ගේ පවා ගෞරව ආදරයට පාත්‍ර වී ඇත. ශ්‍රී ලංකා පාබල හමුදාවේ උදාර පාඨය වන "සේවය කරමි" යන පාඨය අනුවම සෑම අවස්ථාවක දීම ශතකයකුත් දශකයකටත් අධික කාලයකට සාඩම්බර ඉතිහාසයකට හිමිකම් කියන පාබල රෙජිමේන්තුවේ ගෞරවය තිව්ර කරමින් මෙම මංගල හස්තියා සෑම කල්හිම පබල හමුදාව හා එහි ඉතිහාසයට බැඳී ඇත. ඉදිරියේ දීත් ශ්‍රී ලංකා පාබල හමුදාව සමග කණ්ඩුල හස්තියා අභිමානවත්ව ඉදිරියෙන් ගමන් කරනවා ඇත.

**ලුතිනන් (උපා) කේ. ජී. ආරියරත්න. ශ්‍රීලපාහ**

## රණබිමේ සිට අම්මාට


අම්මගෙ දෙපා වැඳ සමුගත් මොහොත මට
තව දැනෙනවා අද ඊයේ වගේ හෙට
පුහුණුව ලබන්නට ගියේ දිය තලාවට
හය වසරක් ගෙවුනි හමුද සේවයට

සෙබලෙක් ලෙසට මගෙ සේවය සලකන්න
අම්මගේ පිහිට නිරතුරුවම ලැබ දෙන්න
රණබිම මියගියොත් කඳුලක් නොසලන්න
මල්ලිගෙ සුරතෙ මගෙ අවියත් රඳවන්න

පෙර දින වගේ අම්මගෙ තුරුලට යන්න
අම්මගෙ අතින් බත් අහරක් ගෙන කන්න
බුදු පුදසුනට අත අල්ලාගෙන යන්න
එන දින ලඟයි ඇලි කඳුලක් නොසලන්න

**සෙ/15407 ලාකෝ රංජිත් එම්ජීඑස්**
**8 ශ්‍රීලපාහ "සී" කණ්ඩායම, පාවක්කුඩිවේන**

# 7 ශ්‍රීලපාහ - මෙතෙක් ආ මග




ක්‍රි.ව: 1992.09.17 දින සිට බලපවත්වන පරිදි යුද හමුද සංස්ථාව තුල මෙම බලඇණිය නහා සිටුවීම අණ අංක 24/92 හවනි මගින් ප්‍රසිද්ධ කරන ලදි. 1992.11.20 දින පනාගොඩ යුද හමුද විජිතයේ දී නිල වශයෙන් 7 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව ආගමික චනාවත් මධ්‍යයේ යුද හමුද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන්, සුභ මොහොතින් බලඇණි ධජය ඔසවා ඒකකය ආරම්භ කරන ලදි. මෙම ඓතිහාසික අවස්ථාවට එවකට රෙජිමේන්තු ආඥාපති බ්‍රිගේඩියර් යූ ඒ කරුණාරත්න, පීඑස්සී සහ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද සහභාගී විය. ඒකකයේ පළමු වන කොටසේ නියෝග ප්‍රථම අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජී එම් රොක්වුඩ්, පීඑස්සී, ශ්‍රීලපාහ ගේ අත්සනින් යුතුව 1992.11.20 දින නිකුත් කරන ලදි. 1992.11.20 දින නිලධාරීන් 20 කුගෙන් සහ සෙසු නිලයින් 565 ගෙන් යුතුව ඒකක සංස්ථාව ආරම්භ විය.

බලඇණිය ආරම්භ දිනයේ සිට රයිෆල් කණ්ඩායම් 03 ක් සහ "පාලන" කණ්ඩායම සමගින් බලඇණි මූලස්ථානය මණ්ඩතිව් ප්‍රදේශයේ ස්ථානගත වූ අතර, එක් රයිෆල් කණ්ඩායමක් පූනරින් ප්‍රදේශයේ ස්ථාන ගතව සිටින ලදි. බලඇණිය ආරම්භ කිරීමට ප්‍රථම 1,3,4,6 ශ්‍රීලපාහ ඒකකයන් ගේ ස්වාධීන කණ්ඩායම් වශයෙන් නව ඒකකයේ රයිෆල් කණ්ඩායම් මඩකලපුව ප්‍රදේශයේ ක්‍රියාත්විත රාජකාරින්හි යෙදී සිටි අතර, සියලු කණ්ඩායම් මණ්ඩතිව් දූපතට පැමිණි පසු 1992.12.07 දින ඔවුන්නොවුන් අතර, අන්‍යෝන්‍ය සම්බන්ධතාවයන් ඇතිකිරීම සඳහා සුහද තේ පැන් සංග්‍රහයක් පවත්වා ඒකක අණදෙන නිලධාරීන් විසින් මෙම දූපතෙහි බලඇණි මූලස්ථානය ඉදිරිපිට ඒකක ධජය ඔසවා සියලු නිලයින් අමතා දේශණයක් පවත්වන ලදි. මෙම ප්‍රදේශයේ සිටින කාලය තුල ඒකක හට පිරිස් විසින් මැනවින් රාජකාරි ඉටු කල අතර, 1992 දෙසැම්බර් මස 14 වන දින මණ්ඩතිව් දූපත ඉදිරිපසින් ඇති කරතිව් දූපතෙහි පිරා සෙවීමක් කරන ලදි. මෙය ඒකකයේ මංගල ක්‍රියාත්විතයයි. ඒකක පුහුණුවීම් මේ කාලසීමාව තුළ ආරම්භ කරනලදී. ඒකකයට පැවරි තිබූ රාජකාරීන් අනුව බලඇණියක් වශයෙන් පුහුණුවීම් කිරීමට නොහැකිවූවත් පාඨමාලා තුනකින් යුතුව පුහුණුවීම් ආරම්භ කරන ලදී.

1. පාඨමාලා අංක01 - 92.10.15 දින සිට 92.11.08 දින දක්වා
2. පාඨමාලා අංක 02 - 92.11.12 දින සිට 92.11.25 දින දක්වා
3. පාඨමාලා අංක 03 - 92.12.03 දින සිට 92.12.18 දින දක්වා

මෙම පාඨමාලාවන්ට අමතරව නිලධාරීන් සඳහා සෑම සතියකම එක් දිනක් පුහුණුවීම් සඳහා වෙන් කරන ලදි. තව ද මෙම කාලසීමාව තුල රෙජිමූලය, ශ්‍රීලපාහ වෙතින් ඒකකය වෙත





ලබාදුන් ආධුණික සෙනීන් 90 දෙනෙකු සඳහා 1993.03.01 දින සිට 1993.05.23 දින දක්වා ආධුණික පුහුණුවීම් පාඨමාලාවක් මණ්ඩතිව් දූපතේ දි පවත්වන ලදි. මේ අතරතුර 1993.06.23 දින ඒකකයේ සියලුම හට පිරිස් අලිමංකඩ ප්‍රදේශයේ ස්ථානගත විය.

බළඇණි ආරම්භයේ සිට නිලධාරි/ සෙසුනිලයින් 46 දෙනෙකු මෙතෙර පාඨමාලා සඳහා සහභාගී කරවන ලද අතර, එතෙර පාඨමාලා සඳහා මේ දක්වා ඒකකයෙන් නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වී ඇත.

මේ වන විට ඒකකයේ සෙසුනිලයින් හට පහත සඳහන් පරිදි උසස්වීම් ලබා දී ඇත.

| | |
|---|---|
| බනි II සිට බනි I දක්වා | - 02 යි |
| ව/සැරයන් සිට බනි II දක්වා | - 06 යි |
| සැරයන් සිට ව/සැරයන් දක්වා | - 16 යි |
| කෝප්‍රල් සිට සැරයන් දක්වා | - 37 යි |
| ලාකෝ සිට කෝප්‍රල් දක්වා | - 145 යි |
| සාසෙ සිට ලාකෝ දක්වා | - 102 යි |

තව ද ඒකකයේ ප්‍රථම රෙසැමේ වයෙන් කටයුතු කල බනි I එම් කේ මෙන්ඩිස් 1993.02.23 දින සිට ලුතිනන් (උපා) අධිකාරියට පත් කරන ලද අතර, රෙඋපාසැමේ වශයෙන් රාජකාරි කල බනි II දිසානායක එච්එම් යන බළලත් නිලධාරි නුදුරේදී ලුතිනන් (උපා) අධිකාරියට පත් කිරීමට නියමිතව ඇත.

ඒකකය අලිමංකඩ ප්‍රදේශයේ රාජකාරී කරන අතරදීම රෙජිමූලය, ශ්‍රීලපාහ වෙතින් යා කරන ලද ආධූණික සෙනීන් 150 දෙනෙකු සඳහා ආධූණීක පුහුණු පාඨමාලාවක් 93.09.13 දින සිට 93.12.15දින දකවා පවතටන ලදි. එම ආධුණික සෙනීන් මාස 03 ක පමණ පුහුණු කාලයක් නිම කරමින් 1993.12.29 දින අලිමංකඩ කඳවුරේ දී විසිර යන ලදි. විසිර යාමේ පෙළපාලියේ ආචාර්ය ලුතිනන් කර්නල් එම් විජේවික්‍රම ගැහේබ විසින් පිළිගන්නා ලදී. මෙම අවස්ථාවට ශ්‍රීලපාහ තූර්ය වාදක කණ්ඩායම ද සහභාගී විය. ඔවුන්ගේ විසිරයාමෙන් පසු 1993.12.29 දින එම ආධුණික සෙනීන් ගෙන් 119 දෙනෙකු මෙම ඒකකය වෙත ඇතුලත් කරන ලදි.

අලිමංකඩ ප්‍රදේශයේ ඒකකය ස්ථානගතවී සිටිය දී ඒකක හටපිරිස් ක්‍රියාන්විතයන් දෙකකට සහභාගී වන ලදි. 1993.08.27 දින මෙම ප්‍රදේශයේ කරන ලද "ශර්ප දණ්ඩ" ක්‍රියාන්විතය මෙම ඒකකය මූලිකත්වයෙන් සිදු කෙරිණ. 1993.09.28 දින සිට 1993.10.04 දින දක්වා අලිමංකඩ ප්‍රදේශයේ මෙහෙයවන ලද "යාල්දේවි" සංග්‍රාමික මෙහෙයුමට මෙම ඒකකය ප්‍රහාරක බළඇණියක් ලෙස සහභාගී විය. මෙම සංග්‍රාමික මෙහෙයුමේ දී නිලධාරීන්/සෙසු නිලයින් - 54 දෙනෙකු සාමාන්‍ය තුවාල ලැබූ අතර, සෙසු නිලයින් 09 දෙනෙකු මිය යන ලදි.

සුභ සාධක කටයුතු යටතේ යෝජනා ක්‍රම කීපයක් මේ වන විට දියත්කර ඇත.

1. අර්ථසාධක අරමුදලෙහි මුදල් තැන්පත් කිරීමට සෙසු නිලයින් උනන්දු කරවන ලදි.
2. බැංකු ගිණුම් ආරම්භ කිරීමට සෙනීන්හට උපදෙස් දී ඇති අතර බැංකු ගිණුම් සඳහා වැහාදී වලින් මුදල් අඩු කිරීම පිළිබඳව අවබෝධයක් ලබා දෙන ලදී. අනතුරුව අනුරාධපුර ජාතික ඉතිරිකිරීමේ බැංකු නියෝජිතයින් ගෙන්වා මුදල් ඉතිරි කිරීමේ යෝජනාක්‍රමයක් ද සෙනීන්ට ආරම්භ කරන ලදී.
3. යුද හමුදමය සුභසාධක කටයුතු වලට අමතරව ඒකකය වෙතින් පහත සඳහන් සුභ සාධක ක්‍රියා මාර්ගත් මේ වන විට ක්‍රියාත්මක කර ඇත.

**අ. මරණාධාර යෝජනා ක්‍රමය** :- මේ වෙනුවෙන් ඒකකයේ සෙබලුන් සහ ඥතීන් මිය ගිය විට මුදල් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

**සහණාධාර ණය යෝජනා ක්‍රමය:-**

(1) ඒකක සහනාධාර ණය යෝජනාක්‍රමය ආරම්භ කර එම වැඩ පිළිවෙළ යටතේ සහනදායී පොලියක් මත රු. 15,000.00 ක මුදලක් ගෙවීම දැනටමත් ආරම්භ කර ඇත.

(2) ඒකකයේ නිලධාරීන් හට ණය පහසුකම් ලබාදීම සඳහා යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඇති අතර, එම වැඩ පිළිවෙල යටතේ එක් නිළධාරියකුට සහනදායී පොලියක් මත රු. 30,000.00 ක මුදලක් ගෙවීමට දැනටමත් ආරම්භ කර ඇත.

1993 අප්‍රේල් මස බක්මහ උළෙල නිමිත්තෙන් 1993.04.15 දින උත්සවයක් මණ්ඩතිව් කඳවුරේදී 10 වන බලසේනාධිපති බ්ගේඩියර් වී ඒ තිලකරත්න ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය.

මෙම ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරීන් හා නියැලි සිටින මෙම බළඇණියේ පළමුවන සංවත්සරය 1993.11.20 දින අලිමංකඩ කඳවුරේ දී පැවැත්විණ. උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් 7 වන බලසේනාධිපති බ්‍රිගේඩියර් ජීඩබ්ඩබ් පෙරේරා, පීඑස්සී, සහභාගී විය. ඊට අමතරව 3 ශ්‍රීලපාහ 1 ගැහේබ, 7 ශ්‍රීලංසිරේ 4 විපාරෙ අණදෙන නිලධාරීන් සහ සෙසුනිලයින් ද නාවික හමුද නිලධාරීන් සහ සෙසුනිලයින්ද උත්සව අවස්ථාවට සහභාගි විය. හමුද චාරිත්‍රානුකූලව ඒකක අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් පිරිනමනු ලැබූ අතර, අණදෙන නිලධාරී විසින් ඒකක ධජය එසවීමෙන් උත්සවයේ වැඩ කටයුතු ආරම්භ විය. සම්ප්‍රදයික ක්‍රීඩා අංග රැසකින් සහ අන්තර් කණ්ඩායම් අත්පන්දු, පාපන්දු සහ ක්‍රිකට් තරඟාවලියක්, සංගීතමය විවිධ ප්‍රසංගයකින් උත්සවය හැඩ ගැන්විණි. මෙදින සියලුම නිළයින් වෙත දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලද අතර, උත්සවය අවසානයේ තරඟ වලින් ජයගත් ජයග්‍රාහකයින් වෙත ජයසංකේත ප්‍රධානය 7 වන බලසේනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණ.

අලිමංකඩ ආරක්ෂක කලාපයේ රාජකාරීන් කරනු ලබන ඒකකයන් අතර, මනා සම්බන්ධතාවයක් සහ යුධ ශිල්පය ප්‍රගුණ කිරීමේ අදිටනින් 7 වන බලසේනාධිපති

බ්‍රිගේඩියර් ජීඩබ්ඩබ් පෙරේරා, පීඑස්සී ගේ උපදෙස් මත මෙම ප්‍රදේශය ඒකක අණදෙන නිලධාරීන්ගේ සංවිධායකත්වයෙන් අන්තර් ඒකක යුද ශිල්පීය තරගාවලියක් පවත්වන ලදි. මෙම තරඟ 1994.01.28 දින සිට 1994.02.06 දක්වා අලිමංකඩ ආරක්ෂක කලාපයේ දී පැවැත්විය. මෙම තරඟයේ ජයග්‍රාහකයින් හට රන්, රිදී සහ ලෝකඩ පදක්කම් ප්‍රධානය කරන ලද අතර, සමස්ථ තරඟයේ දී පහත සඳහන් පදක්කම් සටහන ඒකකය විසින් ලබා ගන්නා ලදී.

| රන් | රිදී | ලෝකඩ | එකතුව |
|---|---|---|---|
| 21 | 03 | 07 | 31 |

1992.11.20 වන දින නිලධාරීන් 20 දෙනෙකු ගෙන් සහ සෙසු නිලයින් 565 කින් සමන්විතව ආරම්භ වූ නව බලඇණිය මේ දක්වා කාලය තුළ දී සංඛ්‍යා බලයේ වර්ධනය පහත සඳහන් පරිදි වේ.

| | නිලධාරීන් | සෙසු නිලයින් |
|---|---|---|
| අ. බලඇණි අරම්භය | 20 | 565 |
| ආ. සංඛ්‍යා බලයේ වර්ධනය | 06 | 492 |

ඉහත සඳහන් බලඇණි සංඛ්‍යා වර්ධන සටහනට අමතරව අලුතින් පිහිට වන ලද නව ශ්‍රීලපාහ ඒකකයන් වෙත පහත සඳහන් පරිදි නිලධාරී/සෙසුනිලයින් යාකර ඇත.

| | නිලධාරීන් | සෙසුනිලයින් |
|---|---|---|
| අ. රෙජි ආධාරක බලඇණිය ශ්‍රීලපාහ වෙත | 03 | 132 |
| ආ. 10 ශ්‍රීලපාහ වෙත | 03 | 121 |
| | 06 | 253 |

බලඇණියේ ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කළ ලූතිනන් කර්නල් ජී එම් රොක්වුඩ්, පීඑස්සී, ශ්‍රීලපාහ පාකිස්ථානයේ පැවැත්වෙන ජ්‍යෙෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාවට සහභාගීවීමට 94.02.15 දින දිවයිනෙන් බැහැරව ගියෙන් එදින සිට මේජර් කේජ්ඩීජ් කරුණාසේකර, ශ්‍රීලපාහ වැඩ බලන අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කරනු ලබයි.

විරං ජයතු



ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුඹුරුපිටිය වනාන්තරය තුළ පවත්වන්නට යෙදුන වේලුසුමන ක්‍රියාත්විතයේ දී ත්‍රස්තවාදී කඳවුරක් වන "වෙන්ගේ"කඳවුර 1994.02.12 වන දින අල්ලා ගැනීමෙන් පසු 5 වන බලඇණිය, ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් හට පිරිසක් පිරික්සීම් කටයුතුවල නිරතවී සිටීම



ජාත්‍යන්තර ක්‍රීඩා උළෙලක වන පසුගිය සාෆ් ක්‍රීඩා තරගාවලියේ දී උණ්ඩ 60 වායු රයිෆල් වෙඩි තැබීමේ තරඟයේ ලෝකඩ පදක්කම දිනාගත් ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ 5 වන බලඇණිය, ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් කොනොනියෙකු හට අණදෙන නිලධාරී විසින් උපහාර පැවැත්වීම


## සංකල්පනා

සීතල සුලං ගත දවටන තිහඬ රැයේ
මනසින් පමණි මා තවමත් ගෙදර ගියේ
වෙඩි හඬ ලඟ ලඟම ඇසෙනා රුදුරු පැයේ
නෑ පැන යන්නේ යුධ බිම හැර පණට බියේ

**සෙ/302795 සාසෙ ගාමිණී ඒඑච්එම්**
10 ශ්‍රීලපාහ ආධාරක කණ්ඩායම
යුදහමුද කඳවුර මාදගල් පලාලි



ක්‍රියාත්මකයට පෙර උපදෙස් ලබමින....



ලැබූ උපදෙස පිලිවෙලින් පහල නිලයනට.....

උරුමයක් කියන්නට නොමැති
බිම් අඟලක් රැකගන්නට
දිවිපුද කරන
සෙබලුන්
දුප්පතුන්ගේ දහඩිය මහන්සියෙන්
රැස්කරගත්
ඉඩකඩම්
රැකගන්නට වෙහෙසෙයි
ධනවතුන්

**සෙ/11937 සැරයන් ජයන්ත ජේඑස්**
1 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම

## නොසැලෙන්න මල්ලියේ

සිප් සතර හදරා
නැණ පහන දල්වන්න
පෙරුම් පිරුවත් නිබඳ
දයාබර මල්ලියේ
ඒ පැතුම මිලිණවී
දෛවයේ සරදමින්
එසවුණා ඔබෙ දෙපා
කුරිරු වූ යුධ බිමට
ඔබේ සියුමැලි යුගත
රළු බවට පත් වෙලා
සොඳුරු වූ යෞවනය
යුධ බිමේ ගෙවෙනවා
නමුදු දිරි ගත් සිතට
නොසැලෙන්න කිසි විටක
ඔබ වැරෙන් රකින්නේ
ඔබ උපන් දේශයයි
ඔබට හිමි ජාතියයි.

**සෙ/1343 ආසෙ සංජීව එම්පීපීජ්**
"බී" කණ්ඩායම 4 ශ්‍රීලපාහ
මුලතිව්

## සිතට දිරියක්

තල් ගස් සෙවන පෙර පරිදිම හිසට හුරු
ඉන්නේ අම්මේ කඳවුර කට වී උතුරු
දැන ගන්නටම එව්වද ගෙදර තොරතුරු
පාලුව දැනෙන විට මගේ සිත නැවාරු

පුහුණුව සඳහා දහදිය වගුරනවා
සටන්බිමේ දී රුධිරය නොහෙලනවා
ළඟදීම රටට සාමය අපි ගෙනඑනවා
බිහිසුනු සතුරු කැළ ළඟදීම වනසනවා

මුහුණට මුහුණ ලා එන්නේ නැපෙරට
සැඟවී කොටි කරයි තැන තැනනිවට
බියවී කරනයුද්ධය කියා අවසාන කීඅපට
නොබියව හමුද සෙබලුන් යනවාපෙරට

**සෙ/301455 සාසෙ පීරිස් එම්ආර්**
"බී" කණ්ඩායම 4 ශ්‍රීලපාහ
මුලතිව්

# එක් අවුරුදු ඉතිහාසය තුළින්



1993 ජනවාරි මස 05 වෙනි දින හමුද වරියා නියෝග 03/93 මගින් යුද හමුදපති විසින් 1993 ජනවාරි මස 01 වෙන දින සිට 1 වෙනි ආධාරක බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව ආරම්භ කිරිමට අනුමැතිය දෙන ලදී. එම නියෝගය අනුව 1,3,4 සහ 6 ශ්‍රීලපාහ යන ඒකක වලින් සපයන ලද නිලධාරින් 17 ක් සහ සෙසු නිලයින් 561 දෙනෙකුගෙන් සමන්විතව 1993 ජනවාරි මස 16 වෙනි දින පෙලපාලියක් හා චාම් උත්සවයකින් පනාගොඩ රෙජිමේන්තු මූලස්ථානයේ දි ඒකකය ආරම්භ කරන ලදී.

ඒකකය ආරම්භ කිරිමෙන් අණතුරුව නිලධාරීන් හා සෙසු නිලයින් වෙනුවෙන් පුහුණුවීම් කළයුතු බැව් ඉල්ලා සිටිය ද ඒ සඳහා ඉඩ ප්‍රස්ථාවක් නොලබා ඒකකය ආරම්භ කර දින 05 ක් වැනි සුලු කාලසීමාව තුල දි නැගෙනහිර ප්‍රදේශයට මායිම් වන උතුරු ප්‍රදේශයට අයත් වැලිඔය ප්‍රදේශයේ ක්‍රියාන්විත රජකාරින්හි නියැලීමට සිදු විය. මේ අනුව මූලස්ථානය නෙලුම්වැව කඳවුරේ ද "ඒ" කණ්ඩායම සහ "බී" කණ්ඩායම පිළිවෙලින් මුහුදු සීමාවට ආසන්න කොක්කුතුඩා සහ කෝවිල් පොයින්ට් යන ස්ථානවල ද "සී" කණ්ඩායම සහ "ඩී" කණ්ඩායම ජනකපුර දකුණ සහ උතුර යන කඳවුරු වල ද ස්ථානගත වී තම ඒකක පළමු රාජකාරීන් ආරම්භ කරන ලදී.

බළඇණිය ආරම්භයේ දිම 1,3,4 සහ 6, ශ්‍රීලපාහ වෙතින් ලබාදෙන ලද රුපියල් 80,000/= ක මුදල යොදවා 1 ආබ ශ්‍රීලපාහ රෙජිමේන්තු ගිණුම ආරම්භ කරන ලදී.

මෙම කාලසීමාව තුළ එනම් 1993 පෙබරවාරි මස 26 වෙනි දින සිට බලපවත්වන පරිදි යුධ හමුද මූලස්ථානයේ අනුමැතිය ලබා ඒකක නිලධාරි නිවස්නය ආරම්භ කරන ලදි. අදල කාලසීමාව තුළ ඒකකයේ උන්නතිය සඳහා විවිධ කාර්යයන්හි යෙදී සිටිය දී 1993 අප්‍රේල් මස 05 වෙනි දින කොක්කුතුඩා අනුබණ්ඩයේ රාජකාරියේ යෙදී සිටි සෙ/78700 ආසෙ රෝහණ ඩබ්ජ් නමැති අය සර්පයෙකු දෂ්ඨ කිරීමෙන් අනතුරුව මිය යන ලදි. මෙම මරණය ස්වාභාවික හේතූන් මත සිදුවූ පළමුවන මරණය ලෙස ඒකක ඉතිහාසයට එක් වූ අතර කැබිතිගොල්ලැව පොලිස් ස්ථානයේ ආරක්ෂාව සඳහා මෙම ඒකකය වෙතින් යාකර සිටි සෙ/300487 සාසෙ උපුල්ශාන්ත ආර්ජී යන අය එම පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටිය දී ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද ප්‍රහාරයකට ලක්ව මියයාමේ හේතුවෙන් ත්‍රස්තවාදී ප්‍රහාර හේතුකොටගෙන මෙම ඒකකයේ මිය ගිය ප්‍රථම සෙබළා වශයෙන් ඒකක ඉතිහාසයට එක්විය.

මෙම කාලසීමාව තුළ ජනකපුර දකුණ සහ උතුරු ප්‍රදේශයන්හි රාජකාරීන්හි නිරත අයවලුන්ට වනාන්තරයේ සිට ද කොක්කුතුඩා සහ කෝවිල්පොයින්ට් යන අනුබණ්ඩ වෙත මුහුදු සීමාවේ සිට ද ත්‍රස්ථවාදීන් ප්‍රහාර එල්ල කරන ලද අතර මෙම ප්‍රහාර සාර්ථක අන්දමින් මැඩ පැවැත්විමට හට පිරිස් සමත් විය.

අදල කාලසීමාව තුළ සෑම කඳවුරකම සෙබලුන්ගේ සුහසාධනය සඳහා බුදු මැදුරු සකස් කරන ලදී. තව ද 1993 අප්‍රේල් මසට යෙදුණු සිංහල සහ හින්දු අලුත් අවුරුදු වෙනුවෙන් තම නිවෙස්කරා යාමට නොහැකිවූ සෙබලුන්ගේ චිත්ත ධෛර්ය නිසි අයුරු පවත්වාගෙන යාම සඳහා සෑම කඳවුරකම සෙබලුන්ගේ විනෝදය සඳහා සිංහල අලුත් අවුරුදු උත්සව සංවිධානය කරන ලදී.

රාජකාරී කටයුතු වලදී මෙන්ම ඒකක පාලන කටයුතු වෙනුවෙන් මහත් වෙහෙසක් දැරීමට සිදු වූ මෙම කාල සීමාව තුළ මහත් අසිරුකම් මැද්දේ සෙසු නිල උසස් කිරිමේ පරීක්ෂණයක් ද 6 බළසේනා මූලස්ථාන යටතේ ස්ථානගත වී සිටි ඒකක වල නිලධාරීන් හා සෙසු නිලයින් වෙනුවෙන් රාත්‍රී දුර දක්න භාවිතා කිරීම පිළිබඳව පාඨමාලාවක්ද පවත්වන ලදී.

මෙසේ සත්මසක කාලයක් ඉතා දුෂ්කරවූත් ප්‍රසංගනියවූත් සේවයක යෙදී සිටියදී අනපේක්ෂිත අන්දමින් නොසිතූ විරූ මොහොතක ද්‍රවිඩ ත්‍රස්තවාදීන් විසින් ජනකපුර උතුර සහ දකුණ කඳවුරු වෙත එල්ලකරන ලද දරුණු ප්‍රහාරයකින් අප බළඇණියට අයත් සෙබලුන් 20 ක් මියයාමත් 16 දෙනකු අතුරුදහන්විමත් 05 දෙනෙකු ආබාධිත තත්ත්වයට පත් විමත් වූ අතර මෙම සිදුවීම ඒකකය දරුණු පසු බෑමකට ලක්විමට හේතු විය.

එම ප්‍රහාරය හේතුකොට ගෙන මෙම ඒකකයේ ආරම්භයේ සිට දැඩි කැපවීමකින් හා මහත් පරිශ්‍රමයකින් ඒකකය ගොඩනැංවීමේ මහා භාරධූර කායයීයේ යෙදී සිටි මේජර් ජේ එස් මාසක්කාර ශ්‍රීලපාහ, අණදෙන නිලධාරී තනතුරෙන් තාවකාලිකව ඉවත් වූ අතර 1993 සැප්තැම්බර් මස 11 වෙනි දින සිට ඒකක අණදෙන නිලධාරී වශයෙන් මේජර් ඩබ්එම්ආර් විජේසුන්දර, ආර්එස්පී. පීඑස්සී, ශ්‍රීලපාහ පත් කරන ලදි. එම නිලධාරීගේ අණ සහ පාලනය යටතේ ඒකකය මඩකලපුව ප්‍රදේශයට අයත් තික්කොඩේ ශාන්තිමලේ, වවුනතිව්, කරදියපුල්, අයිත්තමලේ, පාවක්කොඩිචේන සහ උන්නච්චි යන ප්‍රදේශයන්හි ස්ථානගත වී ක්‍රියාන්විත රාජකාරීන්හි නිරතවන ලදී.

මෙම කාලසීමාව තුළ මෙම බලඇණියට අයත් ඛණ්ඩ තුනක් විශේෂ ක්‍රියාන්විත ඛණ්ඩ පුහුණුවීම් කටයුතු සඳහා මාදුරුඔය වෙත යාකරන ලදී. එහිදී පාඨමාලාව හදරන ලද මෙම ඛණ්ඩ තුනෙන් එක් ඛණ්ඩයක් ත්‍රස්තවාදීන් මැඩලීමේ කාර්යයන්හි නිරතවීම සඳහා පුනරීන් කඳවුර වෙත යාකර තිබියදී 1993 නොවැම්බර් මස 11 වෙනි දින ත්‍රස්තවාදීන් විසින් එම කඳවුර වෙත ප්‍රහාර එල්ල කරන ලද අවස්ථාවේ සෙබලුන් 05 දෙනෙක් මිය යන ලදී.

මෙම වකවානුව තුළ එනම් 1993 නොවැම්බර් 15 වෙනි දින යුද හමුදා මූලස්ථානය වෙතින් ප්‍රකාශයට පත් කරන ලද විශේෂ හමුදා චරියා නියෝග 50/90 යටතේ 1 වෙනි ආධාරක බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වශයෙන් නම් කර තිබූ මෙම බලඇණිය 8 වැනි බලඇණිය ශ්‍රීලංකා පාබල හමුදාව වශයෙන් නම්කර ශ්‍රී ලංකා පාබල හමුදා පවුලේ ලාබාලම සාමාජිකයා ලෙස ඒකකයේ ස්ථාවරත්වය තහවුරු කරන ලදී.

නැගෙනහිර ප්‍රදේශයට වර්ෂාව අධික වූ මෙම කාලසීමාව තුළ තම කඳවුරු සහ අවට මාර්ග සහ ප්‍රදේශ ජලයෙන් යට වී තිබිය දීත් ඉතා දුෂ්කර හාධක කම්කටොලු මැද්දේ තම රාජකාරීන් නොපිරිහෙලා ඉටු කරමින් ඒකකයේ ස්ථාවරත්වය පිළිබිඹු කරන ලදී. මෙම කාලසීමාව තුළ එනම් 1993 දෙසැම්බර් මස 01 වෙනි දින උන්නච්චි යුද හමුදා අණුඛණ්ඩයේ රාජකාරියේ යෙදී සිටි සෙ/302366 ලා/කෝ දිසානායක ඩීඑම්එස් යන අය, සෙ/302492 සාසෙ වසන්ත කුමාර එච්ඩීඑන් යන අයගේ අවියෙන් නිකුත්වූ වෙඩි උණ්ඩයක් වැදීමේ හේතුවෙන් ඉතා අවාසනාවන්ත අන්දමින් මිය යන ලදී.

1993 දෙසැම්බර් මස 15 වෙනි දින සිට නැවතත් ඒකකයේ ආරම්භක අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කළ මේජර් ජේඑස් මාසක්කාර ශ්‍රීලපාහ, ඒකකයේ අණ සහ පාලනය භාර ගත් අතර මෙම කලසීමාව තුළ නැගෙනහිර ප්‍රදේශයේ පැවැත්වීමට නියමිත පළාත් සභා මැතිවරණය සඳහා සුදුසු වාතාවරණය සකස් කිරීමේ කාර්යය වෙනුවෙන් එක් ප්‍රදේශයක් මෙම ඒකකය වෙත පවරන ලදී. එම කටයුත්ත සාර්ථක අන්දමින් ඉටු කරලීම සඳහා තම ඒකකය වෙත පවරන ලද බල ප්‍රදේශයේ ක්‍රියාන්විතයන් මෙහෙයවා සිවිල් පරිපාලනය නිසි අයුරු පවත්වාගෙන යාමට හැකි අන්දමින් ස්ථාවරත්වය තහවුරු කරන ලදී. මෙසේ කාලය ඉක්මයත්ම ඒකකයේ ප්‍රථම සංවත්සරය සිහිකිරීම 1994 ජනවාරි මස 16 වෙනි දිනට යෙදී තිබුනෙන්, පැවරී ඇති රාජකාරි තත්ත්වය අනුව පනාගොඩ රෙජිමේන්තු මූලස්ථානයේ දී බෝධිපූජාවක් පවත්වා මහා සංඝයා වහන්සේ හට සාංඝික දානය ඇතුලු සංඝගත දක්ෂිණාවක් පිරි නමා ඒකකයේ සේවයේ යෙදී සිටිය දී මියගිය අයවලුන්හට පිංපැමිණවීමත් තුවාල ලද අයවලුන්හට ඉක්මන්සුවය පතාත් සේවයේ යෙදී සිටින්නන් හට ආරක්ෂාවත් ලැබේවායි ප්‍රාර්ථන පූර්වක පිංකමක් පවත්වන ලදී. එම පිංකම සඳහා සියලුම අයවලුන්හට පනාගොඩ රෙජිමේන්තු මූලස්ථානය වෙත යාමට නොහැකි වූ හෙයින් අයිත්තමලේ කඳවුරේ සංගීත සංදර්ශනයක් පවත්වා එම සෙබලුන්ට ප්‍රීතිවීමට අවස්ථාවක් සලසා දෙන ලදී.

1994 මාර්තු මස 01 වෙනි දිනට යෙදී තිබූ නැගෙනහිර පළාතේ පළාත්සභා මැතිවරණය සඳහා මෙම ඒකක බල ප්‍රදේශය හොඳ ස්ථාවරයකට ගෙන එමින් අදාල ඡන්ද කටයුතු ඉතා සාර්ථක අන්දමින් පැවැත්වීමට අවැසි පසුබිම සකස් කරන ලදී. එම කටයුතු නිමාවෙන් පසු නව දුරටත් අප බලඇණිය නැගෙනහිර ප්‍රදේශයේම රැඳී ක්‍රියාන්විත රාජකාරීන්හි නියැලී සිටී.

**නි/61080 කපිතාන් ඩී.හෙට්ටිආරච්චි**
ශ්‍රීලපාහ



1990.06.08 දින 6 ශ්‍රීලපාහ ඒකකය නභා සිටුවීමේදී ප්‍රථම අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් ඩී රත්නසභාපති,ආර්එස්පී ශ්‍රීලපාහ විසින් අත්සන් තබා ඒකකයේ වැඩ භාර ගන්නා ලද අවස්ථාව

# යුද්ධය

අහිමිකලා නුඹ
දයාබර මවුවරුන්ට පුතුන්
අහිමිකලා නුඹ
ආදරැති බිරිඳන්ට සැමියන්
අහිමිකලා පියසෙනෙහස
අහිංසක නොදරුවනට
දහස් ගණන් අහිමිකලා
තරුණ ජීවිත නුඹ
තරුණයන් අසරණ උනා
ආබාධිතයින් ලෙස
එහෙත් මම නුඹට ස්තූති
කරමි
විරැකියාවෙන් පෙලුන
සියදහස් තරුණයන්
රැකියා ලද්දො නුඹ නිසා

**සෙ/301220 ලාකෝ**
**තිලකසිරි ආර්පීඑස්**
1 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම

# 5 (සෙව්) බලඇණිය ජාතික මෙහෙවරට එක්වීය.... මෙසේ....!

1. ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුව, දෙවන ස්වේච්ඡා ඉංජිනේරු රෙජිමේන්තුව සංඥා බලකාය සහ 2 (සෙව්) ශ්‍රීලපාහ එකතුවීමෙන් 1962 අගෝස්තු මස 08 වන දින නව සෙබළුන් 600 කින් යුත් 2 වන (සෙව්) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව තනා සිටුවන ලදී.

2. මෙම ඒකකයේ සෙබළුන් එවකට රටේ පැවති වැඩ වර්ජන හේතුවෙන් එම රාජකාරිවල යොදවන ලදී. ඒ හැර පලාලි ගුවන් තොටුපල සෑදීම සහ 1964 වර්ෂයේ පුත්තලම දුම්රියපලේ සිට එළුවන්කුලම අයිල කන්ද මාර්ගය අලුත් වැඩියා කිරීම සඳහා යොදවන ලදී. තව ද 1971 වර්ෂයේදී දිවයින පුරා පැවති කලබල කාරී තත්ත්වය මැඩලීම සඳහා මෙම ඒකකය සහභාගී වී ඇත.

3. ඉන් අණතුරුව 1980 ජනවාරි මස 28 වෙනි දින සිට බලපාන පරිදි 2 වන (සෙව්) විමර්ශන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය පිහිටුවන ලදී. එහිදීද එම ඒකකයේ නිලධාරී/සෙසුනිලයින් රාජකාරී වශයෙන් සෑම වර්ෂයකම ජාතික නිදහස් උත්සව සඳහා සහභාගී වී ඇත. තව ද එවකට රටේ පැවති කලබල කාරී තත්ත්වය හේතුවෙන් වව්නියාව, මාන්කුලම්, කොකාවිල්, පුල්මුඩේ යන ප්‍රදේශවල ද රාජකාරී කර ඇත.

4. 2 වන (සෙව්) විමර්ශන රෙජිමේන්තුව විසුරුවා හැරීමෙන් අනතුරුව 5 වන (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදව (මෙම ඒකකය) 1987 අගෝස්තු මස 15 වෙනි දින ආරම්භ කරන ලද අතර, ඒකකයේ අණදීම පහත සඳහන් නිලධාරී වෙත ලබා දුනි.

අ. ලුතිනන් කර්නල් එම්. ජේ. අල්විස් (නි/1696) - අණදෙන නිලධාරී

ආ. ඒකකයේ සේවය කළ ජ්‍යෙෂ්ඨම නිලධාරීන් පහත සඳහන් පරිදි වේ.

මේජර් සී ඥානේස්වරම් (නි/1483) - ශ්‍රීලපාහ - මියගිය
මේජර් එම් අයි පෙරේරා (නි/1547) - ශ්‍රීලපාහ -පූ.වෛ.ම - රාගම
මේජර් එස් අයි බී තෙන්නකෝන් (නි/1777) - ශ්‍රීලපාහ - 2 අනි
මේජර් එස් එම් වීරරත්න (නි/1530) - ශ්‍රීලපාහ - විශ්‍රාමික
මේජර් එච් එච් එල් ද සිල්වා (නි/1525) - ශ්‍රීලපාහ - රේඅාස භාර නිලධාරී
කපිතන් එච් එම් ජයසේන (නි/2730) ශ්‍රීලසසබ - විශ්‍රාමික

5. ඒකකය වව්නියාව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක රාජකාරියේ යෙදී සිටියදී එවකට රටේ ජවිපෙ කළබලකාරී තත්ත්වය මත මූලස්ථානය 1989.05.05 වන දින 11 වන බළසේනා මූලස්ථානය යටතේ කෑගල්ල ප්‍රදේශයේ ස්ථාන ගත කරන ලදි

6. 1989.08.15 වන දින ඒකකයේ 2 වන සංවත්සරය ඒකක පසු මූලස්ථානය පල්ලේකැලේ දී පවත්වන ලදී. එහි දී ඒකකයේ නිලධාරී/සෙසු නිලයින්ගේ දෙමාපිය ඥාතීන් කැඳවා දළද මාලිගාවේ දී මල්වතු අස්ගිරි මහානාහිමියන් ඇතුළු සංඝයා වහන්සේලාට අටපිරිකර සහිත සාංඝික දානයක් පූජා කරන ලදී. මෙහි දී රු. 43000/= කට අධික වටිනාකමින් යුතු පිරිසිදු රිදියෙන් නිම කරන ලද පාත්තරයක් හා කැසරෝල් (පලහන) දෙකක් ශ්‍රී දළද මාළිගාවට පූජා කරන ලදී.

7. 1988 වර්ෂයේ සිට මේ දක්වා අන්තර් ඒකක වෙඩි තැබීම් තරඟාවලියේ සියළුම (සෙව්) ඒකකයන් පරදවා බ්‍රිගේඩියර් පානබොක්කේ කුසළානය හා සංග්‍රාමික වෙඩි තැබීම් අභියෝග කුසලානය පිට පිටම දිනා ගන්නා ලදී.

8. ඒකකයට විශාල පාඩුවක්ව පැවති බළඇණි මූලස්ථානයද නව නිලධාරී නිවස්නය සහ බිනි සැරයන් නිවස්නය ද 1990 වර්ෂය අවසානයේදී සාද නිමකර ගන්නා ලදී.

9. උතුරු/නැගෙනහිර නැවත ඇති වූ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් 1990.05.10දින නැවත මෙම ඒකකය 22 බළසේනා මූලස්ථානය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දකුණු කොට්ඨාශ මූලස්ථානය සීනි සංයුක්ත මණ්ඩලයේ ස්ථාන ගත කරන ලදි. අණදෙන නිලධාරී දකොමු භාර නිලධාරී වශයෙන් ද කටයුතු කරන ලදි. මෙහි දි කලින් ස්ථාන ගත කොට තිබූ 4 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව 5 වන (සෙව්) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව විසින් මුද හරින ලදි.

10. මෙම ඒකකයේ 4 වන සංවත්සරය වෙනුවෙන් 1991 අගෝස්තු 14,15 යන දින වලදී පෙර මූලස්ථානය කන්තලේ හිදී මියගිය නිලධාරී සෙසු නිලයින්ගේ දෙමාපිය ඥාතීන් කැඳවා සර්ව රාත්‍රික පිරිත් පිංකමක් පවත්වා අටපිරිකර පූජාවක් පවත්වා සංඝයා වහන්සේලාට දානයක් පිරිනමන ලදී.

11. 22 බළසේනා මූලස්ථානය උපදෙස් පරිදි 1991.10.15 වන දිනසිට මෙම ඒකක පෙර මූලස්ථානය මූතූර් කට්ටපරිච්චාන් හි ස්ථාන ගත කොට නිත්‍ය ඒකකයක්වූ 6 වන විජයබා පාබල රෙජිමේන්තුව මුදවා හරින ලදී. නැවත 1993.06.01 වන දින සිට මෙම ඒකක පෙර මූලස්ථානය නිලාවෙලි හි ස්ථාන ගත කොට 2 වන (සෙව්) ගැමුණු හේවා බළකාය මුදවා හැර මේ දක්වා මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක රාජකාරියේ යෙදී සිටියි.

12. ඒකකයේ 5 වන සංවත්සරය 1992 අගෝස්තු මස 14,15 යන දිනයන් හිදී පසු මූලස්ථානය පල්ලේකැලේ දි මියගිය සියළුම නිලධාරී/සෙසු නිලයින්ගේ දෙමාපිය ඥාතීන් ගෙන්වා ශ්‍රී දළද සමිඳුන් උදෙසා ගිලන් පස බුද්ධ පූජාවක් පවත්වන ලදී. රටේ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සටන්වල දී මියගිය නිලධාරී/සෙසුනිලයින් සිහිවීම පිණිස ස්මාරකයක් පසු මූලයේ ගොඩ නැගීම සඳහා මුල්ගල් තබා ඇත.

13. මෙම ඒකකය ආරම්භ කළ ද සිට මේ දක්වාම රට ජාතිය වෙනුවෙන් උදර සේවයක් කර ජීවිත පරිත්‍යාග කළ සංඛ්‍යාව 1X70 වන අතර, වෙනත් හේතුන් මත ක්‍රියාත්මක ප්‍රදේශවල මියගිය සංඛ්‍යාව 21 දෙනෙකු වේ.

**මේජර් එච්එම්එල් ද සිල්වා**
**ශ්‍රීලපාහ**

| | |
|---|---|
| සතුරන් වෙතින් නැගි කෙද බල | බිඳින්නට |
| උපන් බිමේ උරුමය නිති | රකින්නට |
| මම අද පැමිණ සිටියත් යුද | පෙරමුණට |
| සැම විට සිහි වන්නේ අම්මා ඔබය | මට |

| | |
|---|---|
| බියගුලු නොවී රුපුසෙන් හා සමග | ගැටී |
| මගෙ ගිනි අවිය නිබඳව මා ළඟම | සිටී |
| වනසා ලනු පිණිස මව් බිම නසන | කොටී |
| ඔබ පොඩි පුතුන් සැම විට ඉදිරියෙන් | සිටී |

සෙ/303198
**ලාකෝ ළද්දුවහෙට්ටි ඩීඑස්එන්**
8 ශ්‍රීලපාහ

# 2 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදව - 1993-1994 වර්ෂ ක්‍රියාන්විතයන් පිළිබඳව සමාලෝචනයක්

ශ්‍රී ලංකා යුද හමුදවේ අනෙකුත් සංග්‍රාමික ඒකක මෙන් ම 2(සෙව්) ශ්‍රීලපාහටද 1980 දශකයේ සිට විශේෂයෙන් ම උතුරු නැගෙනහිර බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම්වලට හා දකුණේ බිහි වූ ජවිපෙ ක්‍රියාකාරකම්වලට මුහුණදීම සඳහා නව මුහුණුවරකින් නැගී සිටිය යුතු විය. ඉහළ මූලස්ථානවල අණ පරිදි බළ ඇණිය 80 දශකයේ සිට පළාතෙන් පළාතට ද දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයටද ක්‍රියාන්විත රාජකාරීන් සඳහා යෙද වූ බැවින් බළඇණිය වඩාත් විසිරුණු ස්වභාවයක් දැක්විය. විශේෂයෙන් ම රටේ උද්ගත වූ ත්‍රස්තවාදී කඩාකප්පල්කාරී ක්‍රියාවලියේ දී සිවිල් පාලනය සාමාන්‍ය අන්දමින් පවත්වාගෙන යාම සඳහා නිත්‍ය හමුදව හා ගණපූර්වකව උරෙන් උර ගැටී පොදු සතුරා සමඟ සටන් කිරීමට මෙම දශකයේ දී පටන් සිදුවීම විශේෂ සිද්ධියකි. ඒකකය මෙම තත්වයට මුහුණ දීමත් සමගම විවිධාකාරවූත් සංකීර්ණවූත් යුධමය අතින් ඉතා වැදගත් අත්දැකීම් සම්භාරයක්ම උරුම කරගත් අතර, සාමයට ලැදි මහ ජනතාවගේ සිත් සතන් දිනා ගෙන අපේක්ෂිත අරමුණු කරා ලඟාවීමේ මං පෙතකට සේන්දු වීමට හැකිවීම ආඩම්බරයට කරුණකි.

වර්තමානයේ මෙම බළඇණියේ සාමාජිකයින් සතුරු උපද්‍රවයන්ගේ ද ඒ සඳහා වූ විඩාවෙන් ද ලත් අත්දැකීම් උකහාගෙන මියගිය හා තුවාල ලැබූ සහෝදර සාමාජිකයින්ගෙන් ලත් චිත්ත ධෛර්යය හා නොපසුබස්නා අධිෂ්ඨානයෙන් ද මුවහත්ව ඇත. ජයග්‍රහණයේ දී ඉන් ලත් ආස්වාදයෙන් උදම් ඇණූ අතර, පරාජයන්හි දී එය ප්‍රයෝජනවත් පාඩමක් ලෙස විඳදරා ගත්හ. මේ ආකාරයෙන් මුවහත් වූ බළ ඇණිය 1990 දශකයට පා තැබුවේ පරිනත බවින් යුත් දැනමිත්තකු ලෙසට ය.

1990 ජූනි මාසයේ 16 දින ශ්‍රී ලංකා රජය හා ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය අතර ඇති වූ සාම සාකච්ඡා බිඳ වැටුනි. ඉන්දිය සාම සාධක හමුදව දිවයිනෙන් පිටත්ව ගොස් සිටියහ. සාම සාකච්ඡා බිඳ වැටීමත් සමගම ද්‍රවිඩ බෙදුම්වාදීන් විසින් උතුරු නැගෙනහිර පොලිස් ස්ථානවලට හා ආරක්ෂක හමුදවනට එල්ල කළ ප්‍රහාරවල ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා යුද හමුදවට නැවත උතුරු නැගෙනහිර බලා පිටත්ව ගොස් එහි සාමය රැකීම සඳහා කඳවුරු බැඳීමට සිදු විය. මේ අනුව 2 (සෙව්) ශ්‍රීලපාහ ද 1990 ජූනි මාසයේ 29 වෙනි දින දකුණු පළාතෙන් මිදී මඩකලපුව දිස්ත්‍රික්කයට පැමිණ වාලච්චේන කඩදසි කම්හල් භූමියේ බළඇණි මූලස්ථානය පිහිටුවා ඊට අනුබද්ධව විවිධ අනුඛණ්ඩ පිහිටුවා ස්ථානගත විය.

1990, 1991, 1992, සහ 1993 යන වර්ෂවල දී ඒකකය බෙහෙවින්ම වෙහෙස දැරුවේ බෙදුම් වාදී ත්‍රස්තවාදීන් තම ක්‍රියාන්විත බළ ප්‍රදේශයෙන් අතුගා දැමීමටය. මෙම ක්‍රියාන්විතයන් හිදී සැහෙන ත්‍රස්තවාදීන් ප්‍රමාණයක් විනාශ කර ඔවුන් සතු අවි ආයුධ විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට සමත් විය. මෙම ක්‍රියාන්විතයන්හී දී අදළ වර්ෂ තුළ අප ඒකකයේ නිලධාරීන් 04 ක් හා සෙසු නිලයින් 63 ක් මව්බිම වෙනුවෙන් තම ජීවිතයන් පූදකළ අතර, ඒකකයේ සියළුම සාමාජිකයින් විසින් එම විරුවන් සද අනුස්මරණය කරනු ඇත. සතුරා සොයා ගොස් සතුරා විනාශ කිරීමේ ක්‍රියාන්විතයන්ට අමතරව මෙම වකවානුවේ දී සිවිල් පරිපාලනයට පහසුවන පරිදි ක්‍රියාන්විත බල ප්‍රදේශයේ මහා මාර්ග සෝදිසිය හා ඒවායේ ආරක්ෂාව තහවුරු කිරීමත් ජනාවාස සඳහා ආරක්ෂාව සැපයීමත් වැදගත් ස්ථානවලට ආරක්ෂාව සැපයීමත් කළ යුතු විය.

1993 වර්ෂය වන විට මෙම ඒකකය සතු ක්‍රියාන්විත බල ප්‍රදේශය වූ වාලච්චේන කොට්ඨාශයට අයත්වූ කෝරලේපත්තුව, කෝරලේ පත්තු බටහිර හා කෝරලේ පත්තු උතුර (කොටසක්) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ත්‍රස්තවාදී බලය ශුන්‍ය කිරීමට හැකිවීම ඒකකය ලත් විශාල ජයග්‍රහණයක් බව සාඩම්බරයෙන් සිහිපත් කළ හැක.

1993 වර්ෂයේ මැද භාගය වනවිට ප්‍රදේශයේ ජන ජීවිතය සාමාන්‍ය අතට හැරිණ. රාජ්‍ය ආයතනවල වැඩකටයුතු ද සාමාන්‍ය අතට හැරිණ. ප්‍රදේශයේ ජනතාව එතෙක් ජීවත් වූ අනාථ තත්වයෙන් මිදී තම ගම්බිම් කරා ගොස් නැවත පදිංචි වූ අතර, ඔවුන්නොවුන්ගේ සම්ප්‍රදයික රැකියාවල නිරතවීමට ද හැකිවිය. නව ජනපදද පිහිටවූ අතර, වඩා විශ්වාසදායී මහජන ප්‍රබෝධයක් ද ඇතිවිය.

මෙම වර්ෂයේ දී මෙම ඒකකයේ හටපිරිස් ස්ථානගතව සිටි ආකාරය පහත දැක්වේ.

බළඇණි මූලස්ථානය හා අණ/පාලන කණ්ඩායම

වාලච්චේන කඩදසි කම්හල් භූමිය

"ඒ" කණ්ඩායම
කඹුරුමුල්ල, කිරාන්, කිත්තිඅඩි
"බී" කණ්ඩායම
මාන්කර්නි, කජුවත්ත, ජනකපුර, වැලිඔය
"සී" කණ්ඩායම
කායන්කර්නි, කායන්කර්නි පාලම
"ඩී" කණ්ඩායම
නාවල්අඩි, තයි හංදිය
ආධාරක කණ්ඩායම
කල්මාඩු
ස්වාධීන කණ්ඩායම
කෝපාවේලි, ටැම්පිටිය, කරදියනාරු
පසු මූලය 2(සෙව්) ශ්‍රීලපාහ
කොළඹ

විශේෂයෙන්ම 1993 වන විට වාලච්චේන ප්‍රදේශයේ වෙසෙන ද්‍රවිඩ හා මුස්ලිම් ජනතාව යුද හමුදව කෙරේ ඇති කරගත් විශ්වාසය වඩාත් තහවුරු විය. එබැවින් ත්‍රස්තවාදීන් විෂයයෙහි ද්‍රවිඩ ජනතාව කරන ආධාර කිරීම්, ඔත්තු සැපයීම, නවාතැන් සැපයීම් හා ආහාරපාන සැපයීම් සම්පූර්ණයෙන් ම පාහේ නවතා දමන ලදී. මෙම තත්ත්වය ජනතාව ද්‍රවිඩ බෙදුම්වාදී ත්‍රස්තවාදීන් ප්‍රතික්ෂේප කළ බවට කියා පෑ හොඳම නිදසුන වූ අතර, මෙමගින් ත්‍රස්තවාදීන්ට වැදුනු පහර සුළුපටු නොවේ.

නැගෙනහිර පළාතේ ජන ජීවිතය සාමාන්‍ය තත්වයට පත්වීමත් සමගම 1993 වර්ෂයේ අග භාගයේ දී රජය විසින් නැගෙනහිර පළාතේ ද ප්‍රාදේශීය සභා මැතිවරණය පැවැත්වීමට ආරක්ෂක අංශවල නිර්දේශයෙන් පසුව තීරණය කිරීම ඉතා වැදගත් කරුණක් බව මෙහි ලා සඳහන් කළ හැකිය. මෙයට හේතුව මෙම මැතිවරණය ත්‍රස්තවාදීන්ට රජයෙන් ඉදිරිපත් කළ බලවත්ම අභියෝගයක් වීමය. ප්‍රථම වරට රජය ත්‍රස්තවාදීන්ට එරෙහිව කළ ප්‍රබලම අභියෝගය මෙය බැව් පැහැදිලි කරුණකි. මෙම අභියෝගය ඉදිරියේ නොයෙකුත් කූට උපක්‍රම යෙදූ ත්‍රස්තවාදීන්ට අවසානයේ ජනමතය ඉදිරියේ දණ නැමීමට සිදුවිය.

1994 මාර්තු මාසයේ 01 දින නැගෙනහිර පළාතේ ප්‍රාදේශීය සභා මැතිවරණය සාර්ථක අයුරින් පැවැත්වීමට රජයට හැකිවිය. කිසිදු ත්‍රස්තවාදී ක්‍රියාකාරකමක් වාලච්චේන ක්‍රියාන්විත බල ප්‍රදේශයෙන් වාර්තා නොවීය. මෙය අප ලත් ජයග්‍රහණයක් වශයෙන් ද හුවා දැක්වීම අපගේ චිත්ත ධෛර්යය වඩවන්නට සාධකයක් වූ බැව් සඳහන් කිරීම සාධාරණය.

දැනට බළඇණියට නිලධාරීන් 42 ක් හා සෙසුනිලයින් 1196 ක් ඇතුලත් වන අතර,පෙර නොවූ කිසි කලකට වඩා යුද උපක්‍රම අතින් මුවහත් බවට පත්ව ඇත. පසුගිය කාලපරිච්ඡේද දෙස හැරී බැලීමේ දී උතුරු නැගෙනහිර බෙදුම්වාදී ද්‍රවිඩ ත්‍රස්තවාදීන් සමග එක්

28 පිටුවට

# "මා දුටු ජනකපුර"

තිමක් නැති මේ කුරිරු යුද්ධය උතුරු නැගෙනහිරට පමණක් සීමා වුවක්දැයි කැකෑරෙන හදවත්වලට මහත් කුතුහලයක් වී ඇත. යුද්ධයෙන් මියයන වීර සෙබළ සොයුරන් පිළිබඳ තම දෙමව්පියන්ට මෙන්ම රටටත්, යුද හමුදවටත්, මුළු මහත් ජාතියම වෙනුවෙන් දරාගත නොහැකි පාඩුවක් මෙන්ම දුකක් අතිවන බව අමුතුවෙන් කිව යුතු නොවේ.

යුදබිමේ දී රණවිරුවෙකු මියගිය කළ වඩාත් වේදනාවෙන් කඳුළු සලන්නේ රණවිරුවාගේ දෙමාපියන්, බිරින්දන්, දරුවන්, සොහොයුරු සොහොයුරියන්, පෙම්වතියන් හා නෑ හිතවතුන් බවට සැකයක් නැත. ඔවුන්ගේ වේදනාවන් දැස් වලින් ගලායන කඳුලු ගංගා වලින් නිවී යන්නේ නැත. ඔවුහු එම වේදනාවන් තම ජීවිතාන්තය දක්වා ගෙනයනු ඇත්තාහ. මේ වෙනුවෙන් ඔවුන්ගේ එකකුස උපන් සොහොයුරන් මෙන් දුක්වන වෙනත් අය වේ නම් ඒ එම විරුවා සමග එකට ජීවත් වෙමින්, එකමුතුව යුද වැදුන අනෙක් සෙබළ සොයුරන් බව ඒකාන්ත ය. ඔවුහු බොහෝ විට තම මිතුරා සමග යුදවදින අවස්ථාවේ තම දැස් ඉදිරියේම තුවාල ලබනු, මියයනු දකින වුන් ය. එවැනි සෙබළ සොයුරෙකුට තම මිතුරා වියෝවීම කෙසේ නම් දරා සිටිය හැකි ද, තමන් සමග එකට කුඩාරමේ හෝ බංකරයේ රැය පහන් කලේ මොනතරම් බලාපොරොත්තු හිත රඳවාගෙන ද, හෙට දිනයේ උදවත් සමග නිවාඩුවක් ලැබ දෙමාපියන්, බිරින්දන්, දරුවන්, සොහොයුරන් සොහොයුරියන් හා පෙම්වතියන් බැලීමට යාම අදිටැන් කර සිහින ලොවේ පිවිස සිටිය ද, හෙට දිනක් ගැන කෙසේ නම් සිතිය හැකිද. එකට සිටි තම මිතුරා සතුරාගේ වෙඩි උණ්ඩයට ගොදුරු වුව ද, ජීවත් වන සෙබළ සොයුරන් ගතට දිරි දී, හුදකලාවේ යුද වැදීමට අවිය අතට ගෙන සතුරා මැඩීමේ අභිලාශයෙන් පෙරමුණ ගත යුතුව ඇත.

එදින 1993 ජුලි මස 25 දින අළුයම් කාලය එළඹීමත් සමග, නොවුවිරු අන්දමේ ආන්දෝලනයක් ඇති කරවමින් කඳවුරු ආරක්ෂක වලල්ලට සතර දෙසින් දැඩි ප්‍රහාර එල්ල වන්නට විය. ඊට ප්‍රතිප්‍රහාර එල්ල කරමින් සිටි කඳවුරු ආරක්ෂක මුරයේ යෙදී සිටි හටපිරිස් වලට මා හා අනෙකුත් හට පිරිස් සහය දක්වමින් කඳවුර රැකගැනීමේ ප්‍රයත්නයේ යෙදී සිටියහ. විනාඩි 25 ක පමණ සුළු කාලසීමාවක් තුළ දෙපාර්ශවයේ ම ප්‍රහාර උත්සන්නව පැවතුන ද, අවසානයේ සතුරාගේ වෙඩි බලය හා සතුරු බලය දැඩිව පැවතීම නිසා අප හට පිරිස් ඔවුන්ගේ වේගවත් ප්‍රහාරයට ගොදුරු වන්නට විය. සීමිත වූ පතුරම් අවසන් වීමත් සමග ඉතිරිව සිටි හටපිරිස් පසුබසින්නට විය. ඒ වන විටත් සතුරා හා අප හට පිරිස් හඳුනා ගැනීමට පවා නොහැකි තත්වයේ සිටිය දී ප්‍රදේශයේ සිවිල් ජනතාව ද, හිස් ලූ ලූ අත දුවන්නට විය. අවසානයේ ඉතාමත් අසීරුවෙන් නැවත සංවිධානය කරගත් සුළු හට පිරිසක් සමග වෙඩි තබමින් ඉදිරියට යාම කිරීමට තැත් කළ ද පතුරම් ප්‍රමාණය අනුව එය කිරීම ද, අපහසුවීමෙන් පසු, ජනකපුර මාර්ගයට වම්පසින් රැකසිට පහරදීමේ යෙදී සිටිය දී, අපට පිටුපසින් හා වම්පසින් ප්‍රහාර එල්ල කරමින් සතුරා අපදෙසට පියමන් කරද්දී. නැවත ඉතිරිව සිටි අප හට පිරිස් සී සී කඩ විසිරෙන්නට විය. පසුව මා හා සිටි තවත් දෙදෙනෙකු සමගින් "පපා" මුරපොළ දක්වා ගමන් ගත්තේ සතුරාගේ දැඩි ප්‍රහාරය මැද්දේය. එම මුරපලේ සිටි හටපිරිස් සමග නැවත සංවිධානය වී ප්‍රතිප්‍රහාර දීම සඳහා යාමට සැරසුන ද එම මුරපොලට ඒ වන විටත් මෝටාර් ප්‍රහාර එල්ල වී හට පිරිස් තුවාල ලබා සිටි බැවින් එයද, අඩපන විය. අවසානයේ අප, මූලස්ථානය සම්බන්ධතාවයෙන් යුතුව මෝටර් ඉලක්කපත් ලබා ගතිමි. පහත් වන තුරුම තොර තෝංචියක් නැතිව එල්ල වූ ප්‍රහාරයන් අවසානයේ සතුරා පසුබසින්නට වූයේ පොළවට එළිය වැටීමට ආසන්නයේ ය. ඒ ඔවුන්ට අළුයම් කාලයේ ගුවනින් ලැබුණු ප්‍රතිප්‍රහාර නිසාවෙනි. අමතරව අප මූලස්ථානයේ හටපිරිස් හා ප්‍රහාරක යුධ ටැංකි පැමිණෙන ලදී. ඒ වන විට සතුරා පසුබැස ගොස් අවසන් ය.

සිද්ධියෙන් පසු මා උදයේ පැමිණ සිටි හටපිරිස් සමග කඳවුරට ගොස් මියගිය, අතුරුදහන් හා තුවාල ලැබූවන් පිළිබඳව සොයා බලා කටයුතු කරන්නට විය. සියළුම සිදුවීම් වාර්ථා මූලස්ථානය වෙත දැනුම් දෙන ලදී.

හුදෙක්ම සියල්ල සිදුවී හමාරය. එහෙත් ඒ සඳහා ගතයුතු වෙනත් පියවරක් තිබුනේ ද නැත. මෙවැනි අවස්ථාවකට මුහුණ පෑමට සිදුවේයැයි කියා හෝ මෙවැනි ප්‍රහාරයක් සතුරාගෙන් එල්ල වේය කියා කව්රුන්වත් සිතන්නට නැතුව ඇති. වැඩි වශයෙන්ම ජනකපුර දකුණ කඳවුර මගින් සිදු කෙරෙන්නේ පාලන රාජකාරි පමණකි. ගම්මානය ආරක්ෂා වන පරිද්දෙන් හට පිරිස් ආරක්ෂක කලාපයේ යොදවා තිබුන අතර, ඒ 2 (සෙව්) ශ්‍රීලපාහ හා 1 ශ්‍රීලයුසේබ ඒකක, වලින් ද බණ්ඩ 02 ක් රාජකාරි සඳහා යොදවා තිබුණි. එහෙත් එක මුරපොලක සිට අනෙක් මුරපොල අතර, පරතරය මීටර් 800 ක් පමණ දුර ප්‍රමාණයකින් යුක්තව තිබූ අතර, ප්‍රමාණවත් හටපිරිස් නොමැති බැවින් එසේ රාජකාරියේ යොදවන්නට සිදුවිය. සියළුම පාලන රාජකාරි සිදු කරන ජනකපුර දකුණ කඳවුර පිහිටා තිබුණේ ද නිතර සිවිල් ජනතාව ගැවසෙන ඔවුන්ගේ නිවාස ආසන්නයේ ය.

අප කණ්ඩායම ජනකපුර දකුණ කඳවුරේ රාජකාරි, භාරගැනීමට ප්‍රථම රාජකාරි කලේ කෝවිල්තුඩුව කඳවුර භාරවය. එම කඳවුර පිහිටා තිබුණේ මෙම කඳවුරට උතුරු දෙසිනි. මූලතිව් සිට ත්‍රස්ථවාදි ගමන් මග ඇහිරීම සඳහා මෙම කඳවුර ස්ථාපනය කර තිබුණි. කලපුවෙන් හා කැලෑ ප්‍රදේශයෙන් වටවී තිබූ මෙම පෙදෙස සිවිල් ජනතාවගෙන් ද තොරව තිබුණි. හටපිරිස් ගමනා ගමනයේ දී හා පාලන රාජකාරි ඉටු කිරීමේ දී මහත් දුෂ්කරතා වලට මැදිව, ඒකාකාරීත්වයෙන් යුතුව රාජකාරීන් ඉතාමත් උද්යෝගයකින් ඉටුකරන ලදී. සෙබලුන්ගේ මානසික ඒකාග්‍රතාවය මත අප මූලස්ථානය විසින් 6 බසේමූ උපදෙස් පරිදි හටපිරිස් මාරුවීම 1993.07.09 දින සිදු කරන ලදී. අප කණ්ඩායම එදින සවස් කාලයේ ජනකපුර දකුණ කඳවුර භාරගැනීමේන් පසු පැවරී ඇති රාජකාරි සිදුකළ අතර, කඳවුරේ ආරක්ෂාව සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණ බැවින් ආරක්ෂක කුටි තැනීම සඳහා අවශ්‍ය උපකරණ හා ආරක්ෂක වලල්ල සඳහා අවශ්‍ය උපකරණ මූලස්ථාන අමතා ඉල්ලුම් කල නමුත් මෙම සිද්ධිය වන තෙක් ඒ කිසිවක් අප කඳවුරට නොලැබුණි. එහෙත් අපගේ උත්සාහයෙන් සොයාගන්නා ලද හිස් ගෝනි කීපයක් හා කොටකැලි කීපයක් ආධාර කරගෙන ආරක්ෂක කුටි සාද ගන්නා ලදී. ඊට අමතරව මහවැලි ව්‍යාපෘතිය මගින් ඩෝසර් යොදවා මාර්ග ඉදිකරගත් අතර, ඔවුන්ගේ සහාය ලබාගෙන කඳවුරට නැගෙනහිර දෙසින් තිබූ කැලෑ ප්‍රදේශ තරමක් දුරට අඩුකර ගැනීමට හැකිවිය. මා ඒ සඳහා එම රියදුරන්ට ආහාර හා තේ පැන්වලින් සංග්‍රහ කර එම කටයුතු ඉටු කරගන්නා ලදි. සිවිල් ජනතාව නිතර සැරිසරන ගම්මානයක් සමග කඳවුර පිහිටා තිබුණ බැවින් ඔවුන් කඳවුර භූමිය හරහා නිවෙස් වලට ගමන් කිරීමේ මාර්ග ද අසුරා කඳවුරේ ආරක්ෂාව හා රහස් භාවය රැකෙන අයුරින් කටයුතු කළ නමුදු අවසානයේ එහි පලය කෙබඳු විද,

මෙවැනි ප්‍රතිඵලයක් අප හට අත්වෙතැයි කිව නොහැකි තරම්ය. දෙපිරිස අතර, සුළු කාලයක් හෝ පැවති වෙඩි හුවමාරුවෙන් ජීවිතක්ෂයට හා

තුවාල වීම් එක සමාන අන්දමින් සිදු වී ඇති බවට නිසැකවම මා හට කීමට ඇතත්, වැඩි ප්‍රතිඵල ඔවුන් වෙත අත්පත් කර ගැනීමට යුහුසුළු විය. කඳවුර වෙත නියමාකාරයෙන් ආරක්ෂක බැම්මක් හෝ කම්බි වැටක් නොමැති කම නිසා, සිවිල් ජනතාව හා සමීපයේ කඳවුර පිහිටා තිබුන අතර, මහවැලිය මගින් ඉදිකෙරෙන නව මාර්ග නිසා ඩෝසර් මගින් බිම සකස් කර පස් ගොඩැලි කඳවුරු අවට ගොඩ ගසා තිබීමත්, සතුරාට වැඩි වාසි ගෙන දෙන්නක් විය. ගම්මානයේ ආරක්ෂක වලල්ලට යොදවා තිබූ මුරපොලවල් මීටර් 800 ක පමණ දුර ප්‍රමාණයකින් පිහිටා තිබූ අතර, එම දැඩි පරතරය අතරින් ද සතුරාට ගමන් කිරීමට හැකියාව තිබුනි. තවද ඒ දිනවල දැඩි අඳුරු සහිත ස්වභාවයක් දිස් වූ අතර, එය මැකීමට ආරක්ෂක විදුලි බුබුලක් හෝ කඳවුර සතුව නොතිබුණි.

මෙම කඳවුරේ රාජකාරි භාරගෙන දින 15 ක් වැනි කෙටි කාලසීමාවක තුල මනා අවබෝධයකින් යුතුව රාජකාරි ඉටු කිරීමට වගබලා ගත්තේ ද කලින් සිටි කෝවිල්තුඩුව කඳවුරට වඩා හාත්පසින් ම වෙනස් ස්වභායක් දිස් වූ නිසාවෙනි. මෙම ප්‍රහාරයෙන් සෙබළුන් ජීවිතක්ෂයට හා තුවාල වීම් වලට ලක්වීම නිසා සහෝදර අන් සෙබලුන්ගේ චිත්ත ධෛර්යය හා මානසිකත්වය පහත වැටී තිබුණ ද, මා ආරම්භයේ සඳහන් කළ පරිද්දෙන් යුතුව සෑම සෙබළෙක්ම කටයුතු කළ යුතුව ඇත. වියෝ වූ සහෝදර සෙබළ කැල නාමයෙන් ගතට දිරිය ගෙන සතුරා මැඩීමේ අභිලාෂය පෙරදැරි කරගෙන පෙරමුණ ගත යුත්තේ අනාගත හෙට දවසේත් ලක්වැසි සැම මේ මිහිතලයේම ඉපිද මියයන මොහොත දක්වා නිදහස්ව සාමයෙන් සමගියෙන් ජීවත්විය යුතුය යන අදහස පෙරදැරි කරගෙන බවය.

## ශ්‍රීලංකා පාබල හමුදව.....

*26 පිටුවෙන්*

පසෙකින් ද දකුණේ බිහිවූ ජනතා විමුක්ති පෙරමුණේ භීෂණ ක්‍රියාකාරකම්වලට තවත් අතකින් ද එදිරිව සටන් කිරීමේ දී සතුරන් භාවිතා කළ එකිනෙකට වෙනස් යුධ උපායන් මැඩ පැවැත්වීම සඳහා එම උපාය මාර්ගවලට අනුරූපවීමට බළ ඇණියට සිදුවිය. මෙයින් ලත් අත්දැකීම් හා පළපුරුද්ද නිසා ඒකකයේ සාමාජිකයින්ගේ බලාපොරොත්තු වූ ක්‍රියාත්මක හැකියා මට්ටම එම අන්දමින් ම පවත්වා ගැනීමට හැකිවිය. යුද්ධයේ බරපතලකමත්, භයානක කමත් සටනේ දී මියගිය හා තුවාල ලැබුවන් නිසා හෝ ඔවුන්ගේ චිත්ත ධෛර්යය ක්ෂයවීමක් හෝ ඉවසීමේ ශක්තිය හීනවීමක් සිදු නොවිය. ඔවුනට පැවරුණු කාර්යයන් පිළිබඳ වූ වගකීම හැම දෙනා ගේ හදවත තුලට කාවැදී ඇති අතර, උදවන සෑම දිනයකදීම එල්ලවන සෑම අභියෝගයකටම සාර්ථකව මුහුණදීමට සියල්ල සැදී පැහැදී සිටින බවට පසක්වීම ප්‍රීතියට කරුණකි.

**ලුතිනන් කර්නල් ජීපීඩී එදිරිසූරිය**
**කේඑස්වී. ශ්‍රීලපාහ**
අණදෙන නිලධාරී 2(සේවේ) ශ්‍රීලපාහ විසිනි

# ශ්‍රීලපාහ රෙජිමේන්තුවට නව ඒකකයක් එක්වූ වගයි

1993 නොවැම්බර් මස 16 දින එළඹුණ සුභ මොහොතින් 9 (ස්වේ) ශ්‍රීලපාහ ඒකකය මයිලඩි ප්‍රදේශයේ සිය ඒකක මූලස්ථානය ඉතාමත් චාම් අයුරින් විවෘත කරන ලදී.

පුහුණු මධ්‍යස්ථානවල මූලික පුහුණුවෙන් පසු යාපනය අර්ධ ද්වීපයේ නිත්‍ය හමුද ඒකක වලට යා කර සිටි ආධුනික සෙබලු 585 ක් හා ඒකක වලින් ලද නිලධාරීන් 14 ක් හා කොනොතින් 119 කින් ඒකකය සමන්විත වේ.

ස්වේච්ඡා බල සේනා මූලස්ථානය මගින් අණදෙන නිලධාරී වශයෙන් මේජර, ජේ බී ගල්ගමුව (5ශ්‍රීලංසිරෙ) පත්කරන ලද අතර ඉතිරි නිලධාරී මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. | මේජර් ඩබ්ඩීඑල්පී වික්‍රමසිංහ | 2(ස්වේ) ශ්‍රීලයුසේබ |
| 2. | කපිතාන් කේඑල්ශූ ගුණසිංහ | 3(ස්වේ) ගැහේබ |
| 3. | කපිතාන් එන්එස්එල්බී කිරිඇල්ල | 3(ස්වේ) ශ්‍රීලංසිරෙ |
| 4. | කපිතාන් ජේඑස්ශූ කටුගම්පල | 2(ස්වේ) ගරෙ |
| 5. | කපිතාන් සීබී කොහොන | ශ්‍රීලයුපුබ (ස්වේ) |
| 6. | කපිතාන් පීආර්එම් සෙනෙවිරත්න | 2(ස්වේ) ශ්‍රීලංසිරෙ |
| 7. | ලූතිනන් එල්පීකේ සමරසිංහ | 3(ස්වේ) ගැහේබ |
| 8. | ලූතිනන් ජීවීජී චන්ද්‍රසෝම | 5(ස්වේ) ශ්‍රීලංසිරෙ |
| 9. | 2/ලූති පීඑල්ජී කිත්සිරි | 2(ස්වේ) ගැහේබ |
| 10. | 2/ලූති ඩබ්ලිව්යිකේ වීරසිංහ | 2(ස්වේ) විපාරෙ |
| 11. | 2/ලූති ඩීසීකේඩබ් රණසිංහ | 5(ස්වේ) ගරෙ |
| 12. | 2/ලූති එස් ලියනගේ | 2(ස්වේ) ශ්‍රීලයුසේබ |
| 13. | 2/ලූති ඩබ්ඩීආර් ගුණසේකර | ශ්‍රීලයුපුබ (ස්වේ) |
| 14. | රෙ.සැ.මේ, ආර්පී නිව්ටන් | 5(ස්වේ) ශ්‍රීලපාහ. |

ආරම්භයේ දීම නිත්‍ය හමුද ඒකක වලට අනුයුක්තව මාදගල් -තෙලිප්පලේ - වාසවිලාන් - ඉලෙයිකාඩු හා කයිට්ස් හි රාජකාරි කලත් 1993 ඔක්තෝබර් 28 දින "ඒ" කණ්ඩායමත් 1994 මාර්තු මස 01 දින "සී" කණ්ඩායමත් කණ්ඩායම් ලෙස ස්වාධීනව කටයුතු කිරීමේ අත්‍යවශ්‍ය කාර්යය ආරම්භ කරන ලදී.

හ.ව.නි 04/94 ට අනුව ස්වේච්ඡා බල සේනාවේ ඒකකයක් වශයෙන් නම් කොට විනය හා ක්‍රියාත්මක කටයුතු සම්බන්ධයෙන් 21 බලසේනා මූලස්ථානය යටතට පත් කරන ලදී. බළ ඇණි දිනය නොවැම්බර් මස 01 දින ලෙස පත්වුවද, මූලස්ථානය ආරම්භ කල දිනය වන නොවැම්බර් 18 දින බළ ඇණි දිනය වශයෙන් ලබා දෙන ලෙස ඉල්ලීමක් කොට ඇත.

ක්‍රියාත්මක වශයෙන් මූලස්ථාන හා සෙනින් ස්ථානගත වීම අනුව, ඉදුරාම අප ඒකකය 9 බලසේනා මූලස්ථානය යටතේ ද, එක් කණ්ඩායමක් අණදෙන නිළධාරී හට පිරිස් (කයිට්ස්) යටතට ද පත් කොට ඇත.

ඒකකය ගොඩනැංවීමේ ලා 21 බලසේනා මූලස්ථානය, ස්වේච්ඡා බලසේනා මූලස්ථානය හා නිත්‍ය ඒකක වලින් ලද සහාය විශේෂයෙන් සඳහන් කළ යුතු අතර, නිලධාරීන් හා කොනොතින් එවීමෙන් බොහෝ ඒකක වලින් දක්වන ලද ප්‍රතිචාරය අගය කොට සැලකිය යුතු වේ.

නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ වුවද, ඉදිරියට පා තබන මෙම ඒකකය 9 බලසේනා මූලස්ථානය යටතේ තිබෙන එකම ස්වේච්ඡා ඒකකය බව ආඩම්බරයෙන් සිහිපත් කළ යුතු අතර, ප්‍රෞඪ ඉතිහාසයක් ඇති රෙජිමේන්තුවක සාමාජිකයන් වශයෙන් තීරණාත්මක ප්‍රදේශයක තීරණාත්මක අවස්ථාවක සේවය කිරීම වරප්‍රසාදයක් ලෙස සැලකිය හැකිය.

# විරුවාණෙනි ඔබට...



රැඳි අවිය තම අතෙහි...
ඇති එඩිය සිතතුලය
හමන සුලඟ දැවටී ගතෙහි...
ගෙන දෙන්නේ සිසිලක්මය

විරුවාණෙනි ඔබ නිරතුරු....
විඳිනා දුක් අපමණක්ය
සොබා දහම වුවත් ඔබට....
අද එදිරිව ඇති සෙයක් දැයි!!!!

2/ ලුතිනන් ඩීබීපීකේ දයාරත්න,
ශ්‍රීලපාහ



යෙදුණු සුභ නැකතින් ඒකක අණදෙන නිලධාරී විසින් 6 ශ්‍රිලපාහ ඒකක ධජය එසවීම

## "මිරිඟුවක් විය දිවිය"

සිතලා අනාගත දිවියක්
ගියා බලන්නට මනාලියක්
දුප්පත්ය ඇය
සුරූපීයි ඇය
අහිංසකයි ඇය
මම එයට කැමති විය
ඇයත් කැමති විය මෙමට
එනමුත් ඇයගේ දෙමාපියන්
අකැමති විය මෙමට
මන්ද යත්
ඌ හෙයින් මා
පාබල සෙබලෙකු

සෙ/13969 සාසෙ කටුගම්පල
ඩබ්එච්එල්
1 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම



යුද සමයේ හා ඊට පෙර පටන් පැවැති ලංකා පාබල හමුද රෙජිමේන්තු සමයේ සිටම පැවතගෙන ආ සම්ප්‍රදයයන් හා චාරිත්‍ර විධි උතුම් කොට සලකන කල 1949 දී ශ්‍රී ලංකා යුධ හමුදව පිහිට වූ ද පටන් ම එහි පැරණිම ඒකකයක් වූ වර්තමාන 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවට, රෙජිමේන්තුවේ උසස් සම්ප්‍රදයයන් හා චාරිත්‍ර විදි විදහා දක්වන ඓතිහාසික වටිනාකමක් ඇති භාණ්ඩ ප්‍රදර්ශණය කළ හැකි සුදුසු චිරස්ථායී ස්ථානයක අවශ්‍යතාවය දැනෙන්නට විය.

මෙම කරුණු පෙරදැරිව එවකට 1 ශ්‍රීලපාහ හිටපු අණදෙන නිලධාරියෙකු වූ බ්‍රිගේඩියර් එච් වී අතුකෝරාලේ විඑස්වී, පීඑස්සී, ප්‍රධානත්වයෙන් කෞතුකාගාරයක් ගොඩ නැගූ අතර එය ශ්‍රී ලංකා යුධ හමුදවේ මාණ්ඩලික ප්‍රධානව සිටි මෙම ඒකකයේ හිටපු අණදෙන නිලධාරියෙකු වූ බ්‍රිගේඩියර් එම්ජී ජයවීර විසින් 1974 ජනවාරි මස 30 වන දින දී උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

1954 අප්‍රේල් මස 21 වන දින දී දෙවෙනි එලිසබෙත් මහා රාජිණිය විසින් බළඇණියට ප්‍රධානය කරන ලද රාජිණී වර්ණ හා වර්ණ ධජ මෙම කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

මෙයට අමතරව නිල ඇඳුම්, නිල ලාංජන, පදක්කම්, හිස් වැසුම් ලාංඡණ, අවි ආයුධ, ඇඳුම් සහ උපකරණ, ස්ථාවර නියෝග, වටිනා ලියකියවිලි සහ 1881 දී තරම් ගන්නා ලද ඡායාරූප ද එහි තැන්පත් කර ඇත. 1971 වර්ෂයේ ත්‍රස්තවාදී කලබල පැවැති සමයේ අත්පත් කර ගන්නා ලද අවි ආයුධ, පතරොම් හා ලියකියවිලි ද මෙම කෞතුකාගාරයේ ප්‍රදර්ශණයට තබා ඇත.

අපගේ අයිරිමත් යොවුන් විය
පාලු කතරකට තනි වී
ගෙවෙන අවිවේකි මොහොතේ
රටට එඩිතර රණ විරුවෙක්
විය

අහෝ යුද්ධය
කුරිරු යුද්ධයේ සාපයෙන්
වටිනා අපගේ ජීවිතය
බිම් බෝම්බ වලට හා
උණ්ඩ වලට බිලි ගන්නා
මොහොතේ
හඩා වැටේ මා හදවත
අහෝ සොඳුරිය
මා මිය ගිය දිනක
ශාප නොකරන් මාහට
කුරිරු යුද්ධයට මිස

**සෙ/01036 සාසෙ තිලකරත්න එම්එච්පී**
9 ශ්‍රීලපාහ ඊ කණ්ඩායම තෙලිප්පලේ
පලාලි

# මා ආදර අම්මා

සුදුමල් දෝතක් අරගෙන
හිමි සුදු පාමුල අතුරා
අම්මේ නුඹ උදේ හවස
මා වෙනුවෙන් යදිනවාද.....
සුසුම් වලින් හද පුරවා
නෙතු කඳුලැල්ලෙන් නහවා
සටන් බිමෙන් මා එන තුරු
නුඹ අතැහිලි ගනිනවාද....
මේ සටනින් ජය ලබලා
සාමය දසතම පතුරා
විරුවෙක් වී මා එන තුරු
නුඹ පෙර මග බලනවා ද....

**සෙ/Z01077 සාසෙ රත්නායක ආර්එම්පී**
9 ශ්‍රීලපාහ ඊ කණ්ඩායම තෙලිප්පලේ
පලාලි

# සෙබල හිත එඩිතර බව

ගලා හැලෙන මුත් රුධිරය ධාරා
සිහල කමේ බල පෙද පාමින්
පසුබා නොයනෙම් මා මියදුන දෙන්
සටන්කරම් ලක් බිමේ නමින්

ඉපදුන රටට දැය රැකුමට පමණි අප
මියයම් දිනක මා මේ යුද බිමම සිප
නොපතම් කිසි දිනක සුවිසල් මැදුරු සැප
සාමය පතා මගේ ජීවය කරම් කැප

**සෙ/300474 ලාකෝ ප්‍රියංකර එච්පීආර්පී**
1 ශ්‍රීලපාහ "ආධාරක" කණ්ඩායම

# සෙබල අධිෂ්ඨානය

කුරිරු ත්‍රස්තවාදීන්ගේ පූර්ණ බලය යොදා අලිමංකඩ කඳවුර වෙත එල්ල කරන ලද ප්‍රහාරයේදී එම කඳවුර බේරා ගැනීම සඳහා "බලවේගය මෙහෙයුම" ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාන්විතය සඳහා අප 3 වන ශ්‍රී ලංකා පාබල හමුදා බල ඇණිය ද මූලික හවුල් කරුවන් ලෙස යුදබිමට පියවර තැබුවෙමු.

ඒ දිනය හිරු නොබසින දිනයක් සේ අප සැමටම දැනුණි. ඒ 1991.07.13 වෙනි දිනයයි. එදින 1830 පැයට පමණ හිරු බැස යන මොහොතේ වෙත්තිලකේනි ප්‍රදේශය කරා ගොඩ බැසීමේ මහගු කාර්ය පෙරදැරි කොට ගෙන පුල්මුඩේ ජැටියෙන් අප බලඇණිය නාවුක හමුදා යාත්‍රා මගින් ගමන ආරම්භ කලේය. මෙම කරදිය මතුපිට ගමන අප කාටත් නෙහෙට්වුව ගෙන දෙන එකක් විය. මා ගමන් කලේ "ලිහිණියා" නමැති නාවුක යාත්‍රාවේය. 1991.07.14 දින හිමිදිරි පාන්දර 0430 පැයට පමණ වෙත්තිලකේනි මුහුදු තීරයේ සිට කිමී 03 ක් විතර ඈතින් අපේ නාවුක යාත්‍රා නතර කළේ ය. මෙහිදී ලැබුණු නියෝග අනුව කුඩා බෝට්ටු (ඩිංගි) 15කට පමණ අපේ සෙබළු ගොඩවුනා. මේ වනවිට මුහුදු තීරයේ බංකර වල සිටි ත්‍රස්තවාදීන්ට අප කුරුමානමක් වි හමාරය. කෙසේ වෙතත් වෙරළට අවතීර්ණවීමේ අදහසින් අපේ අය රැගත් කුඩා බෝට්ටු වැල්ල දෙසට ගමන් කලේ ය. නමුත් අපට වැඩිදුරක් යන්න ලැබුනේ හැනැ. කොටි ත්‍රස්තයන් මෝටාර්, ෆයිසිරෝ ඇතුළු ප්‍රබල අවි යොදා අපට පහර දෙන්න පටන් ගත්තා. අපි කරදිය මත සිටින නිසා ඔවුන්ගේ ප්‍රහාරයට මුහුණ දෙන්න බැරි තත්ත්වයක් උදා වුනා. නැවත බෝට්ටු හරවාගෙන ගොස් ඔවුන්ගේ ප්‍රහාරයට මුහුණ දෙන්න පුළුවන් ක්‍රමයක් සැලසුම් කර පැය දෙකකින් පමණ ආවා. මොහුන් නැවත අපට විශාල ප්‍රහාරයක් එල්ල කලත් ඒ ප්‍රහාර වලට ප්‍රතිප්‍රහාර එල්ල කරමින් ඉදිරියට යාමට අපට හැකිවුනා. මේ එන අතර මග දී අප සමග බෝට්ටුවේ සිටි කීප දෙනෙකුට වෙඩිවැදුනා. අපේ ඛණ්ඩ භාර නිලධාරීටත් වෙඩි වැදුනා. නමුත් ඔහු කීවා මට මොනවා උනත් මා ගැන බලන්න එපා. ඔයලා ඉදිරියට යන්න කියලා. ඒ වෙලාවේදී අපේ ධෛර්යය හා කොටි කෙරේ තිබුනු වෛරය දෙගුණ තෙගුණ වුනා. ඔවුන්ගේ ප්‍රහාරය කොතරම් වුවත් අපේ බෝට්ටුව ඉදියෙන්ම ගමන් කර වැල්ල ආසන්නයට ආවා. ඉදිරියේ වැල්ලේ තිබුණු බංකරය තුළ සිටි කොටි අපිට ප්‍රබල ලෙස පහර දුන්නා.

වැල්ල ආසන්නයට බෝට්ටුව පැමිණෙනවාත් සමගම අප බෝට්ටුවේ සිටි එක් සෙබලෙක් බෝට්ටුවෙන් පැන වෙඩි වරුසාවක් මැද්දේ වැල්ල දෙසට දුවගොස් බිම දිගාවී අපට මෙතෙක් වෙලා ප්‍රබල ප්‍රහාරයක් එල්ලකල බංකරය දෙසට බෝම්බයක් ගලවා විසිකලා. මේ වෙලාවේ එම බංකරේ හිටිය කොටි 04 දෙනෙක් එය තුලම මරු වැළඳ ගෙන. මේවන විට අපේ බෝට්ටු කීපයකම සෙබළු වෙරළට අවතීර්ණ වෙලා හිටියේ නමුත් කොටින්ගේ ප්‍රහාරය තවමත් ඒ විදිහමයි. ගොඩක් කොටි අපට වෙඩි තැබුවේ තල්ගස් උඩ ඉඳලයි. ඒ වගේම අපේ අයනොමග යැවීමට කොටින් විදිහට වැල්ලේ පඹයෝ හදලා තිබුනා. නමුත් ඔවුනට අපේ අය නොමග යවන්න බැරි වුනා. කොටින්ගේ උපක්‍රම හොඳට අවබෝධ කරගෙනයි අපි ප්‍රහාර වලට මුහුණ දුන්නේ. වැල්ලේ හැමතැන වගේ බට්ටන් වළලා තිබුණා. ඒ වගේම හතර වටින්ම ප්‍රහාර එල්ල වෙනවා. මේ සියල්ලටම මුහුණ දෙමින් මීටර් 50ක් පමණ වැල්ලේ ඉදිරියට ආවා. මේ වන විට අපේ නිලධාරී 01 හා සෙබලුන් 05 දෙනෙකු පමණ මියගොස් ඇති බව දැනගන්න ලැබුණා. ප්‍රහාරය මැද්දේ අප සැතපුම් කාලක් පමණ ඉදිරියට ගියා. මාගේ වම් පසින් එල්ල වූ ප්‍රබල ප්‍රහාරයෙන් මාගේ මුහුණ දෙසට උණ්ඩයක් එල්ල වුනා. මගේ වම් ඇස අසල දැවී යන වේදනාවක් ඇති වූ අතර, සිහිසන් නොමැති ගතියක් ද දැනුනා. මා වේදනාවෙන් දඟලනවිට සහෝදර සෙබළුන් දෙදෙනෙකු පැමිණ මාව ඔසවා ගෙන ටික දුරක් ගෙන ගියා ක්ෂණිකව අපේ වෛද්‍ය කණ්ඩායම පැමිණ මට ප්‍රථමාධාර දුන්නා. මේ සියල්ල මට සිහිනෙන් වගේ මතකයි. ඉන්පසුව මාව බෝට්ටුවකට දැම්මා. ඒ බෝට්ටුවෙ තුවාල වූ අය කීප දෙනෙක් සිටි බව ඔවුන්ගේ වේදනා හඬ වලින් දැණුනා. මා හට මතක එපමණයි. පියවී සිහිය ලැබෙන විට මා සිටියේ කොළඹ ඇස් රෝහලේ. මේ බව වැටහුණෙත් එතන සිටිය වෛද්‍ය බලකායේ කෝප්‍රල් වරයෙකුගෙන්.

මගේ වම් ඇස ප්‍රදේශය වෙළුම් පටියකින් බැඳලයි තිබුණේ. මෙසේ මාස දෙකක් පමණ කාලයක් එම රෝහලේ ප්‍රතිකාර ලැබුවත් මාගේ වම් ඇස ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමට නොහැකි විය. මාගේ එම ඇස ඉවත් කර ඒ වෙනුවට කෘතිම ඇසක් සවි කලා. මා රෝහලේ ඇඳ මතට වී සිටින විට තවත් වේදනා ගෙන දෙන ආරංචියක් ලැබුණා. එනම් අප ඒකකයේ දෙවන අණදෙන නිලධාරී ඛණ්ඩ භාර නිලධාරී ඇතුළු සෙබල සොයුරන් 12 දෙනෙකු පමණ මෙම ක්‍රියාන්විතයෙන් මියගොස් ඇති බව, අපේ හෙට දිනය වෙනුවෙන් මේ සියලු දෙනා මිය ගියත් ඔවුන්ගේ නාමය සදා අමරණීය වන අතර, අපේ ප්‍රණාමය නිතැතින්ම ඒ අයට හිමි විය යුතු යි.

දැන් මාගේ එක් ඇසක පමණක් පෙනීම තිබුණත් කෙදිනක හෝ නැවත මම යුද බිමේ සේවයට යනවා. මාගේ එක් ඇසක පෙනීම නොමැති නිසා යුද්ධයට යන්න බැරි වුනත් යුද්ධයට යන අපේ සෙබළ සොයුරන්ට උදව් කිරීමට හෝ යුද බිමට යනවා. මෙයයි මගේ එකම අධිෂ්ඨානය.....

හෙළ දෙරණේ රණවිරුවන් පොකුරු පිටින් මියැදුනත්, ආබාධිතයන් බවට පත් වුවත්, ඔවුන් හෙලිකර දුන් මාවත ඔස්සේ කටු කොහොලින් වියකීමට ඉඩ නොතබා පොකුරු පිටින් පෙරමුණට ගොස් ඒ ප්‍රාර්ථනා ඉටුකර දෙමු.

හිටියත් රෝහලේ නැත නෙතු පිය වෙන්නේ
රණබිම පමණි තිති සිහියට නැගෙන්නේ
රණවිරු සොයුරු කැළමයි මේ අමතන්නේ
එකැසින් ඔබ බලන්නට ළඟදීම එන්නේ

සෙ/14252 ලාකෝ රත්නායක
එස්ඩබ්එම්එම්
මූලස්ථානය - 3 ශ්‍රීලපාහ

# දියතලාවේ අසිරිය

ඇවිදීමට ගියොත් පිනි ඇති වෙලාවට
කුඩලු පැටව් මතිනව මගෙ කකුල වට
නෙදිගින් ඇද හැලෙන හිම වැනි වතුර කැට
සීතල සුළඟ වැද සට පට ගායි කට

යුද කටයුතු පිණිස නිතරම අර ඇන්ද
පයෙකින් පෙනෙයි පියකරු කළුගල කන්ද
තිරුවානා ගලින් එහි මතුපිට බැන්ද
මහනිරි රූපෙ ඔතරම් පරසිදු මන්ද

සීඑල්අයි ලකුණ සහ රෝයල් ආමි
සටහන් සහිත වෙයි සමහර කඳු හුමි
තණපට බැඳුණු ලය එහි වුවමට පාමි
දියතලාව ඔබ හරි රුබර පේමි

ති/61676 2/ලුතිනන් ඩීඑම්පී
රුවන්පුර ශ්‍රීලපාහ

# බලඇණි ඉතිහාසය 6 ශ්‍රීලපාහ

6 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව 1990.06.08 දින පනාගොඩ රෙජිමේන්තු මූලස්ථානයේ දී ස්ථාපනය කරන ලදී. මෙහි ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් ලූතිනන් කර්නල් ඩී. රත්නසභාපති, ආර්එස්පී ශ්‍රීලපාහ පත්කරන ලද අතර, ඒකකය නගා සිටුවීම සඳහා 1 ශ්‍රීලපාහ වෙතින් "ඩී" කණ්ඩායමද, 3 ශ්‍රීලපාහ වෙතින් "ඒ" කණ්ඩායම ද, 4 ශ්‍රීලපාහ වෙතින් "ඩී" කණ්ඩායම ද ලබාදෙන ලදී. එම ඒකකයන් වෙතින් පැමිණි නිලධාරී/ජ්‍යෙෂ්ඨ නොනිලධාරීන් දක්වා ඇති තනතුරු සඳහා පත් කරන ලදී.

**නිලධාරීන්:-**

4 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් කර්නල් ඩී රත්නසභාපති. ආර්එස්පි. ශ්‍රීලපාහ (අණදෙන නිලධාරී)

1. ශ්‍රීලපාහ වෙතින් මේජර් ටීටීආර් ද සිල්වා, ආර්ඩබ්පි, ආර්එස්පී. පීඑස්සී (අණදෙන නිලධාරී)

1 ශ්‍රීලපාහ වෙතින් මේජර් එච්ඩබ් හේවාආරච්චි, ආර්ඩබ්පී. ශ්‍රීලපාහ (2 වන අ:නි:)

4 ශ්‍රීලපාහ වෙතින් කපිතාන් එස්සී කරුණාරත්න, ශ්‍රීලපාහ (නි:අ ඒ කණ්ඩායම)

3 ශ්‍රීලපාහ වෙතින් කපිතාන් එච්එස්කේ ඇඹව, ශ්‍රීලපාහ (නි:අ සී කණ්ඩායම)

3 ශ්‍රීලපාහ වෙතින් කපිතාන් ජේපී වර්ණකුල, ශ්‍රීලපාහ (නි:අ බී කණ්ඩායම)

4 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් එල්එම් මුදලිගේ, ශ්‍රීලපාහ (විධායක අධිකාරී)

1 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් කේජ් ජයකොඩි, ශ්‍රීලපාහ (නි:අ ආධාරක කණ්ඩායම)

1 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් ඩීඩබ්එන්ජ් දොඩන්වල, ශ්‍රීලපාහ (බණ්ඩහාර නිලධාරී)

3 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් ඩීඩබ් විජේසිංහ, ශ්‍රීලපාහ (බණ්ඩහාර නිලධාරී)

1 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් ඩීඩී වීරසූරිය, ශ්‍රීලපාහ (බුද්ධි නිලධාරී)

3 ශ්‍රීලපාහ වෙතින් එන්කේ ලූතිනන් වඩුගොඩපිටිය , ශ්‍රීලපාහ (බණ්ඩහාර නිලධාරී)

4 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් ආර්ජ්එස්ඩී රණතුංග, ශ්‍රීලපාහ (බණ්ඩහාර නිලධාරී)

4 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් කේපීඑච්ඩී ද සිල්වා, ශ්‍රීලපාහ (බණ්ඩහාර නිලධාරී)

4 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් ඩීඩබ්ආර්ජේජ් කුමාර, ශ්‍රීලපාහ (බණ්ඩහාර නිලධාරී)

1 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් (උපා) අයිකේයූ දයානන්ද, ශ්‍රීලපාහ (උපානි)

4 ශ්‍රීලපාහ වෙතින් ලූතිනන් (උපා) එන් පෙරේරා, ශ්‍රීලපාහ (ප්‍රවාහන නිලධාරී)

**ජ්‍යෙෂ්ඨ නොනිලධාරීන්:-**

1 ශ්‍රීලපාහ වෙතින් ව/සැරයන් ඩිංගිරි අප්පුහාමි ආර්ජ් (ව්.ගා.සැ.මේ)

1 ශ්‍රීලපාහ වෙතින් ව/සැරයන් අබේරත්න (ක.සැ.මේ පාලන)

4 ශ්‍රීලපාහ වෙතින් බනි II එච්එම් ඒකනායක, ආර්ඩබ්පි (ක.සැ.මේ ඒ කණ්ඩායම)

3 ශ්‍රීලපාහ වෙතින් ව/සැරයන් ප්‍රේමසිරි ටීජ්ඩී (ක.සැ.මේ බී කණ්ඩායම)

1 ශ්‍රීලපාහ වෙතින් බනි II පෙරේරා ආර්ජ්යූ (ක.සැ.මේ සී කණ්ඩායම)

3 ශ්‍රීලපාහ වෙතින් ව/සැරුයන් ධර්මදාස කේ (කසැමේ ආධාරක කණ්ඩායම)

1 ශ්‍රීලපාහ වෙතින් එවන ලද කණ්ඩායම කල්මුනේ/කලවංචිකුඩි යන ප්‍රදේශයන්හි අනුඛණ්ඩ රාජකාරි ඉටු කරමින් සිටින ලද අතර,ඉන්දීය සාම හමුදාව මෙරටින් පිටත්වීමත් සමගම ඇරඹුනු දෙවන ඊළාම් යුද්ධයේ ප්‍රථම ත්‍රස්තවාදී ප්‍රහාරයට කල්මුනේ/කලවංචිකුඩි අනුඛණ්ඩයන්හි සිටි භට පිරිස් භට 1990.06.11 දින මුහුණදීමට සිදු වූ අතර, එදිනම බලඇණි මූලස්ථානය ද, අම්පාර ප්‍රදේශයේ ක්‍රියාත්මක රාජකාරි සඳහා පිටත් වන ලදී. කල්මුනේ/කලවංචිකුඩි කඳවුර වෙත දරුණු ප්‍රහාර දින 09ක් තිස්සේම එල්ලවූ අතර, එවකට බලසේනාධිපති වශයෙන් කටයුතු කළ බ්‍රිගේඩියර් ඒකේ ජයවර්ධන, ආර්ඩබ්පි, ආර්එස්පි, පීඑස්සී විසින් තම බලසේනා සමූහය සමගින් ප්‍රහාර එල්ල වූ කඳවුර වෙත පැමිණ අනුඛණ්ඩයේ සිටි භට පිරිස් බේරා ගන්නට සමත් වූහ.

ඉන්පසුව බලඇණි මූලස්ථානය පුළුකුනාව කඳවුරේ ස්ථානගත වී සිටි අතර, අනෙකුත් කණ්ඩායම් බක්කිඇල්ල, බදුලු හන්දිය, නුගේලන්ද, වැම්පිටිය, මංගලගම, වවලකඩේ යන ප්‍රදේශයන්හි ස්ථානගත වන ලදී. එම ප්‍රදේශයන්හි ගම්වැසියන්ට ආරක්ෂාව මෙන්ම රජයේ හා මහජන දේපල වලට, සිවිල් මිනිසුන්ගේ ගොවිතැන් කටයුතු සඳහා ද, ආරක්ෂාව සපයා දෙමින් මනා ලෙස රාජකාරි ඉටු කරන ලදී. එමෙන්ම පුළුකුනාව කඳවුරේ සිට මංගලගම දක්වා මාර්ගයේ සිවිල් බස් සේවාව සඳහා මාර්ග පරීක්ෂා කිරීම් වැනි රාජකාරීන් මෙම ඒකකය වෙතින් ඉටු කරන ලදී. මෙම කාලය තුළ දී ඒකකයේ "ඩී" කණ්ඩායම ද, පුළුකුනාව කඳවුරේ ස්ථාපනය කරන ලද අතර, වෙල්ලාවලි, තොප්පිගල, පුලාවලි ප්‍රදේශයන්හි ක්‍රියාත්මක රාජකාරි වලට ද සහභාගී වන ලදී.

දෙමසකට ආසන්න කාලයක් අම්පාර ප්‍රදේශයේ රාජකාරි ඉටු කරමින් සිටියදී 1991 ජූලි මස අලිමකංඩ යුද හමුද කඳවුර වෙත එල්ල වූ දරුණු ත්‍රස්තවාදී ප්‍රහාරය මැඩ පැවැත්වීම සඳහා සැලසුම් කරන ලද බලවේගය 1 මෙහෙයුමට ද සහභාගීවීමේ අවස්ථාව උදාවිය.

මෙම බලඇණියේ කණ්ඩායම් සියල්ලම එක්ව මෙහෙය වනු ලැබූ ප්‍රථම ක්‍රියාත්මකය මෙය විය. නව බලඇණියක් වශයෙන් මෙම ක්‍රියාත්මකයට සහභාගී වූ ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ එවකට පිහිටුවා තිබූ අනෙකුත් බලඇණි වන 1, 3 සහ 4 ශ්‍රීලපාහ ඒකකයන්ට නොදෙවෙනි ව ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක රාජකාරි ඉටු කරන ලදී.

1991.08.10 සිට 92.01.10 දින දක්වා අලිමංකඩ කඳවුරේ ආරක්ෂක රාජකාරි ඉටු කර පලාලි බලප්‍රදේශයට ගොස්, බලඇණිය 92.01.24 දින එහි ආරක්ෂක වලල්ලේ කඩ්ඩුවාන්හි ස්ථානගත වන ලදී.

1992.02.15 දින කඩ්ඩුවාන් ආරක්ෂක රාජකාරි නිම කොට අනුරාධපුරය තිසාවැව කඳවුර වෙත පැමිණ සංවිධානය වී 1992.02.18 දින තන්තිරිමලේ ප්‍රදේශයේ ස්ථානගත වන ලද අතර, 1992.02.24 දින සිට 1992.03.01 දින දක්වා වන්නි වික්‍රම III කියාත්මකයට සහභාගී වන ලදී. නැවත භට පිරිස් ගල්කුලම වෙත පැමිණ 1993.03.17 සිට 1993.03.24 දින දක්වා හයේ පහර ක්‍රියාත්මකයට ද සහභාගී වන ලදී. මෙම ක්‍රියාත්මකයන්ට ජයග්‍රාහී ලෙස මුහුණදි බලඇණියේ කීර්ති නාමය තහවුරු කර ගන්නා ලදී.

1993.04.01 දින සිට 6 බසේමු යටතේ අනුඛණ්ඩ රාජකාරි සහ වැලිඔය ප්‍රදේශයේ ගජබාපුර, කොක්කුතුඩායි, කෝවිල් පොයින්ට්, ජනකපුර, යන ස්ථානයන්හි ස්ථානගත වන ලදී. මෙහි දී ගම්වැසියන්ට ආරක්ෂාව සැපයීම ඒකකය සතු වගකීම විය.

1993.01.27 දින වැලිඔය ප්‍රදේශයේ අනුඛණ්ඩ රාජකාරි අවසන් කරමින් හොරොව්පතාන වෙත පැමිණෙන ලදී. එහිදී මෙම බලඇණියේ ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කළ ලූතිනන් කර්නල් ඩී රත්නසභාපති, ආර්එස්පී ශ්‍රීලපාහ විසින් නම අණදීම මේජර් ආර්එම්ඩී රත්නායක, ආර්ඩබ්පී ශ්‍රීලපාහ වෙත භාරදීම සිදු කරන ලදී. නව අණදෙන නිලධාරී වශයෙන් වැඩ භාර ගැනීමත් සමගම "බ්ලැක් ෆොක්ස්" සහ "සැඩ පහර" ක්‍රියාත්මකයන් සඳහා සහභාගී වන ලදී.

33 පිටුවට

# ජාතියේ මිණි පහන ඔබයි අම්මේ

දරුවෙකු ලෙසට මා මෙලොවට බිහිකළ අම්මේ
ඇතිදැඩි කලේ දරු සෙනෙහසකින් අම්මේ
ලේ කිරි කර පොවා උගතෙකු කළ අම්මේ
සැමද දෝත් බැඳ ඔබ පුදනෙමි අම්මේ

ලොවේ උතුමන් නොයෙක් අයුරින් රටට සාමය පතයි අම්මේ
ද්‍රවිඩයින් ටික දෙනෙකු එක්වී යුද්ධයට අවි අරන් අම්මේ
පාපයෙන් තොර එසවූ අවියට දෙවිවරුන් හිස නමයි අම්මේ
ඔබගෙ පුතු ගිනි අවිය ගත්තේ බීවී මව්කිරි නිසයි අම්මේ

රටට යහපත සද සාමය සොය සොයා ගිය විරුවො අම්මේ
පර සතුරු අවි වලින් පිටවුන උණ්ඩයට බිලි වුනා අම්මේ
වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව වගේ වීරයන් මියගියා අම්මේ
මිය ගියා වූ සියළු සොයුරන් ජාතියේ ඉටු දෙවියෝ අම්මේ

ඔබේ පුතු අද උතුරෙ ඇත්තේ රටට සාමය සොයා අම්මේ
බීව කිරි වල නාමයෙන් අද රටට සේවය කරමි අම්මේ
රටට වැඩ ඇති පුතුන් අතරට කොටස් කරුවෙකි ඔබත් අම්මේ
දේශයේ මුර දූතයෙක් වෙමි ඔබගෙ පුතු රත්තරන් අම්මේ

බුදු කෙනෙකු ලොව පහළ වන්නේ කලාතුරකින් නේ ද අම්මේ
සතුරු අවිවල බලය ළහදිම අඩුවෙලා යයි නේ ද අම්මේ
මගේ ආයුෂ එකතු කරගෙන සද ජීවත් වෙන්න අම්මේ
ජාතියේ මිණි පහන ඔබවෙයි මා වැදූ රත්තරන් අම්මේ


**සෙ/14316 කෝප්‍රල් අබේගුණවර්ධන ඩීඑම්පී**
10 වන ශ්‍රී ලංකා පාබල හමුදාව, යුහ කඳවුර, මාදගල්, පලාලි

32 පිටුවෙන්

1993.03.07 දින බළඇණි මූලස්ථානය සෙට්ටිකුලම් ප්‍රදේශයේ ස්ථානගත වූ අතර, ක්‍රියාන්විත මූලස්ථානය සී කණ්ඩායම සමග අලිමංකඩ ද, ඒ කණ්ඩායම වෙත්තිලකේනි ද, බී සහ ඩී කණ්ඩායම් පූනරින් ද, ස්ථානගත වන ලදි. මේ අවස්ථාවේ ඒ සහ සී කණ්ඩායම් "කින් පිෂර්" ක්‍රියාන්විතයට ද සහභාගී වනලදී.

1993.09.24 දින නෙක් මන්නාරම, පුත්තලම, එළුවන්කුළම, තන්තිරිමලේ, මඩුකන්ද සහ වව්නියාව ප්‍රදේශයන්හි කණ්ඩායම් වශයෙන් වෙන් වෙන්ව ක්‍රියාන්විත රාජකාරීන්හි යොදවා තිබූ අතර, 1993.09.28 දින අලිමංකඩින් ආරම්භ කරන ලද යාල් දේවි ක්‍රියාන්විතයට සහභාගී වන ලදී. මෙහි දී ක්‍රියාන්විතය ආරම්භ වූ දින සිට අවසානය දක්වා පෙරමුණෙන්ම ගමන් ගත් මෙම බළඇණිය පාබල ඒකක අතුරින් විශිෂ්ඨ ලෙසින් දස්කම් පා යුද හමුදාවේ මෙන්ම මුළු මහත් ලක්වාසීන්ගේ ප්‍රශංසාවට ලක්විය.

1993.01.04 දින යාල්දේවි මෙහෙයුම අවසන් කොට කන්කසන්තුරේ දක්වා පැමිණ 1993.10.12 දින පලාලි බල ප්‍රදේශයේ, 9 බලසේනා මූලයට අයත් මාදගල් ප්‍රදේශයේ ආරක්ෂක රාජකාරීන් භාරගන්නා ලදී. මෙහි දී අප ඒකකය වෙත ලබාදෙන ලද ආධුනික පුහුණු පාඨමාලාවද, සාර්ථකව නිම කොට ඉදිරි ක්‍රියාන්විත රාජකාරී සඳහා පුහුණුව ලබමින් සිටී.



# එන්නම් බුදු සමිඳ හෙට බණ අහන්නට

පන්සල බුදු මැදුර දගැබ බෝ මළුව
සදහම් සිසිල නැත තවමත් ගොස් පහව
ගිලිහෙන විට දි සිහ ධජයේ රන් කඩුව
මව් බිම රැක ගන්න යුධ අවි අත දැරුව

සදහම් සිසිල බෝමළුවෙන් හමන විට
මතකයි පොඩි සාදු බණ දෙසුවා යසට
ප්‍රාණඝාත අකුසලයෙන් මිදෙන්නට
නොහැකිය සමිඳ සෙබලෙකි අවි ගත් අතට

බුද්ධ ධම්ම සහ රුවනින් සිත පැහැද
සිටියා පෙර දිනේ බුදු සමිඳුන් නැමැද
මව් බිම කඩන්නට කරමින් කොටි සද්ද
සමිඳුනි සතුරො මරණා එක පව් නැද්ද

සෙබලෙකු උනත් තිසරණ ගුණ මහද ලයේ
සිහියට එනව බණ ඇසූ හැටි තිහඩ පැයේ
උතුරෙ ගෙවන දුක්බර හමුද දිවියේ
සමිඳුනි මල් පුදමි සැමද මුර කුටියේ

රට දැය සමය ජාතිය ආගමට ලද
සෙබලුන් සියලු දෙන මිණි පහනක් නේද
මව් බිම නමින් සටනට ගොස් දිවිය පුද
සමිඳුනි සෙබලුන්ට දෙව් ලොව ඉඩ නැති ද

යුධ අවි අරන් බැහැ බුදු බණ රකින්නට
සිදුවේ සැමදිනම සතුරන් නසන්නට
රණබිම ජය අරන් සාමය පෙරටු කොට
එන්නම් බුදු සමිඳ හෙට බණ අහන්නට

සිතුවම හා කාව්‍ය නිර්මාණය :
**සරත් රත්නායක. ආර්එම්ජ්බී - 7 ශ්‍රීලපාහ**

# වර්ගවාදී එල්ටීටීඊ සංවිධානය ජය ලැබුවේ නැත

සංගුපිඩ්ඩි -පූනරීන් ප්‍රදේශයේ හට පිරිස් ස්ථානගතව සිටීම එල්ටීටීඊ සංවිධානයට මෙන්ම එල්ටීටීඊ උපදෙස් පිළිපදින සමහරක් යාපනයේ වැසියනට දරුණු හිසරදයක් විය. මේ නිසාම යාපනයේ මහජනයාගේ සිත් දිනා ගැන්මට කල්පනා කළ එල්ටීටීඊ නායකත්වය පූනරීන් වල සිටින සියළුම හට පිරිස් සමූල ඝාතනය කොට පූනරීන්/සංගුපිඩ්ඩි පෙදෙසින් ආරක්‍ෂක හමුද ඉවත් කරන බවට පොරොන්දු දුනි. එල්ටීටීඊ සංවිධානය මේ නිසා සිය උපරිම හට පිරිස් සංඛ්‍යාවක් යොද පූනරීන් අල්ලා ගැනීමට දින තුනක සටනක් කළහ. යුද්ධයේදී දෙපාර්ශවයටම ජීවිතහානි සහ අලාභ සිදුවිනි. සිදු වූ ජීවිත හානි සලකා බැලූ විට රජයේ හමුදවන්ට වඩා විශාල ජීවිත සංඛ්‍යාවක් බෙදුම්වාදීන්ට අහිමි විය. සතුරාට පූනරීන් අල්ලා ගැනීමට නොහැකි විය. ඔවුන්ගේ අභිප්‍රාය අසාර්ථක විය. කෙටියෙන් කිවහොත් පූනරීන් යුද්ධයෙන් එල්ටීටීඊ බෙදුම්වාදී සතුරා මහත් පරාජයකට පත් විය.

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ අලිමංකඩට බටහිරින් පූනරීන් ගම්මානය පිහිටා ඇති අතර, එය යාපනය අර්ධද්වීපය හා කිලාලි කලපුවෙන් වෙන් වී ඇත. ශුෂ්ක දේශගුණයක් පවතින මෙහි භූමි ප්‍රදේශයෙන් වැඩි කොටසක් මුහුදු සීමාවෙන් වටවී ඇත. නිසරු වැලි සහිත භූමියක් වන හෙයින් මෙහි වර්ෂාව නොමැති කාලයේදී වැලි සහිත සුළඟ නිතරම හමායයි. පායන ග්‍රීෂ්ම කාලයේ බීමට ජලය සපයා ගැනීම අසීරු කරුණක් වන නමුදු වර්ෂා කාලයේ දී එය ජලය පිරි මඩගොහොරු ප්‍රදේශයක් බවට පත් වේ. මේ අනුව මෙහි ජීවත්වීමේ දී නිරන්තරවම ස්වභාවය ධර්මයාගේ පීඩාවන්ට මුහුණදීමට සිදුවේ.

මෙම ප්‍රදේශයේ ජනගහණය ද්‍රවිඩ වැසියන්වන අතර, ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය ධීවර කර්මාන්තය වේ.

උතුරු ප්‍රදේශයේ ත්‍රස්තවාදී ක්‍රියා ඇරඹීම හේතුවෙන් 70 දශකයේ මැද භාගයේ දී යුධ හමුද අණුඛණ්ඩයක් එම ප්‍රදේශයේ ස්ථානගත කළ අතර, එමගින් පූනරීන් සිට සංගුපිඩ්ඩි කළපූ තොට මගින් ඔරු පාරු යාපනය වෙත ගමන් ගැනීම පාලනය කර ප්‍රදේශයේ ආරක්‍ෂාව තහවුරු කිරීම සිදුකරන ලදී. මෙම ප්‍රදේශය ගැන සලකා බැලීමේ දී අතීතයේ ඉදිකෙරුණු පෞරාණික යුධ බලකොටුවක් තිබීම මෙහි සංග්‍රාමික වැදගත්කම විදහා දක්වා ඇත. 1 ශ්‍රීලපාහට අයත් හට පිරිස් එක් දහස් නවසිය හැට ගණන් වල සිට වරින් වර මෙම ප්‍රදේශයේ ආරක්‍ෂක රාජකාරියෙහි යෙදුණු අතර, කඳවුර වශයෙන් මෙම බලකොටුවද ප්‍රයෝජනයට ගන්නා ලදී.

> කොල්ලනේ මම උඹලාව දාලා යන්නේ නෑ. උඹලත් එක්ක මෙතන මැරෙනවා. සිංහල කොල්ලන් වශයෙන් ඉතිහාසය පුරා පැවත ආ රණවිරුවන්ගේ නාමයෙන් අපිට සතුරාට යටත් වෙන්න බෑ. කරන්න තියෙන්නේ එකම දෙයයි. පුළුවන් තරම් සතුරන් මරාගෙන අපිත් මැරෙන එකයි

ත්‍රස්තවාදී ක්‍රියා උතුරේ සිට නැගෙනහිර පළාත දක්වා ව්‍යාප්තවීම හේතුවෙන් එම ප්‍රදේශයන් වල හට පිරිස් ස්ථාන ගත කිරීම වඩාත් අත්‍යාවශ්‍ය කරුණක් වූ හෙයින් පූනරීන් ප්‍රදේශයේ හමුද කඳවුර ඉවත් කර ගන්නා ලදී. එම වකවානුවේදී පූනරීන් ප්‍රදේශය සංග්‍රාමික වශයෙන් එතරම් වැදගත් තත්ත්වයක් ද නොතිබුණි.

ත්‍රස්තවාදී ක්‍රියා උග්‍රවීමේ හේතුවෙන් අලිමංකඩ සිට පූනරීන් දිසාවට විරුද්ධ දිසාවෙන් පිහිටි වෙතිතිලකර්නි සිට අලිමංකඩ දක්වා වූ මුළු භූමි ප්‍රදේශයම මියගිය ලූතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව සෙන්පතිගේ නායකත්වය යටතේ මෙහෙයවන ලද "බලවේගය I සහ II" ක්‍රියාන්විතයන් මගින් ශ්‍රී ලංකා යුධ හමුද විසින් අත්පත් කර ගන්නා ලදී. මෙම භූමි ප්‍රදේශය ශ්‍රීලංකා යුධ හමුදවේ පාලනයට නතුවීමෙන් පසු ත්‍රස්තවාදීන් හට යාපනය අර්ධද්වීපය දක්වා සියළුම ගමන් මාර්ගයන් අවහිර වූ අතර, එම පාඩුවට විකල්ප මාර්ගයක් වශයෙන් ත්‍රස්තවාදීන් විසින් පූනරීන් ප්‍රදේශය සිට කලපුව මාර්ගයෙන් සංගුපිඩ්ඩි හරහා යාපනය අර්ධද්වීපය වෙත ගමන් ගැනීම ආරම්භ කළහ. මෙම තත්ත්වය යටතේ පූනරීන් ප්‍රදේශයේ ත්‍රස්තවාදී බලය ව්‍යාප්ත වූවා මෙන්ම සංග්‍රාමික වශයෙන් පූනරීන් ප්‍රදේශය වැදගත් තත්ත්වයකට පත්විය. සියළුම ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් මෙන්ම යාපනය හා අනෙකුත් ප්‍රදේශකරා ගමනාගමන කටයුතු ද පූනරීන් හරහා සිදු වීම හේතුවෙන් සියළු පාර්ශවයන්ගේ අවධානය පූනරීන් දෙසට යොමු විය. එමෙන්ම පූනරීන් ප්‍රදේශය දිවයිනේ සියළු දෙනාගේ කතාබහට ලක් වූ ප්‍රධාන මාතෘකාවක් වන්නට විය. ඉහත සඳහන් තත්ත්වය යටතේ පූනරීන් ප්‍රදේශය යුධ හමුදවේ පාලනයට නතුකර ගැනීමේ අවශ්‍යතාවය වඩාත් ඉස්මතු විය.

92 වර්ෂයේ මුල්භාගයේ දී ශ්‍රී ලංකා යුධ හමුදව මගින් ක්‍රියාත්මක කරන ලද "වාලම්පූරි මෙහෙයුම" මගින් මුහුදින් ගොඩබට යුධ හමුද හට පිරිස් විසින් ත්‍රස්තවාදී බලය අඩපනකර පූනරීන් ප්‍රදේශයේ බලය ව්‍යාප්තකර යුධ හමුද කඳවුරු පිහිටුවන ලදී. මෙම ප්‍රදේශය යුධ හමුද බලයට නතුවීමෙන් ත්‍රස්තවාදීන්ට මරුපහරක් එල්ල වූ අතර, යාපනය ප්‍රදේශයේ නිවැසි මහජනතාව ගෙන් ද ත්‍රස්තවාදීන්ට අප්‍රසාදය එල්ල වන්නට විය. ත්‍රස්තවාදී ක්‍රියා අඩපනවීමත්, මහජන අප්‍රසාදය එල්ලවීමත් හේතුවෙන් ත්‍රස්තවාදීන් විසින් යුධ හමුද කඳවුරු වලට ප්‍රහාර එල්ලකොට එම කඳවුරු ඉවත් කරන බවට යාපනයේ මහජනතාවට පොරොන්දු ප්‍රකාශ නිකුත් කරමින් පුරසාරම් දොඩා ඇත. මේ සඳහා ත්‍රස්තවාදීන් විවිධ උපක්‍රම යොදමින් නානා මාදිලියේ සැලසුම් අත්හද බලමින් කඳවුරට පහර එල්ල කිරීමට මාර්ග සකස් කිරීමට යුහුසුළු වූහ.

1993 මැයි වන විට පූනරීන් යුධ හමුද කඳවුරේ රාජකාරීන් 1 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව සහ 3 වන ගජබා රෙජිමේන්තුව විසින් භාරගෙන ක්‍රියාත්මක කරවමින් සිටින ලදී.

ග්‍රීෂ්ම සමයේ දහවල් තද අව් රශ්මිය සුළඟ

හා මුසුව එන වැලි කැටත්, රාත්‍රියේ අධික සීතල සුළඟත් සෙබළා හා මිතුරුව නිරන්තරයෙන් ඇගේ දැවටීමත් මුහුදේ රළ ඝෝෂාවත් සතුරු උණ්ඩයේ පැමිණීමේ බලාපොරොත්තුවත් සෙබළාගේ ජීවිතයේ ඒකාකාරී අංගයක් බවට පත් විය. රටවැසි සාමකාමී ජනතාවගේ ජීවිතය නිස්කලංකව ගෙනයාම උදෙසා ත්‍රස්තවාදී තර්ජන මුලින් උපුටා දැමීම, අවශ්‍යතාවයන්ගේ පළමුවන අංගය වශයෙන් තෝරාගත් සෙබළකැළ විසින් තම පුද්ගලික පහසුව හෝ සැප වියරණය දෙවනු කොට සලකා ජාතික මෙහෙවරේ නියමුවන් බවට පත් වෙමින් සිටින ලදී.

කලින් ලැබුණු තොරතුරු අනුව ප්‍රහාරයට සූදනම් වීම.

1. සාකච්ඡා (අ.නි. සහ නි.අ. වරුන්)
2. පෙරහුරු
3. සියළු ආරක්ෂක බාධක තරකිරීම

හිරු බැස යයි. සෙබළා හුදෙකලා වෙයි. සඳ නැගෙයි සෙබළ සිතට සතුට නැගෙයි. සඳ බැස යයි. ජීවන පැතුම් බොඳවී යයි. හිරු නැගෙයි. සෙබළ මුව විකසිත වෙයි. මෙය නිරන්තර ජීවිත ගීතයයි.

1993 නොවැම්බර් 10 දින උද වුණි. දෛනික ක්‍රියාවලියන් ඇරඹුනි. සුපුරුදු පරිදි දවස ගෙවීයයි. රාත්‍රී ලංවෙයි. වෙනසක් නොමැත. වෙනත් දිනයක තත්ත්වයේම නිහඬතාවය රජකරයි. මැදියම් රැය එළඹෙයි. මුහුදේ ඝෝෂාව රැහැයි නාදය හා තරඟයකට වැටී ඇත. ඉඳහිට ඇතිවන වැස්ස සෙබළාට ප්‍රශ්ණයක් නොවේ. එය ඔහුට පුරුදු එක් දුෂ්කරතාවයක් පමණි. මැදියම් රැයේ හදිසි තත්ත්වයට මුහුණදීමේ පුහුණුව ඇරඹිණි. වෙනසක් නොමැත. වැස්ස පවතී. මුහුදේ බෝට්ටු ගමන් කරන්නාක් මෙන් ශබ්ද ඇසේ. එය දෛනික ක්‍රියාවන්ට අයත් තත්ත්වයක් සේ හැඟීයයි. 11 වන දින ආරම්භ වී පළමුවන පැය පැමිණේ. කඳවුරු ආරක්ෂක වලල්ල වටේ සෑම පැත්තකින්ම එක් වරම මහා වෙඩි ප්‍රහාරයක් කඳවුර තුළට එල්ල වේ. ඒ සමග කඳවුර තුළට කලපුව පැත්තෙන් ඇතුල්වී සිටි ත්‍රස්තවාදීන් කඳවුරතුළ සිට ආරක්ෂක වලල්ලට ප්‍රහාර එල්ල කලහ. ආරක්ෂක වලල්ලේ සෙබළුන් හට ඉදිරියෙන් හා පසුපසින් වෙඩි ප්‍රහාර එල්ල වේ. කල්පනා කිරීමට කාලය නොමැති විය. සෑම තැනින්ම එල්ලවන ප්‍රහාරයන්ට මුහුණදීමට සෙබළුන්ට සිදුවිය. ප්‍රහාරය ආරම්භ වීමත් සමගම තවත් හාරසියයක පමණ ත්‍රස්තවාදීන් පිරිසක් මුහුදෙන් පැමිණ කඳවුරට ඇතුල් වී ත්‍රස්ත ප්‍රහාරය ප්‍රබල කරන ලදී.

බලඇණි දෙකේම සියළුම කණ්ඩායම් වෙත මෝටාර්, ආර්පීජී අවි ප්‍රහාරයන් ප්‍රබලව එල්ල වූ අතර, ආරක්ෂක වලලු රැක ගැනීමේ තීරණාත්මක අවස්ථාවට හට පිරිස් ධෛර්යමත්ව සටන් කළහ. ත්‍රස්තවාදීන් විශාල කණ්ඩායම් වශයෙන් සෑම පැත්තකින්ම කඳවුරට ඇතුල් වේ. ඉදිරියෙන් හා පසු පසින් එල්ල වන ප්‍රහාර සහ ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල ආධාරක අවි ප්‍රහාරයන් එල්ලවීමෙන් දේශයේ වීරෝධාර සෙබලුන්ගේ ජීවිතයන් වා තලයට මුසු විය. අත් පා ආදී ශරීරයේ කොටස් අහිමි විය. සංඥා සම්බන්ධතා බිඳ වැටුනි. ත්‍රස්තබලය, ප්‍රමාණය සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. ආරක්ෂක වලල්ල රැක ගැනීම තීරණාත්මක ප්‍රශ්නයක් වූ අතර, ප්‍රබල ප්‍රහාර හමුවේ සෙබළුන්ට ආරක්ෂක ස්ථාන සොයා යන්නට සිදු විය.

> "තැනෙක මියගිය වීර සෙබළෙකි. තැනෙක වෙඩිවැදී ලේ ගලන රණවිරුවෙකි. බැලූ බැලූ අත පෙණෙන පෙණෙන අත බිහිසුනු සටන් ය. කුරිරු ත්‍රස්ත මල සිරුරු ද තැන තැන වැටී ඇත. ජීවිතය ජීවත්කරවීම සැක සහිතවිය. මරණයේ සෙවනැලි හොල්මන් කරයි. තීරණයක් ගත යුතු ය. එය මරුවා මැරීමයි"

තැනෙක මියගිය වීර සෙබළෙකි. තැනෙක වෙඩිවැදී ලේ ගලන තුවාල සහිත රණවිරුවෙකි. බැලූ බැලූ අත පෙණෙන පෙණෙන අත බිහිසුනු සටන් ය. කුරිරු ත්‍රස්ත මළ සිරුරු ද තැන තැන වැටී ඇත. ජීවිතය ජීවත්කරවීම සැක සහිත විය. මරණයේ සෙවනැලි හොල්මන් කරයි. තීරණයක් ගත යුතු ය. එය මරුවා මැරීමයි.

බලඇණි දෙකේම නිලධාරීන් සාකච්ඡාකර තමාට අයිති රාජකාරීන් ලඟි ලඟියේ ඉටු කළහ. ගුවන් විදුලි සබඳතා ඉතා දුර්වල වුව ද අවශ්‍ය උපදෙස් අණදෙන නිලධාරීන්ගෙන් ලැබිණ. පහර දෙන සතුරාට එරෙහිව කණ්ඩායම් නිලධාරී අණදෙන්නන් හා අණදෙන නිලධාරීන්ගේ උපදෙස් පරිදි 81 මෝටාර් සහ කාලතුවක්කු අවි වලින් ප්‍රතිප්‍රහාර එල්ල කරන ලදී. ආරම්භයේ දීම කාලතුවක්කු තිබූ ස්ථානය සතුරු ග්‍රහණයට අසුවීම නිසා වැඩි වශයෙන් සහාය ලබාගැනීමට හැකිවූයේ ශ්‍රීලපාහට අයත් 81මිමී මෝටාර් වලිනි.

ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරය බලවත් වීම හේතු කොට ගෙන "ඩී" කණ්ඩායම සමග ගුවන්විදුලි සම්බන්ධතාවය ද බිඳ වැටුණි. මේ වන විට නාගතේවන්තුරෙයි නාවික කඳවුරට ද බලවත් ප්‍රහාරයක් එල්ල වෙමින් පැවතුනි. මුළු කඳවුරතුලම අවි වලින් නිකුත් වන ගිනි පුපුරු හා වෙඩි හඬින් දෙවනත් වෙමින් පවතී. ආලෝකය ලැබෙනුයේ අවි වලින් නිකුත් වන ගිනිපුපුරු වලිනි. දරුණු සටන් සිව් දෙසින් ඇවිලී යයි. දුරකථන සහ ගුවන් විදුලි මාර්ගයෙන් 10 බලසේනා මූලයට තත්ත්වය දැනුම් දෙන ලදී. මෙතෙක් ආධාරක වෙඩි සැපයූ කාලතුවක්කු අවි ස්ථානගත පෙදෙසට තදබල ප්‍රහාර එල්ලවිය. සන්නාහ සන්නද්ධ රථ නවතා තිබූ ස්ථානය ද ත්‍රස්තවාදී ග්‍රහණයට නතු විය. ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල ආර්පීජී ප්‍රහාර 25 ක 30ක ප්‍රමාණයක් එකවර ආරක්ෂක වලල්ල වෙත එල්ලවිය. කාලතුවක්කු අණුබණ්ඩය සමග තිබූ ගුවන් විදුලි සම්බන්ධතාවය බිඳ වැටුණි. ත්‍රස්තවාදීන් විසින් අල්ලාගත් කාලතුවක්කුවලින් පෙරලා හට පිරිස් වෙත ප්‍රහාර එල්ල වන්නට විය. වේලාව 0200 පැයට පමණ වන්නට ඇත. නැගෙනහිර දෙසින් එල්ලවූ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් සන්නද්ධ රථ නවතා තිබූ ස්ථානය සම්පූර්ණයෙන්ම ත්‍රස්තවාදීන්ට නතු විය.

1 ශ්‍රීලපාහ සහ 3 ගරෙ ආරක්ෂක වලල්ලෙන්, ඔවුනට දුර්වල කර ගැනීමට හැකිවූ ස්ථාන මඟින් විශාල ත්‍රස්තවාදීන් ප්‍රමාණයක් කඳවුරට ඇතුල් විය. 0400 පැය උදවිය. කාලතුවක්කු අණුබණ්ඩය දෙසින් විශාල පිපිරීම් හඬක් ඇතිවිය. විමසා බැලීමේ දී කාලතුවක්කු අණුබණ්ඩයේ පතරොම් ගබඩාව පුපුරවාහැර ඇති බව පැහැදිලි විය. මේ වන විට "සී" කණ්ඩායම සමඟ පමණක් ගුවන් විදුලි සම්බන්ධතා තිබුණි. "සී" කණ්ඩායමේ ආරක්ෂක බල ප්‍රදේශයේ ත්‍රස්තවාදී ප්‍රහාරය මැඩ පවත්වාගත් බවත්, ත්‍රස්තවාදී මළ සිරුරු සහ අවි ආයුධ එකතු කරගෙන ඇති බවත්, "සී" කණ්ඩායම් නිලධාරී අණදෙන විසින් දන්වා සිටින ලදී.

මේ අවස්ථාවේ කාලතුවක්කු අණුබණ්ඩයේ අවි සහ පතරොම් ත්‍රස්තවාදීන් විසින් රැගෙන යනු නිරීක්ෂණය කල හට පිරිස් ආර්සීඑල් අවියෙන් ඒ දෙසට ප්‍රහාර එල්ල කිරීමේ දී එම ප්‍රදේශයෙන් ත්‍රස්තවාදීන් පසු බැස ගිය අතර, 1 ශ්‍රීලපාහ සංඥා මැදිරි ප්‍රදේශයට නැවත

දරුණු ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල වන්නට විය. වේලාව 0600 පැය උදාවිය. දරුණු සටන් හැම්දෙසම ඇවිළීයන හඬ ඇසේ. මෙතෙක් වේලා අභීතව සටන් කළ 3 ගරෙ දෙවන අණදෙන නිලධාරී ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් බරපතල තුවාල ලැබූ බව 3 ගරෙ විධායක අධිකාරී විසින් දන්වා සිටින ලදී. මේ වන විට 1 ශ්‍රීලපාහ සංඥා මැදිරි ප්‍රදේශයට ප්‍රබල ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල වෙමින් තිබුණි. තව දුරටත් 1 ශ්‍රීලපාහ සංඥා මැදිරියේ ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම අපහසු හෙයින් 1 ශ්‍රීලපාහ සංඥා මැදිරියේ ගුවන්විදුලි යන්ත්‍ර විනාශ කොට 1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ඇතුළු හට පිරිස් 3 ගරෙ සංඥා මැදිරියට පසුබසින ලදී. එහි සිට 1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී විසින් කඳවුරේ ප්‍රහාර විධිවිධාන හා නියෝග නිකුත් කරමින් ප්‍රති ප්‍රහාර මෙහෙයවිය. මේ වනවිටත්, ත්‍රස්තවාදී ප්‍රහාරයන් අඩුවක් නොවූ අතර, හට පිරිස් බොහොමයක් මියගොස් හෝ තුවාල ලබා සිටියා මෙන්ම කුඩා ඛණ්ඩ වලට කැඩී ආරක්ෂක ස්ථාන වෙත විසිර ගොස් සිටියහ.

සෑම දෙසින්ම වෙඩිහඬ ඇසේ. කිසිවක් තේරුම් ගැනීමට හැකියාවක් නොමැත. තැනෙක සෙබලුන් තීරණාත්මක සටනක යෙදී සිටී. තවත් තැනෙක දිවි බේරා ගැනීමට සටන් කරයි. ජීවත්වීමේ බලාපොරොත්තු සියල්ලන්ගෙන්ම ගිලිහී ගොස් ඇත. ජීවිතයේ අවසානය ඇතින් පෙනෙන්නට විය. නමුත් එය ලංවන තුරු කුමක් හෝ කළයුතු ය. එය සටන් කරනු හැර වෙනත් විකල්පයක් ඇති බව නොවැටහේ. තවමත් ප්‍රබල ලෙසින් ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල වේ. 0700 හෝරාව පසුවී මොහොතක් ගත වන විට 3 ගරෙ විධායක අධිකාරී කපිතන් කාරියවසම් උදර ලෙස සටන් වදිමින් සිටියදී ත්‍රස්තවාදී වෙඩි ප්‍රහාරයනට ලක්ව අඩපන විය. මේ අවස්ථාවේ ගුවන් හමුද ප්‍රහාරක යානා අපේ සහායට එක්වී සතුරාට ගුවනින් නොනවත්වා ප්‍රහාර එල්ල කරන්නට විය. මරුවා දකිමින් සිටි සෙබළාට සැනසුම් රිදී රේඛාවක් බියකරු කළුවලාව තුළින් දක්නට ලැබුණි. ගුවන් ප්‍රහාර හමුවේ සමහර ස්ථානයන් වෙතින් ත්‍රස්තවාදීන් පසුබැසීම හේතුවෙන් නැවත ආරක්ෂක වලල්ලේ කොටස් හට පිරිස් විසින් ධෛර්යමත්ව අත්පත් කර ගන්නා ලදී. මේ වනවිට ත්‍රස්තවාදීන් විශාල ගණනක් ද ජීවිතක්ෂයට පත්ව සහ තුවාල ලබා ඔබ මොබ වැටී සිටිනවා දැකගන්නට හැකිවිය. සෙබළුන්ද ඉතාම දුෂ්කර තත්ත්වයට පත්ව සිටියහ. දුෂ්කර තාවයන්ගේ සීමාවක් නොමැත. 3 ගරෙ ආයුධ ගබඩාවේ තිබූ අවි ත්‍රස්තවාදීන් විසින් ට්‍රැක්ටරයකට පටවාගෙන යනු දුටු සෙබළුන් සුළු අවි සහ ආර්පීජී අවි ප්‍රහාර එල්ලකර ත්‍රස්තවාදීන්ගේ එම උත්සාහය ව්‍යවර්ථ කරන ලදී. 0830 පැය උදාවිය. ත්‍රස්තවාදීන් විසින් සන්නද්ධ රථ අත්පත් කරගෙන ක්‍රියාත්මක කර ඔවුන්ගේ ප්‍රදේශයට ගෙනයනවා ඇසුණි. මේ වන විට 3 ගරෙ හට පිරිස් උතුරු දෙසින් පැමිණෙමින් සිටින ලදී. ඔවුන් 1 ශ්‍රීලපාහ ආරක්ෂක ප්‍රදේශයට ඇතුලත්කර ගැනීම උදෙසා කපිතන් වනසිංහ ඉදිරියට යාමේ දී එල්ල වූ බලවත් ත්‍රස්තවාදී ප්‍රහාරය හේතුවෙන් සටන ආරම්භයේ සිට මෙතෙක් වේලා අභීතව සටන් මෙහෙයවූ, සටන් වැදුනු, වචනයෙන් විස්තර කළ නොහැකි හිස් තැනක් ඇති කරමින් ජාතියේ නාමයෙන් ජීවිතයෙන් සමුගන්නා ලදී. අභිත සෙන්පති පරපුරක එක් පුරුකක් අපෙන් ගිලිහී යයි. ත්‍රස්ත ප්‍රහාරය ආරම්භයේ සිට මෙතෙක් ඔහු කල මෙහෙය සැසඳීමේදී ඉදිරියේ කිසිම දිනක එම අඩුව පිරවීමට නොහැකි බව ස්ථිරය. සදකාලිකය. මේ වෙන විට තුවාල කරුවන් සංඛ්‍යාව ඉතා විශාල ප්‍රමාණයක් වී තිබුණි. අවි ආයුධ වල පතරොම් ප්‍රමාණය සීඝ්‍ර ලෙස පහළ බසිමින් තිබුණි. ගුවන් සබඳතා බිඳ වැටී ඇත. "ඩී" කණ්ඩායමේ නිලධාරී අණදෙන ඇතුළු හට පිරිස් "කොමා පොයින්ට්" ප්‍රදේශයේ සිටින බව ගුවන්විදුලි යන්ත්‍රයෙන් පැහැදිලිව ඇසුනු අතර, එම සබඳතාවය ද එතැනින් අවසන් විය. එම පණිවිඩය ඒ අවස්ථාවේ හැටියට පොතක ලියා විස්තර කිරීමට නොහැකි තරම් සැනසිලි සහ ප්‍රීති දායක වදනක් විය. 1 ශ්‍රීලපාහ "බී", "සී" සහ "ඩී" කණ්ඩායම් වලට අයත් හට පිරිස් වලින් 150ක් පමණ පිරිසක් "බී" කණ්ඩායමේ නිලධාරී අණදෙන සමග මූලස්ථානයට පැමිණෙන ලදී. ඒ අවස්ථාවේ හැටියට එය 1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ඇතුළු මූලස්ථාන හට පිරිස් වල ශක්තිය තිව්ර කරන්නක් විය. වේලාව 1500 පැය ළඟා විය. එකතු වූ හට පිරිස් ධෛර්යයෙන් යුක්තව කාලතුවක්කු අණුඛණ්ඩය ප්‍රදේශයේ සිටි ත්‍රස්තවාදීන්ට තීරණාත්මක ප්‍රහාරයක් එල්ල කරන ලදී. එමගින් 120 මිමී කාලතුවක්කු 03 ක් හා විශාල බෝම්බ ප්‍රමාණයක් නැවත අත්පත් කරගෙන එම ප්‍රදේශයේ ත්‍රස්තවාදී බලය අඩපන කරන්නට හැකිවීම තවත් එක් තීරණාත්මක ජයග්‍රහණයක් විය.

> "එකට කෑවෙමු, බීවෙමු, එකට වැඩ කලෙමු, එකට එක්ව සටන් වැදුනෙමු, නායකත්වයෙන්, කැපවීමෙන් සාමුහිකත්වයෙන්, සහෝදරත්වයේ අගය පූනරින් සටනින් ගතට දැනුණි, ඇසට දුටිමි."

11 වෙනි ද උදෑසන 0730 පමණ වන විට මුළු කඳවුරේම ගුවන් විදුලි සබඳතා අඩපනව තිබිණි. 11 දා දහවල් වන විට තිසි අයුරු ක්‍රියා කලේ ගුවන් විදුලියන්ත්‍ර අතලොස්සකි. සියලු දෙනාම තමාට ලැබෙන සියළුම උපදෙස් හැකි ඉක්මනින් අන් අයට කෑ ගසා පැවසිය යුතු බවට දැඩි උපදෙස් නිකුත් කරණු ලැබිණි. බැටරි චාජ් කිරීම සඳහා අවශ්‍ය ජෙනරේටර් යන්ත්‍රය වෙඩි වැදීමනිසා ක්‍රියා විරහිත වීම හේතුවෙන් වැඩ කළ හැකි තත්ත්වයේ තිබූ රේඩියෝ බැටරි ද චාජ් කිරීමට නොහැකි විය. ඉතිරිව තිබූ කුඩා ජෙනරේටරය මගින් වරින් වර වැඩකළ ගුවන් විදුලි යන්ත්‍රයේ බැටරි චාජ් කරගත් අතර මාරුවෙන් මාරුවට ජීප් රථයන් පනගන්වා එම බැටරියේ උදව්වෙන් ගුවන් විදුලි සම්බන්ධතාවයන් පවත්වා ගෙන යන ලදී. මෙසේ කිරීමේ දී විස්තර කළ නොහැකි ප්‍රායෝගික අපහසුකම් ඇතිවුණි. මේ තත්ත්වය යටතේ නොවැම්බර් 15 වෙනි දින දක්වාම මහත් අසීරුවෙන් පලාලි සහ අලිමංකඩ කඳවුරු සමග ගුවන් විදුලි සම්බන්ධතාව පවත්වා ගන්නා ලදී.

11 දින අලුයම වනවිට ඉතිරිව සිටි කාලතුවක්කු සෙනින් තිදෙනා සහ 1 ශ්‍රීලපාහ මෝටර් ඛණ්ඩයේ සෙබළුන් යොදවා නැවතත් කාලතුවක්කු අණුඛණ්ඩය සතුරාට එරෙහිව ක්‍රියාත්මක කරන ලදී. එම කාලය වනවිට 1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී කර්නල් ටීටීආර් ද සිල්වා විසින් මෙතෙක් කරන ලද සටන්වල පත්තරය ලබමින් සිය යුධ ශිල්පීය ඥාණය යොදවා හට පිරිස් තවදුරටත් මෙහෙයවමින් සිටින ලදී. එම මෙහෙයවීමේ අණ 1 ශ්‍රීලපාහ හට පිරිස් මෙන්ම අනෙකුත් සියළුම ඒකකයන් වලින් ඉතිරිව සිටි හට පිරිස් භක්ති ප්‍රණාම ගෞරවයෙන් පිළිගෙන තම දුබලතාවයන් පවා නොතකා අභීතව සටනේ ඉදිරියට යනු කැපී පෙනිණි. මෙය මුළු සටන් කාලය පුරාම පිළිර වී දෙමින් තිබුණි. 1 ශ්‍රීලපාහ "බී", "සී" සහ

"බී"කණ්ඩායම් වලට අයත් හට පිරිස් ද 3 ගජබා රෙජිමේන්තුවට අයත් හට පිරිස් ද දිවි බේරා ගෙන සිටි වෙනත් ඒකක හට පිරිස් සහ නාවික හමුදා හට පිරිස් ද 1 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි සමග සිටි හට පිරිස් වලට එකතු විය. මෙසේ හට පිරිස් මූලස්ථාන පෙදෙසට ඒකරාශීවීම කාන්තාරයක අතරමං වූ අයට දිය උල්පතක් එක්වූනා සේ ධෛර්ය උපදවන්නක් විය.

තුවාල වූවන්ට ප්‍රථමාධාර දුන් අතර, තුවාලකරුවන්ගේ සංඛ්‍යාව වැඩිවීමත් සමගම කළ හැකිව තිබුනේ එම සෙනිත්ගේ තුවාල, ලැබෙන කවර හෝ රෙදි කැබැල්ලකින් ඔතා තැබීම පමණි. මේ සඳහා සරම් ඇඳ ඇතිරිලි ආදිය පාවිච්චි කරන ලදි. 11 වෙනි දින සවස වන විට කිසිදු අත්දමේ බෙහෙතක් 'පුනරින්' කඳවුරේ නොතිබුණි. ඒ තිබූ බෙහෙත් අවසන් වීම නිසාය. තුවාල කරුවන් පාලනය කරගැනීමද, ඉතා අසීරු කරුණක් විය. මින් සමහරක් ඉතා දුර්වල තත්ත්වයට පත්ව තිබිණි.

මේ වනවිට පතරොම් ද අවසන් ව තිබූ අතර, තැන තැන වැටී තිබූ අවි වලින් සහ තුවාල ලැබූ අයගේ පතරොම් එකතු කිරීමට නියෝග ලැබුණි. වෙඩි පාලනය ඉතා තරයේ සිදු කරන ලදි. ගුවනින් හෙළන ලද පතරොම් වලින් නිරුපද්‍රිතව ලැබෙනුයේ 20% පමණ ප්‍රමාණයක් වීම ඉතා කණගාටු තත්ත්වයක් විය. පූනරින් කඳවුරෙන් දෙන ලද කාලතුවක්කු ඉලක්ක වලින් ද එතරම් සාර්ථක අභියෝගයක් සතුරා හට එල්ල කිරීමට නොහැකි විය. එවැනි තත්ත්වයක් තිබියදීත්, අලිමංකඩ සිට ගුවන්විදුලි යන්ත්‍රයේ රැඳී සිටිමින් අප දිරි ගන්වමින් අණ දෙමින් අලිමංකඩ බ්‍රිගේඩ් අණදෙන නිලධාරී බ්‍රිගේඩියර් වසන්ත පෙරේරා දැක් වූ විශේෂ සහය යුධ වැදුණු සියළු දෙනාට අමතක නැත. පලාලි කඳවුර සමග සබඳතා ඇණහිටි අවස්ථා වල දී ද දිගටම සම්බන්ධතාවය පැවතුනේ අලිමංකඩ කඳවුර සමගය.

මේ අවස්ථාව වන විට ගතට තිත්දක් කුසට අහරක්, හිතට සැනසිල්ලක් නොමැතිවා මෙන්ම අවි ආයුධ සඳහා පතුරොම් ප්‍රමාණය ද නොමැතිව විධාබරව සෑහෙන ප්‍රමාණයක ව්‍යාකූල තත්ත්වයක හට පිරිස් පසුවිය. ගුවන් හමුදාව සතුරාට පහර දීම සඳහා උපරිම උත්සාහයක් දරමින් ගොඩ බිම හමුදාවට ලබාදිය හැකි උපරිම සහය ලබා දෙමින් සිටි අතර, සතුරාගේ බලවත් ප්‍රහාර හේතුවෙන් හෙලිකොප්ටර් යානාවක් හෝ කඳවුරට ගොඩ බෑමට නොහැකි විය. එහෙත් අප තනිකර ඉවත නොයන බව විදහා දක්වමින් සතුරා වෙත නොනවත්වා ගුවන් ප්‍රහාර එල්ල කරමින් ගුවන් තලයේ රැඳී සිටීමට ගුවන් හමුදාව උපරිම උත්සාහයක් ගත්තා ලදී. එමෙන්ම අපේ ජීවන හුස්ම තවදුරටත් අපේ ගතේ රඳවා ගැනීමට එය අපට ආධාරයක් විය.

> " එද දින තුනක් තුළ සිදු වූ සිදුවීම්/අත්දැකීම් ඉතා කෙටි කාලයකින් අමතක වී ගියසේ දැනේ. එකී එකී අවස්ථාවට තිබූ උපකරණ සහ බිම වැටුණු පතුරොම් පවා එකතු කරමින් අධිෂ්ඨාන පූර්වකව කළ සටන එද පූනරීන් බිමේ සිටි සියළුම නිලධාරීන්ට මෙන්ම සෙබළුන්ට කිසිද අමතක නොවේ. "

මේ අවස්ථාව වන විට අලිමංකඩ කඳවුරේ සිට කාලතුවක්කු හමුදාව විසින් ඔවුන් සතුව ඇති දුර මෝටාර් මාර්ගයෙන් සතුරු ස්ථානයන් වලට නොකඩවා පහර එල්ල කරමින් සිටින ලදි. කෙසේ වෙතත් සතුරාට අප අත්හැර යාමේ බලාපොරොත්තුවක් නොමැති බව පෙනේ. ක්‍රමයෙන් සතුරාගේ බලය වර්ධනය වන බවත්, ඔවුන්ට සහයක කණ්ඩායම් එකතු වී ඇති බවත්, නැවතත් ඔවුන්ගේ ප්‍රබල වන ප්‍රහාරයන් හමුවේ පැහැදිලි වේ. මේ අවස්ථාව වන විට හට පිරිස් වලින් සෑහෙන ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත්ව හෝ එසේ නොමැති නම් සතුරා අතට පත්ව හෝ මාරාන්තික තුවාල හෝ ලබා සිටියහ. එතෙක් ජීවත්ව සිටින රණවිරුවන් වෙනුවෙන් තීරණයක් ගැනීමේ අවස්ථාව උදා වේ. 1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ඉතිරිවී තිබෙන ජීවිත ජීවත්කරවීම සඳහා තීරණයක් ගත්තා ලදී. "කොල්ලනේ මම උඹලාව දාලා යන්නේ නෑ. උඹලත් එක්ක එකට මෙතන මැරෙනවා. සිංහල කොල්ලන් වශයෙන් ඉතිහාසය පුරා පැවත ආ රණවිරුවන්ගේ නාමයෙන් අපිට සතුරාට යටත් වෙන්න බෑ, කරන්න තියෙන එකම දෙයයි. පුළුවන් තරම් සතුරන් මරාගෙන අපිත් මැරෙන එකයි" මේ තීරණාත්මක හඬට, ඉතිරිව සිටි හට පිරිස් මරණයේ සෙවනැල්ල පසෙකින් තබා සතුරාට ප්‍රහාර එල්ල කිරීමට එක හඬින් ඉදිරියට පැමිණිය හ. ලෝකයේම යුධ ඉතිහාසය පිළිබඳව ලියවී ඇති කථා අධ්‍යයනය කිරීමේ දී, සටනේදී ජයග්‍රහණයන් මෙන්ම පාරාජයන් පිළිබඳවද ලියවී ඇත. විශාල ජීවිත හානි සහ දේපලහානි සිදුවීම් අතීතයේ දී ද සිදු වී ඇති බව පෙනී යයි. ලංකා ඉතිහාසයේද එවැනි සටහන් බොහෝමයක් ඇත. සතුරා අභියස බියසුළු වීම අභීත රණවිරුවන්ට නිගා දෙවන්නක් වේ. පරාජය හමුවේ ද පසුනොබා යාම හෙල සටන් ඉතිහාසය පුරාම විහිදි සටහන් වී ඇත. ඒ අනුව මෙම අවස්ථාව ද, ඉතිහාසයේ අතීත අභීත විරුවන්ගේ දිවි පරදුවට තබා නැගී සිටීමේ උරුමයේ කොටසක් දැයි සිතේ. මෙම තීරණාත්මක නායකත්වය සහ අණදීම වර්ථමාන යුධ ඉතිහාසයේ සුවිශේෂ තත්ත්වයක් යටතේ රත් අකුරින් ලියවිය යුතුව ඇත. එය ඉතිහාසඥයන්ට භාර කරමි.

11 දින 1600 පැය පසුවෙමින් තිබුණි. හට පිරිස් විසින් හෙලියානා පතයට උතුරු දෙසින් මීටර් 500 ක පමණ ප්‍රදේශයක් දැඩි ප්‍රහාරයක් මෙහෙයවා සතුරන්ගෙන් නැවත අත්පත් කර ගත්තා ලදී. එසේ වුව ද හෙලියානා ගොඩබැස්සවීම සතුරු ප්‍රහාර හේතුවෙන් නොහැකිවිය. ඉහළ අහසේ සිට ගුවන් යානා මගින් පතරොම් සහ ආහාර කඳවුරට හෙළන ලදී. නමුත් ඉන් වැඩි ප්‍රමාණයක් සතුරු ග්‍රහණයන්ට නතුවිය. ආහාර එක් පෙට්ටියක් පමණක් හට පිරිස් වලට ලබා ගැනීමට හැකිවිය. එය ද සටන් බිමේ උරුමයක් දැයි සිතේ. ලද දෙයින් සතුටු විය යුතුයි. එය සෙබළ දහමයි. වේලාව 2030 පැය පැමිණේ. මෙතෙක් වේලා අභීතව සටන් කළ 2 වන ගජබා රෙජිමේන්තුවේ 2වන අණදෙන නිලධාරි, අභීත රණවිරු මේජර් හේමපාල ද වෙඩි වැදීමෙන් ඇති වූ තුවාල වලින් අධික රුධිර වහනය වීම හේතුවෙන් මියයන ලදී.

මේ වන විට අපගේ හෙට දින වෙනුවෙන් අද දින ජීවිත පූජාකල රණවිරුවන්ගේ සිරුරු අවස්ථාවේ හැටියට දැක්විය යුතු, දැක්විය හැකි ඉහළම ගරු සම්මාණයන් ගෙන් යුතුව කඳවුර තුළ මිහිදන් කරන ලදී. මේජර් හේමපාල, කපිතාන් වනසිංහ ඇතුළු රණවිරුවන් 49 දෙනෙකුගේ සිරුරු ඒ අතරට ඇතුලත් විය. වෙඩි හඬේත් ප්‍රහාරයන්ගේත් අවසානයක් නැත. සතුරන්ගේ ප්‍රබල ප්‍රහාරයන් මඳ වශයෙන් අඩපන වී ඇති බව පෙනුනු අතර. පසුදිනට පහන්විය. 11 දින අලුයම පටන් ගත් තද වැස්සද කඳවුර තුළ වතුර පුරවා පරිසරයේ අපවිත්‍රතාවයද දැඩි කලේ ය.

1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරිගේ සැලසුම් මත සැදෑකාලයේ කාලතුවක්කු පෙදෙස ලබා ගැනීමට එල්ලකල ප්‍රහාරයෙන් මියගිය ත්‍රස්තවාදීන් විශාල ප්‍රමාණයක් විය. මළසිරුරු

සහ අවි ආයුධ එම ප්‍රදේශයේ සීසීකඩ තිබූ බව දැක ගන්නට ලැබුණි. ත්‍රස්තවාදීන්ගේ ගුවන් විදුලි සංඥා පණිවිඩ මගින් විනාඩි තුනෙන් තුනට අප එකතු වී සිටින ප්‍රදේශයට මෝටාර් ප්‍රහාර එල්ල කරන ලෙසට ඔහුන්ගේ නායකත්වය අණදෙන බව අසන්නට ලැබුණි. එමෙන්ම ත්‍රස්තවාදීන් සෑහෙන පිරිසක් මරුමුවට පත්වී ඇති බවත්,බොහෝ දෙනෙක් පලා ගොස් ඇති බවත්, බොහෝ දෙනෙක් සීසීකඩ විසිරී ගොස් ඇති බවත්, හැකි ඉක්මනින් අමතර ත්‍රස්තවාදී හට පිරිස් එවන ලෙස ඉල්ලමින් ක්ෂේත්‍රයේ නායකයින් ඔවුන්ගේ ඉහල නායකත්වයෙන් නොනවත්වා කරන කන්නලව් හඬද අසන්නට ලැබුණි. කෙසේ වෙතත් විශේෂ තත්ත්වයක් ඇති නොවුණි. සෑහෙන ප්‍රමාණයකින් ත්‍රස්තවාදී ප්‍රහාර මේ වන විට අඩු වී තිබුණි.

11 වන ද අළුයම 0110 පමණ ඇරඹි සටන 14 වෙනි දින දහවල් දක්වා පැවතිණ. මෙවැනි සටනක් බෙදුම්වාදී යුද්ධයේ මෙතෙක් වාර්ථා වී නොමැත. මෙම සටනේ දී ගුවන් හමුද හෙලියානා සහ ප්‍රහාරක යානාවලින් වැදගත් මෙහෙයක් ඉටු කරන ලදී. සහායක හට පිරිස් රැගෙන මණ්ඩතිව් සිට පැමිණි බ්‍රිගේඩියර් කෝට්ටෙගොඩ, නෞකා වලින් 13 වෙනි දින පූනරීන් වෙතට පැමිණි අතර, 14 වෙනි දින දහවල් වනවිට 2 වන සේනාංකාධිපති මේජර් ජේනරාල් දළුවත්ත සමග තවත් අමතර හට පිරිස් පැමිණෙන ලදී.

14 වෙනි දිනට පහන් විය. අවස්ථාවට අනුව කටයුතු කරනු ලැබීය. තැන තැන වැටී තිබූ රණවිරුවන්ගේ මළ සිරුරු උපරිම ගෞරවයෙන් යුතුව මිහිදන් කරනු ලැබීය. මේ වන විට ත්‍රස්තවාදීන් ගේ මළ සිරුරු විශාල ප්‍රමාණයක් කඳවුර අවට නරක් වී දුගඳ හමමින් තිබුණි. ගුවන් යානා අංගනය ආරක්ෂා සහිත කිරීමෙන් අනතුරුව හෙලිකොප්ටර් යානා මගින් පතරොම්, ආහාර ආදී අවශ්‍යතාවයන් කඳවුරට ලබාදීමත්, තුවාල කරුවන් ඉවතට ගෙනයාමත් ආරම්භ කරන ලදී. මොහොතකට සිතේ සැනසිලි දායක තත්ත්වයක් ලියලමින් පවතී. යුද්ධයේ අරුත මෙනෙහි කලෙමි. යුධ බිමේ ජය මෙන්ම පරාජයන් ද සනිටුහන්වී ඇත. ඒ තුලින් විරුවන් බිහිව ඇත. යුද්ධයේ ශාපය අපේක්ෂා නොකළ යුතු ය. බෙදුම්වාදී කුරිරු ත්‍රස්තවාදීන්ගෙන් සාමකාමී ජනතාව ආරක්ෂා කළ යුතුයි. එය සෙබළාගේ ඒකායන පැතුමයි. යුද්ධයට අකමැති වුවත් රටේ ඒකීයභාවය වෙනුවෙන් සටන්වැදිය යුතු ය. මතු පරපුරේ අනාගත අභිවෘද්ධිය උදෙසා සටන් වැදියයුතු තත්ත්වයට කාලය එළඹ ඇත. දිවි පරදුවට තබා සටනට බැසිය යුතු යි. සටන ජයගත යුතු ය. රණවිරුවාගේ රණශූරත්වය පූනරීන් සටනින් කැපී පෙනුණි.

සමස්ත පූනරීන් ප්‍රහාරය දෙස ආපසු හැරී බැලීමේ දී සෑහෙන රණවිරුවන් ප්‍රමාණයක් රට දැයට අහිමි වූ අතර, විශාල අවි ආයුධ ප්‍රමාණයක් සතුරා අතට පත් විය. නමුත් සටනක දී මෙය අළුත් තත්ත්වයක් නොවේ අතීතයේත් වර්තමානයේත් මේ අනුව ක්‍රියා සිදු වී ඇත. සෙබළා ජය සහ පරාජයේ දී එක ලෙස නොසැලී සිටී. කෙසේ වෙතත් පූනරින් ප්‍රහාරය සතුරාට ද විශාල පරාජයක් අත් වූ බව පැහැදිලිව පෙනී යයි. එනම් අවුරුදු ගණනාවක සිට ඔහුන් බලාපොරොත්තු වූ පරිදි පූනරීන් කඳවුර විනාශ කර එම ප්‍රදේශයේ බලය ව්‍යාප්ත කර යාපනය සහ පූනරීන් අතර, සංගුපිඩ්ඩි මාර්ගය විවෘත කිරීම ඔවුන්හට කළ නොහැකි විය. එමෙන්ම ඔවුන් යාපනය ජනතාවට දී තිබූ පොරොන්දුව ඒ අයුරුම ඉටු කිරිමට නොහැකිව යාෂනය ජනතාව අතර, අපකීර්තියට මෙන්ම ඔවුන්ගේ බලයට අභියෝගයක් ද එල්ලකර ගත්තේ ය.

ත්‍රස්තවාදීන් සතු සියළුම උපාය මාර්ගයන් සහ බලයන් යොද විශාල ප්‍රහාරයක් එල්ල කළ ද වීරෝධාර ලංකා ආරක්ෂක හමුද හටයින්ගේ අප්‍රතිහත ධෛර්යය හා රණ වීරත්වය නිසා සම්පූර්ණම කඳවුර විනාශ කළ නොහැකි විය. ත්‍රස්තවාදීන්ගේ ඉහළ පෙලේ නායකයින් විශාල සංඛ්‍යාවක් ඇතුළු 400- 600 ටත් අතර, ත්‍රස්තවාදීන් සංඛ්‍යාවක් විනාශ විය. මෙය ත්‍රස්ථවාදීන්ට සෑහෙන අලාභහානියක් සිදු වූ බව එදින ත්‍රස්තවාදී ගුවන්විදුලි සංඥා වලට සවන් දීමේදී දැන ගැනීමට හැකිවිය. ඔවුන්ට ආධාරක ත්‍රස්තවාදී හටපිරිස් එවන ලෙස තරයේ කළ ඉල්ලීම් වලට මෙන්ම ආධාර ඉල්ලා අඩා වැලපීම්ද ගුවන්විදුලි පණිවිඩ මගින් අසන්නට ලැබුණි. කෙසේ වෙතත් අවසන් දින දෙකේ දී ප්‍රහාරයන් සඳහා ආධාරයට එවීමට ත්‍රස්තවාදීන් නොමැති වූවා මෙන්ම ඔවුන්ගේ සටන් තත්ත්වයන් මෙන්ම ධෛර්යය ද හීන වී තිබුණු බව මනාසේ පැහැදිලි විය. මේ අනුව තව දුරටත් සටන් කිරීමේ හැකියාවක් නොමැති තත්ත්වයට ඔවුන් පත්ව පසු බසිමින් සිටින ලදී. මේ සඳහා ඉදිරිපත් කළ හැකි සරල සාක්ෂිය නම් එතැන් සිට අද දක්වාම ත්‍රස්තවාදීන්ට විශාල ප්‍රමාණයක ප්‍රහාරයක් එල්ල කිරිමට නොහැකිවීම විදහා දැක්විය හැක. පූනරීන් සටනේ දී සිදු වූ පාඩුව අදවන තුරුත් ත්‍රස්තවාදීන්ට පිරිමසා ගත නොහැකිව ලතවෙන බව රහස් තොරතුරු ආරංචි මාර්ග වලින් සනාථ වී ඇත. කෙසේ වෙතත් පූනරින් ප්‍රහාරය හේතු කොට සතුරාගේ අවි ආයුධ ඇතුළු යුධෝපකරණ විශාල ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට හැකිවීමෙන් සහ සතුරු ජීවිත හානි කිරීමෙන් යුධ හමුද හට පිරිසේ දැඩි එඩිය පෙන්වාදීය.

එකට කෑවෙමු, බීවෙමු. එකට වැඩ කලෙමු, එකට එක්ව සටන් වැදුනෙමු. නායකත්වයෙන්, කැපවීමෙන් සාමූහිකත්වයේත්, සහෝදරත්වයේත් අගය පූනරීන් සටනින් ගතට දැනුණි. ඇසට දුටිමි. අප හා එක්ව සටන් කර දිවිපිදූ වීරයන්ට ද, සටනට උරදී සටන් කළ 1 ශ්‍රීලපාහ හා 3 ගජබා විරුවන්ට ද, මේ රටේ සැම කෙනෙකුගේම උපහාරය පිදිය යුතු බැව් අවධාරනය කළ යුතුව ඇත. එද, දින තුනක් තුළ සිදු වූ සිදුවීම්/අත්දැකීම් ඉතා කෙටි කාලයකින් අමතක වී ගියසේ දැනේ. එකී එකී අවස්ථාවට තිබූ උපකරණ සහ බිම වැටුණු පතරොම් පවා එකතු කරමින් අධිෂ්ඨාන පූර්වකව කළ සටන එද පූනරින් බිමේ සිටි සියළුම නිලධාරීන්ට මෙන්ම සෙබළුන්ට කිසිද අමතක නොවේ. නිදි වර්ජිතව, තිබූ සම්පත් පිරිමසා ගනිමින් කිසිදු අහරක් නැතිව, මදකුදු කථා රහිතව සිදු වූ මෙම දින තුනහමාරක සටනේ දී මිතුරු පක්ෂයට ද සෑහෙන අලාභහානි සිදු විය. බෙදුම්වාදී සතුරන් 825 දෙනෙකු, එමදින තුන තුල දී පමණක් මිය ගොස් තිබුණි. දහසකට අධික සංඛ්‍යාවක් සතුරන් තුවාල වූ බව දැන ගන්නට ලැබී තිබුණි.

නායකත්වය විදහා පෑම, නොපසුබට උත්සාහය සහ සාමූහික ක්‍රියා කිරීම උසස් මට්ටමකින් තිබූ මෙම යුධභූමිය පිළිබඳව ලංකා ඉතිහාසයේ "රන් අකුරෙන්" සඳහන් කළ යුතුව ඇත.

**කපිතන් ටීආර් හේවගේ ශ්‍රීලපාහ**

## "උතුරේ සෙබලෙකුගෙන්"

ගිනි අවි දරා තල් අරනේ රැක සිටි මි
දැස රිදෙයි සතුරන් කොයි දැයි සොය මි
වැලි කතරේ ගිනි අව්වේ මම දැවෙ මි
නිජ බිම රැකීමට තනිවම වෙර දර මි

රණබිම රකින යුධ සෙබලෙක් වෙලා මම
රණබිම වෙත ආමි දැ පෙම් වඩා මම
කිරුල නොමැති රජවරු රට රකින මෙම
මා ගැන සොයනු නැත අද තනි වෙලා මම

කුසට අහර නැත ඉන්නේ බඩ ගින් නේ
බීමට ජලය නැත ඉන්නේ පවසින් නේ
මේ හැම දස දුකක් අප සැම ඉවසන් නේ
මව් බිම රකින්නට බව ඇයි නොම දන් නේ

නිදි නැති කොටින් අප නින්දෙදි මරා විදෝ
පා දෙක අපේ ජොනි බට්ටන් ගනී විදෝ
දෙනෙත් පියන විට අම්මා දකී විදෝ
යුද්දෙන් අසිරි අපේ මව් බිම දිනා විදෝ

**නි/60370 කපිතන් ඩීඑල්ආර්වී පෙරේරා ශ්‍රීලපාහ**

# 8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වසරක් සපුරයි

1948 පෙබරවාරි 04 දින ශ්‍රී ලංකාව ස්වෛරී රාජ්‍යයක් බවට පත්වීමෙන් අනතුරුව, රටේ ආරක්ෂාව භූදෙක් තමන් වෙතට පත්වීමෙන් පසුව 1949 ඔක්තෝම්බර් 10 දින ශ්‍රී ලංකා යුධ හමුදාව ආරම්භ කරන ලදී. 1949 දී ශ්‍රී ලංකා යුධ හමුදා පනත යටතේ ශ්‍රී ලංකා යුධ හමුදා ඉතිහාසයේ ප්‍රථම වරට යුධ හමුදා ඒකකයක් පිහිටුවන ලදී. ඒ අනුව 1950 මැයි 12 වන දින බළඇණි දිනය කර ගනිමින් 1 වන ශ්‍රී ලංකා පාබල හමුදාව පිහිටුවා ගන්නට යෙදින.

පසුව ක්‍රමයෙන් වැඩුණු 1 වන ශ්‍රී ලංකා පාබල හමුදාව 1954 අප්‍රේල් 21 දින II වන එලිසබෙත් රැජින වෙතින් රාජිණී වර්ණ උත්සවාකාරයෙන් ලබාගති. පසුව 1972 ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීමෙන් අනතුරුව 1978 ඔක්තෝම්බර් 10 වන දින ජනාධිපති වර්ණ ප්‍රදානය කිරීමට යෙදින.

මෙලෙස අවුරුද්දෙන් අවුරුද්ද ගෙවී යන කාලයත් සමග වැඩුණු ඊළාම් සටනේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ ව්‍යාප්තිය ඉක්මනින් සිදු වන්නට විය. මෙලෙස 3 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ද, 4 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ද, 6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ද, 7 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ද ක්‍රමයෙන් බිහිවන්නට විය. පසුව 1993 ජනවාරි 16 වන දින උත්සවාකාරයෙන් 8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව බිහිවිය.

අදට එනම් 1994.03.14 වන දින වනවිට අවුරුද්දකට වඩා කාලයක් මෝරා ඇති අප වෙසෙන මෙම පාබල බළඇණිය අවුරුද්දකට වඩා වැඩි කාලයක අතීත ආවර්ජනය කිරීම කැමැත්තෙමු.

1993.01.16 දින සුභ මොහොතින් පිහිටුවන ද මෙම බළඇණිය පාබල බළඇණියක් වශයෙන් වැදූ අවස්ථාවේම මුහුකුරා යාමට පෙර යුධ හමුදාව විසින් වැඩි සතුරු බලයක් එකවිට යොදවා සැලසුම්කර ප්‍රහාර එල්ල කල හැකි, ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදීන් පෝෂණය වී වැඩෙන වැලිඔය ක්‍රියාත්මක ප්‍රදේශයේ 1993.01.25 දින ස්ථාන ගත කරවන ලදී. මෙහි දී අප බළඇණිය වැඩි ආධුනිකයින්ගෙන් සමන්විතවූ අතර, ආධාරක අවි ආයුධ අතින් ද තරමක අඩුවකින් වුව ද සාර්ථකව රාජකාරි කිරීමට එඩිතර වූණි.

මෙලෙස රාජකාරි කරගෙන යන අතරතුර පුහුණු පාඨමාලාවල් කීපයක් සැලසුම්කර ක්‍රියාවට නැංවිය. මෙහි දී 1993.03.22 දින සිට 1993.04.18 දින දක්වා පවත්වන ලද පශ්චාත් ආධුනික පුහුණු පාඨමාලාව මුල් තැන ගන්නා ලදී. තව ද මෙම බළඇණිය විසින් වැලිඔය ක්‍රියාත්මක ප්‍රදේශයේ පිහිටුවන ලද වෙඩි පිටිය, යුධ හමුදා උසස් නිලධාරීන්ගේ පැසසුමට ලක් වූ බව මතකය. මෙලෙස අප බළඇණිය ක්‍රමක් ක්‍රමයෙන් සාර්ථක මග පෙන්වීමක් යටතේ වැඩෙන්නට විය.

යුද්ධය ජය පරාජය දෙකම පොදු දෙයක් බව සනාථ කරමින් 1993 ජූනි මස 25 දින අළුයම සතුරු අඳුරු වලාකුළු අප බළඇණි බලප්‍රදේශය පුරා විසිර යන ලදී. මෙහි දී අප බළඇණිය සතුව පැවති ජනකපුර කඳවුරු දෙකක් විශාල සතුරු ප්‍රහාර මධ්‍යයේ සතුරන් අතට පත්වන්නට යෙදිණි.

එම ප්‍රහාරයේ දී සතුරා අත්පත් කරගත් කඳවුරු දෙක මුලු යුධහමුදාවටම ඉස්මතුවී පෙණුනු අතර, සතුරන් ට අත්පත්කර ගන්නට නොහැකි වූ කොක්කුතුඩුවායි සහ කොවිල්පොයින්ට් කඳවුරු දෙක ඉස්මතු වී නොපෙනුනි. පසුව ත්‍රස්තවාදී සටනේ අත්දැකීම් සහ පළපුරුද්ද මඳ වූ යම් පිරිසකගෙන් අප බළඇණියට විශාල දෝෂාරෝපණ වලට ලක්වන්නට සිදුවිය. කෙසේ හෝ ප්‍රහාරයෙන් පසු දිනම නැවත සතුරාට අත්පත් වූ කඳවුරු අප බළඇණිය විසින්ම ප්‍රතිසංවිධාන වී එම ස්ථානයේම ස්ථානගත කිරීමට තරම් නිර්භීත වීම හා කාර්යය ශූර වීම ගැන අප සතුටු වෙමු.

පසුව අප බළඇණිය එම ප්‍රදේශයේම ස්ථානගත වී සිටීම චිත්ත ධෛර්යයට තරමක් හෝ බලපෑමක් සිදු කරන බවට වටහා ගත් යුධහමුදාව අප බළඇණිය මඩකලපුව ක්‍රියාත්මක ප්‍රදේශය කරා ස්ථාන මාරුකර ස්ථාන ගත කරවන ලදී. පාබල සෙබළුන්ට ඕනෑම ප්‍රදේශයක් තම ග්‍රහණයට හසු කර ගත හැකි බව ඔප්පු කරමින් නැගෙනහිර පළාතේ පවත්වන ලද ප්‍රාදේශීය සභා මැතිවරණවලට තම බල ප්‍රදේශ ග්‍රහණය කර ගැනීමට ගත වූයේ මාස 03 කට වඩා අඩු කාලයකි.

මෙලෙස අප බළඇණිය ග්‍රහණයට හසු කරගෙන තිබූ ප්‍රදේශයේ පවත්වනු ලැබූ ඡන්ද ප්‍රතිඵල අනුව සියයට 70 කට වඩා වැඩි ප්‍රමාණයක් ඡන්දදායකයින් ඡන්දය ප්‍රකාශ කර සිටීමෙන් බළ ඇණියේ කැපවීම හා දක්ෂතාවය ඔප්පු කර තිබේ.

දැන් අප බළඇණිය අවුරුද්දකට වඩා වැඩිමහල් බළඇණියක් වන අතර ඉදිරියේ පැවැත්වීමට නියමිතව ඇති ඕනෑම ක්‍රියාත්මකයත් සඳහා සූදානම්ව, යුධ හමුදාව අඩගසන තුරු 8 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වශයෙන් සිතා මුසු මුහුණින් යුතුව බලා සිටින්නෙමු.

**කපිතාන් ටී ජේ. කොඩිතුවක්කු.**
**ශ්‍රීලපාහ**

## රකිමු මවුබිම දිවිහිමියෙන්

ඉපැරණි අප මීමුත්තන් කළ දක්කම්
පෙන්වා සිහල කේෂර හඩ පෑ විස්කම්
සමගි බලෙන් පෙන් වූ එම සූරු විරුකම්
ඉපැරණි ශිලාකුරුවල ඇත ඒ රන්දම්

උතුරු නැගෙනහිර ගැටෙනුයෙ ගිනි අවිය
එම ගිනි නිවන්නට දරනා හෙළ විරිය
මියෙන තුරුම පෙන්වූ කළ ඔබෙ සවිය
සොයුරනි ඔබ තමයි හෙලයේ කොඳු ඇටය

මව්බිම නාමයෙන් තෙත්කළ පුලින තලා
රුධිර සුවඳ ගෙන එයි ඔබ සිහි කරලා
හෙට දින නිදහසේ අරුණළු කිරණ ගලා
ඔබ ගැන කියයි දහසක් දෙන කඳුලු සලා

සිහලෙකු විලස ජනිතව මේ ලක් දෙරණේ
ඇත ඔබ හට ද අයිතිය මේ සතර කොනේ
ඔබගෙන් මතුද එම අයිතිය රකින දිනේ
මියැදී ගියත් කම් නැත මේ මව් දෙරණේ

සීමා පවුරු කුමට ද මේ ලක් දෙරණේ
සූත්කර දමමු එම අදහස් හෙළ පුතුනේ
පාබල බලය පෙන්වා අප රණ දෙරණේ
නිවහල් දැයක සැතපෙන්නෙමි හෙට දෙදිනේ

මව්බිම අපේ අනුප්‍රාණය යැයි සිතමු
නිදහස අපේ මව් රට තුළ ගොඩ නගමු
සිහළ කොඩිය උතුරේ අපි ලෙළ දෙවමු
පාබල බලය හෙට දිනයෙන් රැක ගනිමු

**සෙ/300088 ලාකෝ බංඩාර ජේඑම්ජේ 10 ශ්‍රීලපාහ "ආධාරක"කණ්ඩායම යුධහමුදා කඳවුර මාදගල් පලාලි**

## ඇතුලත් කිරීම්/පත් කිරීම්/පත්කිරීම් අත් හැරීම් - නිලධාරී

| | |
|---|---|
| කර්නල් ටීටීආර් ද සිල්වා, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්පී - | 1994/03/10 වන දින සිට 1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී තනතුර අත්හැර එදින සිට රෙම ශ්‍රීලපාහ හි සේනාවිධායක තනතුරට පත් කිරීම. |
| ලුතිනන් කර්නල් ඩීපීඑස් බල්තසාර්, ශ්‍රීලපාහ - | 1994/03/01 දින සිට රෙම ශ්‍රීලපාහහි සේනාවිධායක තනතුර අත්හැර, එදින සිට 1 සේනාංකයේ ප්‍රමාති 1 වශයෙන් පත් කිරීම. |
| මේජර් එච් ඩබ්ලිව් හේවාආරච්චි, ආර්ඩබ්පී ශ්‍රීලපාහ - | 1994/03/08 දින සිට රෙම ශ්‍රීලපාහ හි විධායක අධිකාරී/මාති II තනතුර අත්හැර එදින සිට I ශ්‍රීලපාහහි අණදෙන නිලධාරී වශයෙන් පත් කිරීම. |
| මේජර් ඩී යූ ද ලැනරෝල්, ආර්ඩබ්පී, ශ්‍රීලපාහ - | 1994/04/16 වන දින සිට I ශ්‍රීලපාහහි 2 වන අති තනතුර අත්හැර, රෙම ශ්‍රීලපාහ හි විධායක අධිකාරී/මාති II වශයෙන් පත් කිරීම. |
| මේජර් එස්අයිබී තෙන්නකෝන්, ශ්‍රීලපාහ - | 1994/03/15 වන දින සිට 5(සෙවි) ශ්‍රීලපාහහි කාංනිඃ අණදෙන නිලධාරී වශයෙන් පත් කිරීම. |
| මේජර් ජීසෝ වික්‍රමසිංහ, ශ්‍රීලපාහ - | 1994/04/12 වන දින සිට 9 (සෙවි) ශ්‍රීලපාහහි කාංනිඃ අණදෙන නිලධාරී වශයෙන් පත් කිරීම. |
| මේජර් එච්එච්එල් ද සිල්වා, ශ්‍රීලපාහ - | 1994/04/15 වන දින සිට 11(සෙවි) ගරෙ හි කාංනිඃ අණදෙන නිලධාරී වශයෙන් පත් කිරීම. |

### ඔබගේ අභීතභාවයට මෙලෙස උපහාර පිදේ....

**වීර ක්‍රියාවන් සඳහා පදක්කම් ලබන්නන්....**
**වීර වික්‍රම විභූෂණය**

| | | | |
|---|---|---|---|
| නි/60739 | මේජර් | පීඑල්ටී | සේරසිංහ,ශ්‍රීලපාහ - මියගිය |
| නි/2352 | මේජර් | එම්එම්ආර් | ප්‍රනාන්දු - 2 (සෙවි) ශ්‍රීලපාහ - මියගිය |

**රණවික්‍රම පදක්කම**

| | | | |
|---|---|---|---|
| නි/50919 | ලුති/කර්නල් එම්ජ් | | පීරිස්,ආර්එස්පී. ශ්‍රීලපාහ - මියගිය |
| නි/60356 | කපිතන් | එච්ආර්එම්සීටීඑස් | මැදගොඩ, ශ්‍රීලපාහ - මියගිය |
| නි/60268 | මේජර් | කේකේඑස්එච්කේ | ඇඹව,ආර්ඩබ්පී, ශ්‍රීලපාහ |
| නි/60742 | කපිතන් | ඒජීඩීඑන් | ජයසුන්දර, ශ්‍රීලපාහ |
| සෙ/12442 | කෝප්‍රල් | ලාල්කුමාර | ජීඩී - මියගිය |
| සෙ/14337 | කෝප්‍රල් | අත්තනායක | ඒඑම්ජ්සී |
| සෙ/14055 | ලාකෝ | සේමසිංහ | එච්එන්ආර් - මියගිය |
| සෙ/14009 | ලාකෝ | ශ්‍රීලාල් | එම්එල්ජ් - මියගිය |

**රණශූර පදක්කම**

| | | | |
|---|---|---|---|
| නි/50708 | කර්නල් | ටීටීආර් ද සිල්වා , ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී | |
| නි/50732 | කර්නල් | සීකේපි | පුංචිහේවා, ආර්එස්පී - මියගිය |
| නි/50629 | කර්නල් | පීබීඩබ් | ජයසුන්දර, ආර්එස්පී |
| නි/50676 | ලුති/කර්නල් ඩී | | රත්නසභාපති, ආර්එස්පී, ශ්‍රීලපාහ |
| නි/60764 | මේජර් | ඩීජ් | සමරජීව, ශ්‍රීලපාහ - මියගිය |
| නි/60818 | කපිතන් | වීආර් | මීඩින්, ශ්‍රීලපාහ |
| නි/60427 | කපිතන් | ආර්ජ් | තුගේරා, ශ්‍රීලපාහ |
| නි/60606 | කපිතන් | වීඩීඑන්කේ | මිලන්ත, ශ්‍රීලපාහ - මියගිය |
| නි/61076 | කපිතන් | එස්කේඩී | පල්ලියගුරුගේ, ශ්‍රීලපාහ |
| නි/60583 | කපිතන් | එන්කේ | වඩුගොඩපිටිය, ශ්‍රීලපාහ |
| නි/60370 | කපිතන් | ඩීඑල්ආර්ඩබ් | පෙරේරා. ශ්‍රීලපාහ |
| නි/60742 | කපිතන් | ඒජීඩීඑන් | ජයසුන්දර, ශ්‍රීලපාහ |
| නි/60545 | කපිතන් | ජීආර් | අම්පේමොහොට්ටි, ශ්‍රීලපාහ |
| නි/60298 | කපිතන් | එච්ජ්සී | පෙරේරා, ශ්‍රීලපාහ |
| නි/60360 | කපිතන් | ඩීඩබ්එන්ජ් | දොඩන්වල, ශ්‍රීලපාහ |
| නි/60965 | කපිතන් | ඩබ්ඩබ්ආර්ඩී | විජේරත්න, ශ්‍රීලපාහ |
| නි/61257 | කපිතන් | පීඩීස | ආයුපාල, ශ්‍රීලපාහ |
| නි/60938 | කපිතන් | කේඩබ්ආර් ද ආබෲව්, ශ්‍රීලපාහ | |
| නි/61268 | කපිතන් | ටීකේඑස් | ගුණතිලක, ශ්‍රීලපාහ - මියගිය |
| නි/60977 | ලුතිනන් | ඩීපීපී | පෙරේරා, ශ්‍රීලපාහ - මියගිය |
| නි/60760 | ලුතිනන් | ඩබ්ඩබ්එස්එල් | ප්‍රනාන්දු, ශ්‍රීලපාහ |
| නි/61133 | ලුතිනන් | කේජ්එස්එච් | කරුණාතිලක, ශ්‍රීලපාහ |
| සෙ/11177 | බනි 1 | ආර්ජ්යූ | පෙරේරා |
| සෙ/11658 | ව/සැර | අබේවර්ධන | එච්ජීඑල් - මියගිය |

| | | | | |
|---|---|---|---|---|
| සෙ/13315 | ව/සැරයන් | අජිත් | ඩබ්ජ් | මියගිය |
| සෙ/13557 | සැරයන් | කරුණාරත්න | ඩීඑම් | |
| සෙ/11697 | සැරයන් | සමරධීර | ඒඩී | |
| සෙ/12298 | සැරයන් | පෙරේරා | එම්ටීජ්අයි | |
| සෙ/12186 | සැරයන් | තෙන්නකෝන | එම්බී | |
| සෙ/11412 | සැරයන් | අබේසේකර | ඩබ්යූඑම් | |
| සෙ/12085 | සැරයන් | බණ්ඩාර | පීඑම්ඩී | |
| සෙ/12484 | සැරයන් | පරණවිතාන | ජේ | මියගිය |
| සෙ/12803 | කෝප්‍රල් | සරත්චන්ද්‍ර | පීජ් | |
| සෙ/13185 | කෝප්‍රල් | පෙරේරා | කේජ්ස්පී | |
| සෙ/11630 | කෝප්‍රල් | සෙනවිරත්න | එච්එම් | මියගිය |
| සෙ/13857 | කෝප්‍රල් | චන්ද්‍රදස | පීජී | |
| සෙ/13201 | කෝප්‍රල් | අමරරත්න | එම් | |
| සෙ/12164 | කෝප්‍රල් | රණතුංග | එච්එම්කේ | |
| සෙ/12069 | කෝප්‍රල් | ජයවීර | එස්ඩී | |
| සෙ/14650 | කෝප්‍රල් | ප්‍රේමරත්න | පීඑම් | |
| සෙ/13653 | කෝප්‍රල් | විජේබංඩාර | කේජ්ඩබ්එම්පී | මියගිය |
| සෙ/14138 | ලාකෝ | විජේරත්නබංඩා | අයිඑම් | අතුරුදහන් |
| සෙ/14993 | ලාකෝ | ප්‍රේමතිලක | බේඑම් | |
| සෙ/14736 | ලාකෝ | කීර්තිරත්න | ඒ | |
| සෙ/15517 | ලාකෝ | රණසිංහ | ඒයූපී | මියගිය |
| සෙ/14534 | ලාකෝ | විජේතුංග | එන්එච් | |
| සෙ/13030 | ලාකෝ | විජේපාල | එච්පීඩී | |
| සෙ/14567 | ලාකෝ | විජේසිංහ | පීඑස් | |
| සෙ/15494 | ලාකෝ | සිල්වා | ටීජ්කේ | |
| සෙ/14968 | සාසෙ | කොඩිසිංහ | කෙ | |
| සෙ/15658 | සාසෙ | පෙරේරා | එන්ජ්එස්ටීආර් | |
| සෙ/14667 | සාසෙ | සිරිවර්ධන | එස්ආර් | මියගිය |

### සේවයට තිලයෙන් පිදුම් ලැබූ වගයි....

**ලුතිනන් (උපා) අධිකාරියට පත් කිරීම්- බලලත් නිලධාරීන්**

ලුතනන් (උපා) කේජී ආරියරත්න, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) කේඩී නවරත්න, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) එස්ඩීඩබ් ප්‍රනාන්දු, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) ජේබී හේරත්, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) එම්ඩබ් විමලචන්ද්‍ර, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) ටීකේ ලන්ත්‍රා, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) ඩබ්එම් ගුණතිලක, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) ඩබ්ජේ සිරිවර්ධන, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) එච්ඩබ් සිල්වා, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) කේඑම්එන් සෝමසිරි, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) ටීඑම්ජීබී ඒකනායක, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) එම්පීඑන්ආර් පෙරේරා, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) එච්ජ් ලාල්චන්ද්‍ර, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) ඩබ්එම් සූරසේන, ශ්‍රීලපාහ
ලුතිනන් (උපා) එච්එම් දිසානායක, ශ්‍රීලපාහ

### රණකපිතයට පත්

| | |
|---|---|
| සෙ/89482 ආසෙ සංජීව දේශප්‍රිය පී 3 ශ්‍රීලපාහ | 94/03/06 වැලිඔය |
| සෙ/14511 සාසෙ මහින්දපාල එච්ජ් 3 ශ්‍රීලපාහ | 94/05/06 වෙත්තිලකේනි |
| සෙ/72838 ආසෙ රණසිංහ ආර් ඒ 3 ශ්‍රීලපාහ | 94/05/06 වෙත්තිලකේනි |
| සෙ/300061 කෝප්‍රල් කේලි පී 8 ශ්‍රීලපාහ | 94/04/25 වව්නියාව |
| සෙ/304705 සාසෙ කුමාරසිරි ආර්එම් 8 ශ්‍රීලපාහ | 94/04/25 වව්නියාව |
| සෙ/304175 සාසෙ රෝහන කේ 8 ශ්‍රීලපාහ | 94/04/25 වව්නියාව |
| සෙ/303867 සාසෙ කරුණාරත්න එච් 8 ශ්‍රීලපාහ | 94/04/25 වව්නියාව |
| සෙ/304670 සාසෙ බණ්ඩාර ජ්එන්බීසී 8 ශ්‍රීලපාහ | 94/05/16 කිලම්බකුලම් |
| සෙ/305164 සාසෙ මහින්ද ආර්ටී 7 ශ්‍රීලපාහ | 94/05/12 අලිමන්කඩ |

*ඔබ සියලු දෙනාට, දෙව් වරමින් ඉක්මන් සුවය පතමු!*

### මව්බිම වෙනුවෙන් අමරණීයත්වයට පත් සෙබළුනේ....

| | |
|---|---|
| සෙ/15931 කෝප්‍රල් පද්මසිරි ශාන්ත එස්එම් 4 ශ්‍රීලපාහ | 94/05/12 මුලතිව්හිදී |
| සෙ/72276 ලාකෝ රාසපුත්‍ර ඒපීකේ 6 ශ්‍රීලපාහ | 94/05/10 මාදගල්හිදී |

*ඔබ සැමට නිවන් සුව!*

වීරෝධාර පාබල සෙබළුනේ

මෙහි පලවන්නේ

ඔබගේ රණ අත්දැකීම් / නිර්මාන /

තොරතුරු බව ඔබ නොදන්නේද ?

ඔබගේ හපන්කම් / නිර්මාන / තොරතුරු / අවවාද /

උපදෙස් ඔබේම සහෝදර සෙබළුන්ගේ

අත්දැකීමට / දැන ගැනීමට

ඉදිරිපත් කරන්න !

ඔබගේ කාන්සිය මකන්න

අන් අයගේ චිත්ත ධෛර්යය වඩවන්න

ලියන්න ! අමතන්න !!

කතෘ
ශ්‍රීලපාහ සඟරාව.

